# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,917 — 1970 ජුලි 31 වැනි සිකුරාද - 1970.7.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1043 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1094 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1055 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1056 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1087 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1090 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යනා මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යනා මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට සේවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙසුන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.8.14 වැනි දිනට වයස අවුරුදු 40 කට නොඅඩු බව.

(සී) වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස අවුරුදු 15 කට නොඅඩු කාලයක් ලේඛනගත වී සිටින හා යටත් පිරිසෙයින් I ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියකුට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

සටහන් :

(i) වෛද්‍ය ආයතන පාලනය පිළිබඳ උසස් සුදුසුකම්, පුළුල් පළපුරුද්දක් හා කැපී පෙනෙන දක්ෂතාවයක් ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ;

(ii) රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය අතිරේක සුදුසුකමක් වේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන වයස් සහතික හෝ බවුතීස්ම සහතික බාරගනු නො ලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ කුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එවිවේ කටද දැයි ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර සේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට ඇතගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝරමය සමග තමන්ට එවන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝරමය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ඒ. විජේවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්.

1970. 7. 24 වැනි දින,
කොළඹ 1, නාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

7-1132—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය—කටුබැද්ද, මොරටුව

### II වැනි පන්තියේ යාන්ත්‍රික (මිකැනික්) තනතුර

මොරටුව, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ II වැනි පන්තියේ යාන්ත්‍රික (මිකැනික්) තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1970.8.25 වැනි දින හෝ ඊට පෙර මොරටුව, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. පත් කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්වය 1964.2.7 වැනි දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධානයන්ට යටත්වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි නැඹීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්වය ප්‍රදානය කළ විට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාලසීමාව අවුරුදු 3 ක් වන්නේය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරාගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ හෝ ආධුනික තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

3. වැටුප් හා දීමනා.—පළමු හය මස තුල දිනකට රු. 8 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 2,640—15×60—රු. 3,540 බැගින්.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුවෙයි :—

(අ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නාවූන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ආ) 1. 1/64" පරිමාණයක් කියවීමට හා භාගවලින් දැක්වෙන දිග පළල අඩිය සටහන් කිරීමට පිළිවන් විය යුතුයි. (සූක්ෂම මානය කියවීමට පිළිවන් වීම විශේෂ වාසියක් වෙයි.)

2. වාෂ්ප, මෝටර්, කළුතෙල්, මිල්රයිඩ් බඳු විශේෂ ආකාරයේ සවිකිරීම් පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුයි.

3. ඇඳීම් කියවා තේරුම් ගැනීමට පිළිවන් විය යුතුයි.

(ඇ) 1. පිළිගත් ආයතනයක II පංතියේ අදාල තනතුරක අවුරුදු 5 ට නොඅඩු පළපුරුද්දක් තිබීම (සහතිකයක් මගින් සනාථ කළ යුතුයි).

2. මනා චරිතයකින් යුක්ත විය යුතුයි. (වගකිව යුතු පුද්ගලයින් අත්සන් කළ චරිත සහතික ඉදිරිපත් කළ යුතුයි. මින් එකක් ග්‍රාම සේවකගෙන් විය යුතුයි).

සටහන.—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තිකයෙකු ලෙස සේවය, පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) උප්පැන්න සහතිකය.

(ඇ) ලබා ඇති වෘත්තිය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඈ) 4 වැනි ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්ව සේවය පිළිබඳ සහතිකය.

(ඉ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත්වූ ඉහළම විභාගය දැක්වෙන සහතිකය.

සටහන් :

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූවිට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එසේ කුදු වුවත් තම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් කෙලින්ම ලංකා

උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ නමටද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ වුවත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්ට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසිද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ඇල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද, මොරටුව,
1970 ජූලි මස 20 වැනි දින.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ..................................
තනතුර සඳහා ඉල්ලුම්පත්‍රයයි

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ගම් ප්‍රදේශය :————.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට නියම වයස :————.
   උපන් දිනය :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.
7. අධ්‍යාපන සුදුසුකම් :—
   (i) සාමාන්‍ය :————.
   (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.
8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ සේවා විස්තර (සේවය කළ ආයතන, සේවා කාලයන්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි) :————.
9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් (අ) දිනය :————, (ආ) නඩු නොම්මරය :————, (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.
11. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.
12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
13. සේවා මුක්ත සටහනක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.
14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—
    (i) දරන ලද තනතුර :————.
    (ii) නියුක්තව සිටි වකවානුව :————.
    (iii) අස්වීමට හේතුව :————.
15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ පෙර කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :—
    (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
    (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
    (ඇ) සේවය නතර කිරීමට හේතු :————.
16. දැනට යෙදී සිටින රක්ෂාව, ආයතනය :————.
    (i) තනතුර හා ශ්‍රේණිය :————.
    (ii) ඊට පත්වූ දිනය :————.
    (iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම් ද ? :————.
    (iv) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
    (v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17 වෙනත් කරුණු :————.

18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුසු සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය :————.
ඔබේ අංකය :————.

අධ්‍යක්ෂ,
ලංකා උසස් කාර්මික විද්‍යායතනය.

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට පසුව/පෙරය*.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් ......... අංකික ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

————
පදවි නාමය.

දිනය :————.

*අදාළ නැති කොටස් කපා හරින්න.

7–1141—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය—කටුබැද්ද, මොරටුව

### II වැනි පංතියේ වඩු කාර්මික තනතුර

මොරටුව, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ II වැනි පන්තියේ වඩු කාර්මික තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1970. 8. 25 වැනි දින හෝ ඊට පෙර මොරටුව, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. පත් කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්වය 1964. 2. 7 වැනි දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්වය ප්‍රදානය කළවිට වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාලසීමාව අවුරුදු 3 ක් වන්නේය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරාගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ හෝ ආධුනික තත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

3. වැටුප් ක්‍රමය.—

පළමු හයමස තුළ දිනකට රු. 8 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 2,640—15×60—රු. 3,540.

**4. අවශ්‍ය සුදුසුකම්.—**

සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා ඇතුවුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි.

(අ) ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.

(ආ) (1) කියවීමට හා ලිවීමට පිළිවන් විය යුතුයි.

(2) 1/16" පරිමාණයක් කියවීමට පිළිවන් විය යුතුයි.

(3) වඩු වැඩ පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතුයි.

(4) නා නා වර්ගී ලී වල ගුණ හා භාවිතය පිළිබඳව දැන සිටිය යුතුයි.

(5) විවිධ වර්ගවල පිරිද්දුම්වල නම් හා භාවිතයද ඒවා සකස් කරන හැටිද දැන සිටිය යුතුයි.

(6) සිය වෘත්තීයට අදාළ වන සරල ඇඳීම් කියවීමට පිළිවන් විය යුතුයි.

(ඇ) (1) පිළිගත් ආයතනයක II වැනි පන්තියේ අදාල තනතුරක අවුරුදු 5 ට නො අඩු පළපුරුද්දක් තිබිය යුතුයි. (සහතික පත්‍ර මගින් සනාථ කළ යුතුයි.)

(2) මනා චරිතයකින් හා කාය ශක්තියකින් යුක්ත විය යුතුය. (වගකිව යුතු පුද්ගලයින් අත්සන් කළ චරිත සහතික දෙකක් ඉදිරිපත් කළ යුතුයි. මින් එකක් ග්‍රාම සේවක ගෙන් විය යුතුයි.)

සටහන :—

එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තියෙකු ලෙස කළ සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය
(ආ) උප්පැන්න සහතිකය
(ඇ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය
(ඈ) 4 වැනි ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්ව සේවය පිළිබඳ සහතික
(ඉ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත්වූ ඉහළම විභාගය දැක්වෙන සහතිකය

සටහන :—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූවිට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත් තම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් කෙළින්ම ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ නමටද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්ට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසිද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

ආර්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද, මොරටුව,
1970 ජූලි මස 20 වැනි දින.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ..................තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ගම් ප්‍රදේශය :————.
4. අයදුම්පත් බාරගන්නා අවසාන දිනට නියම වයස :————.
   උපන් දිනය :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.
7. අධ්‍යාපන සුදුසුකම් :—
   (i) සාමාන්‍ය :————.
   (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත්වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.
8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ සේවා විස්තර (සේවය කළ ආයතන, සේවා කාලයන්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි) :————.
9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.
11. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.
12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.
14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—
    (i) දරන ලද තනතුර :————.
    (ii) නියුක්තව සිටි එකවානුව :————.
    (iii) අස්වීමට හේතුව :————.
15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :—
    (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
    (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
    (ඇ) සේවය නතර කිරීමට හේතු :————.
16. දැනට යෙදී සිටින රක්ෂාව හා ආයතනය :—
    (i) තනතුර හා ශ්‍රේණිය :————.
    (ii) ඊට පත්වූ දිනය :————.
    (iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම් ද ? :————.
    (iv) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
    (v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
17. වෙනත් කරුණු.—

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කාරණයක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය :————.

අධ්‍යක්ෂ,
ඔබේ අංකය :————.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන්......................අංකික ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය.

දිනය :————.

*අදාල නැති කොටස් කපා හරින්න.

7–1142—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

II ශ්‍රෙණියේ නිවේදක (සිංහල) තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් :—

(අ) සිංහල භාෂාවෙන් සම තත්ත්වයේ සාමාර්ථයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක යෝග්‍ය මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක්,
හෝ
පිළිගත් ගුවන් විදුලි ආයතනයක සහන නිවේදකයකු වශයෙන් යටත් පිරිසෙයින් 3 ක් අවුරුද්දක පළපුරුද්ද සමඟව, සිංහල භාෂාවෙන් ලද සාමාර්ථයද ඇතුව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක්,
හෝ
වැඩ සටහන් වලට නිවේදනය කිරීම ඇතුළුව ඇති කොන්ත්‍රාත් නිලධාරියකු වශයෙන් 3 ක් වසරකට නොඅඩු අඛණ්ඩ සේවාවක්,
සහ

(ආ) සිංහල භාෂාව පිළිබඳ ඉතා උසස් දැනුමක් හා ඉංග්‍රීසි පිළිබඳ සාමාන්‍ය දැනුමක්,

(ඇ) මනා සාහිත්‍යමය හෝ සංස්කෘතික පසුබිමක්, නිර්මාණ ශක්තිය, තත්කාලීන සිදුවීම් පිළිබඳ දැනුම,

(ඈ) මයික්‍රෝෆෝනයට සුදුසු කටහඬක් හා මනා ස්වියත්වයක්, පිළිගත හැකි උච්චාරණ ශෛලියක්, සෞඛ්‍යයෙන් හොඳ තත්ත්වයේ විය යුතුයි.

වයස :—
අවුරුදු 23—40 දක්වා.

වැටුප් ක්‍රමය :—
රු. 450—675 (20 × 5—25 × 5) රු. 510 ට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 අගෝස්තු මස 15 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "II ශ්‍රෙණියේ නිවේදක" යන්න පැහැදිලිව ලිවිය යුතුය.

සුසිල් මුණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

1970 ජූලි මස 16 වැනි දින,
කොළඹ 7,
ලංකා ගුවන් විදුලි සංස්ථාව.

### නිදර්ශන අයදුම් පත

———තනතුර සඳහාවූ අයදුම් පතයි

1. සම්පූර්ණ නම :————.
(1) 1. මුල් අකුරු සහිත නම :————.
(මහතමයාද/මහත්මියද/මෙනවියද යන වග සඳහන් කරන්න.)
(1) 2. ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.
(2) 1. 1970 අගෝස්තු මස 15 වැනි දිනට වයස : අවු :————, මාස :————, දින :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි.)

3. ජාතිය :————.

4. අධ්‍යාපන හා පුහුණුවීම් :

| ඉගෙනීම ලැබූ පාසල් හා ආයතන | දින | | සමත්වී ඇති විභාග | දරු වගකිවයුතු තත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |

5. සමත්වී ඇති උසස්ම විභාගය :
(5) 1. සිංහල :————.
(5) 2. දෙමළ :————.
(5) 3. ඉංග්‍රීසි :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

6. පළපුරුද්ද :
(ඔබගෙ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න.)

| ආයතනයේ නම | උසුලන ලද තනතුර | දින | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව : —
(7) 1.————.
(7) 2.————.
(7) 3.————.

8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් හා තනතුරු :—
(8) 1.————.
(8) 2.————.
(8) 3.————.

9. වෙනත් විස්තර :————.

10. මෙම අයදුම් පතෙහි මවිසින් ඇතුළත් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙළිවුවහොත්, මා අපේක්ෂිත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත් පත්වීම ලද පසු වරදක් හෙළිවුවහොත, කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

7-1091—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලිපිකරු තනතුරු—සාමාන්‍ය ලිපිකරු සේවය

ලංකා විදේශ දූත මණ්ඩලවල ලිපිකරු තනතුරු සඳහා සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් (කලින විදේශ දූත මණ්ඩලවල සේවය කර ඇති අයද ඇතුළුව) අයදුම්පත් කැඳවනු ලැබේ.

2. (අ) සිංහල,
(ආ) ඉංග්‍රීසි,
(ඇ) ගිණුම් කටයුතු, හා
(ඈ) ආයතන රාජකාරි
පිළිබඳව අයදුම්කරුවන්ට මනා දැනීමක් තිබිය යුතුය.

3. අවිවාහක නිලධාරීන්ගේ හෝ විවාහක කුඩා පවුල් ඇති, නිලධාරීන්ගේ අයදුම්පත් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. අයදුම්පත් මේ හා ඇති උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට වියයුතු අතර, එවා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් ඉදිරිපත් කළ යුතුය. තවද, විදේශ සේවය සඳහා අයදුම්කරු සුදුසු බවට හා තෝරාගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් වහාම මුදා හැරීමට හැකි බවටත්, අයදුම්පතේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බවටත්, අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සටහනක් අයදුම්පත සමඟ විය යුතුය.

5. මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුදැයි තීරණය කරනු වස් විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය. ඔවුන්ට අවුරුදු සතරකට නොවැඩි කාලයක් විදේශයේ සේවය කිරීමට නියම වනු ඇත.

6. තෝරාගනු ලබන නිලධාරීන්හට ඔවුන් දැනට දරණ තනතුරට අයත් කල්පිත මූලික වැටුප ලැබෙන අතර ඊට අමතරව ලංකාවේදී ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප වෙනුවට විදෙශ දීමනාවක් ගෙවනු ඇත. අන්‍ය සේවා කොන්දේසීන් විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සලසා ඇති අන්දමට වේ.

7. 1970 අප්‍රේල් 24 දිනැති අංක 14,903 දරණ ආණ්ඩුවේ ගැසට් පතේ පළවුනු 1970 අප්‍රේල 9 දිනැති නිවේදනය සම්බන්ධයෙන් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අය නැවත ඉල්ලුම් කළ යුතු නැත. අනිත් ඒවා සමඟ ඔවුන්ගේ අයදුම්පත් ද සලකා බලනු ලැබේ.

8. අයදුම්පත් 1970 අගෝස්තු මස 21 වන දිනට හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලැබිය යුතුය.

ඩී. එල්. බී. මෙන්ඩිස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 ජූලි 23 දින,
කොළඹ 1,
සෙනේට් මන්දිරයේ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දීය.

## උපලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නම මුලින්)

2. (අ) උපන් දිනය :————.
(ආ) 1970 අගෝස්තු 21 දිනට වයස :—
අවුරුදු :————, මා.ස :————.

3. ලිපිනය :—
(අ) කාර්යාලීය :————.
(ආ) පුද්ගලික :————.

4. ජාතිය :————.

5. විවාහක, අවිවාහක බව :————.

6. විවාහක නම් දරුවන් ගණන :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.

8. (අ) වි.ලි.ප. II ශ්‍රේණියට පත් වූ දිනය :————.
(ආ) රජය යටතේ සේවය කර ඇති අවුරුදු ගණන :————.

9. වර්තමාන වාර්ෂික වැටුප :—
(අ) ඒකාබද්ධ වැටුප :————.
(ආ) මූලික කල්පිත වැටුප :————.

10. දැනට කරන රාජකාරි ස්වභාවය :————.

11. (අ) ගිණුම් කටයුතු පිළිබඳ පළපුරුද්ද :————.
(ආ) ආයතන රාජකාරි පිළිබඳ පළපුරුද්ද :————.

12. සිංහල භාෂාවෙන් ලබා ඇති ප්‍රවීණතාවය :————.

13. සිංහල යතුරු ලිවීමේ ප්‍රවීණතාවය :————.

14. අයදුම්කරු මීට ඉහත දී සේවය කර ඇති ලංකා විදේශ දූත මණ්ඩල හා කාලයන් :————.

15. වෙනත් සුදුසුකම් :————.

ඉහතින් දී ඇති තොරතුරු සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1122—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලඝුලේඛක තනතුරු

ලංකා විදේශ දූත මණ්ඩලවල ලඝුලේඛක තනතුරු සඳහා සථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ (ඉංග්‍රීසි මාධ්‍ය) ස්වකීය පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන්ගෙන් (කලින් විදේශ දූත මණ්ඩලවල සේවය කර ඇති අයද ඇතුළුව) අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත්, මේ හා ඇති උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට වියයුතු අතර, ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් ඉදිරිපත් කළ යුතුය. තවද, විදේශ සේවය සඳහා අයදුම්කරු සුදුසු බවට හා තෝරාගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් වහාම මුදා හැරීමට හැකි බවටත්, අයදුම්පතේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බවටත් අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්ත මේන්තුවේ ප්‍රධානියාගේ සටහනක් අයදුම්පත සමඟ විය යුතුය.

3. සිංහල යතුරු ලිවීම පිළිබඳවද දැනුමක් ඇති අවිවාහක අයදුම් කරුවන්ගේ හෝ විවාහක කුඩා පවුල් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුදැයි තීරණය කරනු වස් විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය. ඔවුන්ට අවුරුදු සතරකට නොවැඩි කාලයක් විදේශයේ සේවය කිරීමට නියම වනු ඇත.

5. තෝරාගනු ලබන නිලධාරීන්හට ඔවුන් දැනට දරණ තනතුරට අයත් කල්පිත මූලික වැටුප් ලැබෙන අතර ඊට අමතරව ලංකාවේ දී ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. අනෙක් සේවා කොන්දේසීන් ලංකා විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සලසා ඇති අන්දමට වේ.

6. 1970 අප්‍රේල් 30 දිනැති අංක 14,904 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවුනු 1970 අප්‍රේල් 12 දිනැති නිවේදනය සම්බන්ධයෙන් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අය නැවත ඉල්ලුම් කළ යුතු නැත. අනිත් ඒවා සමඟ ඔවුන්ගේ අයදුම්පත් ද සලකා බලනු ලැබේ.

7. අයදුම්පත් 1970 අගෝස්තු මස 21 වන දිනට හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලැබිය යුතුය.

වී. එල්. බී. මෙන්දිස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 ජූලි 23 දින,
කොළඹ 1,
සෙනේට් මන්දිරයේ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දිය.

## උපලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නම මුලින්)

2. (අ) උපන් දිනය :————.
(ආ) 1970 අගෝස්තු 21 දිනට වයස : අවුරුදු——, මාස ——.

3. ලිපිනය :—
(අ) කාර්යාලීය :————.
(ආ) පුද්ගලික :————.

4. ජාතිය :————.

5. විවාහක, අවිවාහක බව :————.

6. විවාහක නම් දරුවන් ගණන :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.

8. (අ) ලඝුලේඛක සේවයට පත්වූ දිනය :————.
(ආ) පත්වීම ස්ථිර කරනු ලැබූ දිනය :————.
(ඇ) වර්තමාන ශ්‍රේණිය :————.

9. වර්තමාන වාර්ෂික වැටුප :————.
(අ) ඒකාබද්ධ වැටුප :————.
(ආ) මූලික කල්පිත වැටුප :————.

10. (අ) ඉංග්‍රීසි ලඝුලේඛන වේගය :————.
(ආ) ඉංග්‍රීසි යතුරු ලිවීමේ වේගය :————.

11. දැනට කරන රාජකාරි ස්වභාවය :————.

12. (අ) සිංහල භාෂාවෙන් ලබා ඇති ප්‍රවීණතාවය :————.
(ආ) සිංහල යතුරු ලිවීමේ ප්‍රවීණතාවය :————.

13. අයදුම්කරු මීට ඉහත දී සේවය කර ඇති ලංකා විදේශ දූත මණ්ඩල හා කාලයන් :————.

14. වෙනත් සුදුසුකම් :————.

ඉහතින් දී ඇති තොරතුරු සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1123—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : ඔඑම්/4/1/124.

## ලංකා විදේශ දූත මණ්ඩලයක පුරප්පාඩුවක්

### සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ ලංකා තානාපති කාර්යාලයේ ලංකා විදේශ සේවයේ "සී" ශ්‍රේණියේ තනතුරක්

සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ මොස්කව් නුවර ලංකා තානාපති කාර්යාලයේ ලංකා විදේශ සේවයේ "සී" ශ්‍රේණියේ තනතුරක් සඳහා ලංකා රජයේ සේවයේ නියුක්ත කාර්යාල කාර්ය සහායක වරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත සේවයේ අය විය යුතු අතර ඔවුන් සේවයේ ස්ථිර කර සිටිය යුතුවේ.

1970 අගෝස්තු 14 වන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු අතර ඔවුන් විවාහකයින් විය යුතුය.

මෝටර් රථ එළවීමේ බලපත්‍ර ඇති හා ඒ පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

2. මෙම තනතුර සඳහා තෝරාගනු ලබන තැනැත්තාහට අවුරුදු තුනක කාලසීමාවක් පිටරට සේවය කිරීම අවශ්‍යවනු ඇත. ඔහුට විදේශයේ දීත් දැනට දරණ තනතුරට අයත් කල්පිත වැටුපම ලැබෙන අතර, විදේශ සේවා සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව විදේශ දීමනාවක් හා ඇඳුම් පැළඳුම් දීමනාවක් ද ගෙවනු ඇත.

3. මෙම තනතුර සඳහා තෝරාගනු ලබන තැනැත්තා විදේශයක සේවය කිරීමට ඇති ශාරීරික යෝග්‍යතාවය ගැන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම ද අවශ්‍යවනු ඇත.

4. මේ හා ඇති උපලේඛනයේ ඇති ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත් අයදුම්කරුවන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් කොළඹ 1. සෙනෙට් මන්දිරයේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පතෙහි සඳහන් කර ඇති කරුණු නිවැරදි බවටත්, අයදුම්කරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයට අයත් සේවය ස්ථිර කර ඇති කාර්යාල කාර්ය සහායකයකු බවත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහතික කළ යුතුය. තවද, විදේශ සේවය සඳහා අයදුම් කරුගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්දේශයක් හා තෝරාගනු ලැබුව හොත් ඔහු දැනට දරණ තනතුරෙන් මුදාහැරිය හැකි බවටත්, අයදුම්කරුගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සටහනක් අයදුම්පත සමඟ එවිය යුතුය.

5. මෙම අමාත්‍යාංශයට මීට ඉහත එවා ඇති අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. අයදුම්පත් 1970 අගෝස්තු මස 14 වන දින හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශයට ලැබිය යුතුය.

වී. එල්. බී. මෙන්ඩිස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් වෙනුවට.

1970 ජූලි 20 දින,
කොළඹ 1,
සෙනෙට් මන්දිරයේ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

1. (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනිත් නම් :————.
2. (අ) උපන් දිනය :————.
   (ආ) 1970 අගෝස්තු 14 දිනට වයස :————.
3. ලිපිනය :
   (අ) කාර්යාලීය :————.
   (ආ) පුද්ගලික :————.
4. ජාතිය :————.
5. විවාහක, අවිවාහක බව :————.
6. විවාහක නම් දරුවන් ගණන හා ඔවුන්ගේ වයස් :————.
7. අධ්‍යාපනික සුදුසුකම් :————.
8. පාසැලෙන් අස්වූ පසු කළ රක්ෂාවල් :————.
9. කාර්යාල කාර්ය සහායක තනතුරට පත්වූ දිනය :————.
10. පත්වීම ස්ථිර කරනු ලැබූ දිනය :————.
11. වර්තමාන වාර්ෂික වැටුප හා වැටුප් පරිමාණය :————.
    කල්පිත :————.
    ඒකාබද්ධ :————.
12. මෝටර් රථ එළවීමේ පළපුරුද්ද :————.
13. වෙනත් සුදුසුකම් :————.

ඉහතින් දී ඇති තොරතුරු සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1055—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ශාලාවේ කාර්යාල සහකාර තනතුර

මහා මාර්ග දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ශාලාවේ කාර්යාල සහකාර තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව, පිළියෙළ කළ ඉල්ලුම්පත්‍ර 1970 අගෝස්තු 18 වැනි දින දහවල් 12 ට පෙර හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

2. **වැටුප්.**—වර්ෂයකට රු. 180 සහ රු. 240 ගණනේ වැඩිවීම් සහිතව රු. 6,600 සිට රු. 9,240 දක්වා නැග යන ඒකාබද්ධ වැටුපක් මෙ තනතුරට අයත් වෙයි. රු. 7,500 හා රු. 8,280 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. **සේවයේ යෙදවීමේ කොන්දේසි.**—(i) තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්කිරීම පළමුවෙන් එක් අවුරුදු කාල සීමාවක් සඳහා වැඩ බැලීමේ පදනම මත වනු ඇත. පත්වීම ස්ථිර කළ විට තෝරාගනු ලැබූ නිලධාරියාට පොදු ලිපිකාර සේවයේ හෝ වෙනත් දෙපාර්තමේන්තු ලිපිකාර සේවයක හෝ සාමාජිකත්වය අහිමි වන අතර, එම සේවයට ආපසු පත්වීමේ අයිතියද ඔහුට ඉතිරි නොවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) අපේක්ෂකයින් වර්ෂයකට රු. 5,304 ක ඒකාබද්ධ වැටුපක් ලබන සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ 2 වැනි ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක හෝ දෙපාර්තමේන්තු ලිපිකාර සේවාවක ඊට සමාන ශ්‍රේණියට හෝ නිලධාරින් විය යුතුය.

(ආ) මේ අපේක්ෂකයින් තුළ පාලනය පිළිබඳ පළපුරුද්දක් සහ හැකියාවක් රා. සේ. කො. ස. රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් සහ පාලන රෙගුලාසි, මුදල් රෙගුලාසි හා කම්කරුවන්ට අදාල නීති හා රෙගුලාසි සම්බන්ධ දැනුමක්ද ඇති බවට ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සහතික කළ යුතුය.

(ඇ) අපේක්ෂකයින් අවුරුදු 35 ට වඩා වයස් ඇති අය විය යුතු අතර, යහපත් චරිත ශුද්ධියකින් හා මනා සෞඛ්‍යයකින්ද යුක්ත විය යුතුය.

(ඈ) අඩු ගණනේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන උසස් විභාගයකින් අපේක්ෂකයින් සමත්වී සිටිය යුතු අතර, සිංහලෙන් වැඩ කිරීමට සහපත්සේ දැනුමක්ද තිබිය යුතුය.

5. අයදුම්කරුවන් විසින් තමන්ගේ ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් වන සහතිකපත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය. (සංල. : බවුතීස්ම සහතිකපත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා නිකුත් කරන ලද සහතිකපත්‍ර භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් සහතික පත්‍රය.

6. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියම දිනට පසුව එවනු ලබන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. එහෙත් ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියම දිනට ප්‍රථම ලබා ඇති නම් සහ ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතූන් ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානීහු නිර්දේශ කරත් නම් ඒවා භාරගනු ලැබේ.

7. ඉල්ලුම්පත්‍ර සහ ඊට සම්බන්ධ අනිකුත් ලියකියවිලි වෙතොත්, ඒවාත්, මහා මාර්ග අධ්‍යක්ෂ, "කළමනාකාරිත්ව" ශාඛාව, මහා මාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 1, යනුවෙන් සඳහන් කර එවිය යුතු වන අතර, මේ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයකට නොඑවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ඇරඹුමයේ පළ කර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම් පිළිබඳ ඇති පොදු කොන්දේසිවලට ඔබේ අවධානය යොමු විය යුතුයි.

එන්. ජී. වික්‍රමසිංහ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, මහා මාර්ග දෙපාර්තමේන්තුව,
1970 ජූලි 19 වැනි දින දීය.

**මහා මාර්ග දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ශාලාවේ කාර්යාල සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) 1970 අගෝස්තු 18 වැනිදාට වයස :—
   අවුරුදු :——, මාස :——, දින :——.
   (ආ) උපන් දිනය සහ තැන :————.

4. අධ්‍යාපන සුදුසුකම් (සමර්ථවී සිටින උසස්ම විභාගය සඳහන් කරන්න.) :————.

5. (අ) සාමාන්‍ය ලිපිකරු සේවාවේ විධායක ලිපිකරු පන්තියේ නිලධාරියෙක්ද, නැතහොත් වෙනත් දෙපාර්තමේන්තුවක ලිපිකරු සේවාවක ඊට සමාන ශ්‍රේණියක නිලධාරියෙක්ද යන වග :————.
   (ආ) විධායක ලිපිකරු පන්තියේ 2 වැනි ශ්‍රේණියට පත්වූ දිනය/වෙනත් දෙපාර්තමේන්තු ලිපිකරු සේවාවක ඊට සමාන ශ්‍රේණියට පත්වූ දිනය :————.

6. (අ) දැනට දරණ තනතුර :————.
   (ආ) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

7. (අ) සිංහලයෙන් වැඩ කිරීම පිළිබඳ දක්ෂතාවයක් තිබේද යන වග :————.
   (ආ) සමත්වී ඇති උසස්ම සිංහල විභාගය :————.

8. දැන්වීමේ 4 වැනි ඡේදයේ (ආ) උප ඡේදය අනුව වගකීම් සහිතව දැරූ තනතුරු පිළිබඳව පළපුරුද්ද ගැන සම්පූර්ණ විස්තර :————.
   (දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් සහතිකයක් ඇමිණිය යුතුය.)

9. මෙකී තනතුරට තෝරාගත් විටක ඔබ දැනට දරණ තනතුරින් නිදහස් වීමටත්, එමෙන්ම එම තනතුරට නැවත පත් කරණ ලෙස ඉල්ලා සිටීමේ අයිතිවාසිකම් අවලංගු කර ගැනීමටත් සූදානම්ද ?————.

10. වෙනත් වැඩිපුර විස්තර :————.

මා විසින් ඉහත සපයා ඇති විස්තර සත්‍යද නිවැරදිද බව මෙයින් සහතික කරමි. එසේම මේ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කිසියම් විස්තරයක් අසත්‍ය හෝ වැරදි හෝ බව තනතුර සඳහා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් තෝරා පත්කර ගැනීමට නුසුදුස්සකු බවත්, අසත්‍ය තොරතුරක් මා සපයා තිබෙන බව පත්වීම ලබාගෙන් පසු එළිදරව් වුවහොත් කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහ කරනු ලබන බවත්, මම හොඳාකාර දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1050—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**විදුලි වෛද්‍ය ඉංජිනේරු කොට්ඨාශයේ විදුලි වෛද්‍ය උපකරණ I වන ශ්‍රේණියේ ෆෝර්මන් තනතුර සඳහා අයදුම්පත්‍රය**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය ඉංජිනේරු කොට්ඨාශයේ විදුලි වෛද්‍ය උපකරණ I වන ශ්‍රේණියේ ෆෝර්මන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි මතු දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුකරණයෙන් පිළියෙල වූ අයදුම්පත් 1970.8.22 වනදා හෝ ඊට කලින් හෝ කොළඹ 1, තැ. පෙ. අංක 500 හිමි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට වර්ෂයකට රු. 6,660—8×180—8,040 ඒකාබද්ධ වැටුපක් හිමි වේ.

3. **වයස් සීමාව.**—අයදුම්පත් කැඳවන අවසාන දිනයට වයස අවුරුදු 21 ට නො අඩුවෙනුත් 35 ට නොවැඩියෙනුත් විය යුතු ය.

**සැලකිය යුතුය.**—දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයින්ට උපරිම වයස් සීමාව නොයෙදේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—

(අ) (i) ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළත් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය,

**නොහොත්**

(ii) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළු විෂය - 6 කින් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ).

(ආ) (i) ලංකා කාර්මික විද්‍යාලයෙන් ලද කණිෂ්ඨ කාර්මික නිලධාරි (විදුලි/යාන්ත්‍රික) සහතිකය සහිතව විදුලි වැඩ/විද්‍යුත් විද්‍යාව ඉංජිනේරු විෂයයෙහි පිළිගත් ආයතනයකින් 8 අවුරුද්දකට නොඅඩුව පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**නැතහොත්**

(ii) සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ III වන ශ්‍රේණියේ තත්ත්වය හෝ ඊට සමාන තත්ත්වයක් හෝ තෙක් විදුලි වැඩ ඉංජිනේරු විද්‍යාව විෂයයෙන් හෝ ව්‍යවහාරික විද්‍යුත් පාඨමාර්ගයක් පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ ආයතනයෙකින් නිමාව ඇති බවට ලත් සහතිකය සහිතව විදුලිවැඩ/විද්‍යුත් විද්‍යාව ඉංජිනේරු විෂයයෙහි පිළිගත් ආතනයකින් 10 අවුරුද්දකට නොඅඩුව පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**සැලකිය යුතුයි.**—අඩු ගණනේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර සුදුසුකම සමග ඉහත (ආ) ඡේදයේ නියමිත සුදුසුකම් තිබෙන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ද අයදුම්පත් එවීමට සුදුස්සෝ වෙති.

5. **සේවයෙහි යෙදවීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අපේක්ෂකයාට වැන්දඹු අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවන ලෙස නියම කරනු ඇත.

6. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත දැක්වෙන සහතිකවල පිටපත් එවිය යුතුය. (මුල් සහතික නොවේ.)

(ඒ) උප්පැන්න සහතික (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අනුව නිකුත් කරන ලද සහතික හෝ භාර ගනු නොලැබේ.) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ විශේෂ සහතිකය (උප්පැන්න ලියාපදිංචි කොට නොමැති අයදුම්කරුවන් සම්බන්ධයෙනි.) අයදුම්කරුවන්ගේ වයස ඔප්පු කිරීම සඳහා පිළිගනු ලැබේ.

(බී) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(සී) ලබා ඇති කාර්මික සුදුසුකම් දැක්වෙන සහතිකය.

(ඩී) පළපුරුද්ද දැක්වෙන සහතිකය.

(ඊ) චරිතය පිළිබඳව ලඟදීම ලබාගත් සහතික 3 ක්. (දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් විසින් මෙය ඉදිරිපත් කිරීම අනවශ්‍යය.

7. රජයේ හෝ අර්ධ රජයේ බල මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් ස්වකීය පත්වීම් බලධාරියා මගින්ම ඉදිරිපත් කළ යුතුය.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙම දැන්වීමෙහි සඳහන් නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසෙහි (II) වන ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම පිළිබඳ පොදු කොන්දේසි ද කියවා බලන්න.

ඇල්. ඩබ්. ගුණවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට,
(පාලන) නියෝජ්‍ය අධ්‍යක්ෂ.

තැ. පෙ. 500,
ගාලුමුවදොර මහලේකම් කාර්යාලය,
කොළඹ 1.
1970 ජූලි මස 10 වන දින දීය.

### අයදුම්පත් ආකෘතිය

**විදුලිය වෛද්‍ය උපකරණ I වන ශ්‍රේණියේ පෝමර්න් තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :———.
   (පැහැදිලි අකුරෙන්)
2. ස්ථිර ලිපිනය :———.
3. උපන් දිනය හා අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස: උපන් දිනය :———. අවු :——, මාස :——, දින :——
4. ජාතිය :———.
   ලාංකික වනුයේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන වග :———.
5. රජයේ හෝ අර්ධ රජයේ බලමණ්ඩලයක සේවයේ නියුක්ත අයගේ නම් දරන තනතුර සහ සේවා ස්ථානය :———.
6. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :———.
7. කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :———.
   (සමත් වූ කාර්මික පාඨමාලා)
8. ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර :———.
9. වෙනත් හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :———.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි. එමෙන්ම මවිසින් සපයා ඇති කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව තෝරා ගැනීමට කලින් සොයා ගනු ලැබුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගුවීමටද පත්වීමෙන් පසු එම වරද සොයාගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා තනතුරින් පහකිරීමටද ඉඩ ඇති බව ද පිළිගනිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

7–1052—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

### කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළේ අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළේ අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1970 අගෝස්තු මස 31 වැනි දිනට පෙර එකී කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනට ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි.

ප්‍රාදේශීය ආදායම් නිලධාරි, නැගෙනහිර හේවාගම් කෝරළය, හංවැල්ල.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම;

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත වීම;

(ඇ) අයැදුම්කරු ඉහත කී අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා සීමාවේ ස්ථිර පදිංචිකරුවකු වීම;

(ඈ) (i) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා භාරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා භාරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම, හෝ

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයැදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි.

ඩ. වී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 ජූලි මස 19 වැනි දින,
කොළඹ දිසාපති කාර්යාලයේදී ය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

**කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළේ අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :———.
2. ලිපිනය :———.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :———.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :———.
   (ආ) උපන් දිනය සහ ස්ථානය :———.
5. විවාහක අවිවාහක බව :———.
6. අධ්‍යාපන සුදුසුකම් :———.
7. දැනට කරන රක්ෂාව :———..
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.
9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිතව :———.
10. අයදුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.
11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණය මගින් දඩුවම් ලබා තිබේද? :———.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :———.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

7–1060—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

### රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය

**නූතන වෛද්‍ය විද්‍යාව පිළිබඳ අර්ධ කාලීන කථිකාචාර්ය තනතුර (දෙමළ මාධ්‍ය)**

රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ නූතන වෛද්‍ය විද්‍යාව (දෙමළ මාධ්‍යයෙන්) පිළිබඳ අර්ධ කාලීන කථිකාචාර්ය තනතුරක් සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

**සුදුසුකම්.**—අයදුම්කරුවන් නූතන වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාලයීය උපාධිධාරීන් විය යුතු අතර, දෙමළ මාධ්‍යයෙන් ඉගැන්වීමේ හැකියාවක් ඇති අය විය යුතුය.

**දේශන.**—දිනකට පැය 2 (දෙක) බැගින් සතියකට පැය 10 ක් ඉගැන්වීම් කළ යුතුය.

**ගෙවීම.**—සියලු දීමනාවක් ඇතුළුව පැයකට රුපියල් 15 ක දීමනාවක් ගෙවනු ලැබේ.

2. සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර සහිත ඉල්ලුම් පත්‍ර 1970. 8. 20 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුය. (1970. 4. 3 දරණ ගැසට් නිවේදනය අනුව ඉල්ලුම් කර ඇති අයද නැවත ඉල්ලුම් කළ යුතුය.)

පණ්ඩිත විලියම් අල්විස්,
විද්‍යාලයාධිපති.

1970 ජූලි මස 22 වන දින
රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේදී ය.

7–1135—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### උපාධිධාරී වෛද්‍යවරයන් විශේෂඥයන් වශයෙන් පුහුණු කිරීම සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව

උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන් විශේෂඥයන් වශයෙන් පුහුණුකිරීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ශිෂ්‍යත්ව පිරිනැමීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) අක්ෂිරෝග,
(2) කැඩුම්-බිඳුම්,
(3) චර්මරෝග,
(4) ගෙඩි-වණ-පිළිකා,
(5) සර්පවිෂ,

සම්බන්ධයෙන් පමණක් විශේෂඥ පුහුණුවක් ලැබීම සඳහා මෙම ශිෂ්‍යත්ව පිරිනැමෙනවා ඇත. මෙම පුහුණුවේ පරමාර්ථය වනුයේ පාරම්පරික වෛද්‍යවරුන් අතරෙහි ඇති වෛද්‍ය කර්ම හා චිකිත්සා ක්‍රමානුකූල අන්දමකට ලබා ගැනීමය.

2. අවශ්‍ය යෝග්‍යතාවන්

(අ) රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ අවසාන ඩී.ඒ.එම්.එස්./ඩී.අයි.එම්.එස්. පරීක්ෂණයේදී ප්‍රථම ශ්‍රේණියේ හෝ දෙවන ශ්‍රේණියේ සාමර්ථයක් ලබා තිබීම, හා තමා තෝරා ගන්නා අංශයට අයත් අවසාන පරීක්ෂණයේ විෂයයන් 60% කට වඩා ලකුණු ලබා තිබීම. එනම්,

(1) අක්ෂි රෝග චිකිත්සා—අවසාන පරීක්ෂණයේ—ශල්‍ය හා ශාලක්‍ය විෂයයන්

(2) කැඩුම්-බිඳුම් අවසාන පරීක්ෂණයේ—ශල්‍ය විෂය

(3) චර්ම රෝග චිකිත්සා අවසාන පරීක්ෂණයේ— නිදාන හා කාය චිකිත්සා විෂයයන්

(4) ගෙඩි-වණ-පිළිකා අවසාන පරීක්ෂණයේ—ශල්‍ය විෂය

(5) සර්පවිෂ අවසාන පරීක්ෂණයේ—අගද විෂය.
(අවසාන පරීක්ෂණයේදී 60%ට වඩා ලකුණු ලබා තිබීම පිළිබඳව විදුහල්පතිගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

(ආ) තම තමන් විශේෂඥ පුහුණුව ලැබීම අදහස් කරන අංශයට අදාලව අ.පො.ස. (සාමාන්‍ය) පරීක්ෂණයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා පත්‍රයෙන් විශිෂ්ඨ හෝ සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. (ආයුර්වේද අංශයට සිංහල, සිද්ධ අංශයට දෙමළ හා යුනානි අංශයට ඉංග්‍රීසි වශයෙනි.)

(ඇ) ඉංග්‍රීසි—දෙමළ—සංස්කෘත—හින්දි හෝ උර්දු යන භාෂාවන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් පිළිබඳ දැනුම අතිරේක සුදුසුකමක් වනු ඇත.

(ඈ) 1970 අගෝස්තු මස 20 දිනට වයස අවුරුදු 35 කට නොවැඩි විය යුතුය.

(ඉ) සියලුම අපේක්ෂක-අපේක්ෂිකාවන් අවිවාහකයන් පමණක් වියයුතු අතර, රැකීරක්ෂාවන්හි නියුතු වූවන් නොවිය යුතුයි.

3. සියලුම අපේක්ෂක-අපේක්ෂිකාවන් ලාංකිකයන් වියයුතුයි. ලාංකික යනුවෙන් අදහස් වන්නේ ලියාපදිංචි වීමෙන් හෝ පරම්පරාවෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලත් අයයි.

4. මානසික හා ශාරීරික සෞඛ්‍ය අතින් සෑහීමකට පත්වූ තත්ත්වයක සිටීම අවශ්‍ය වේ.

5. පසුව දැනුම් දෙන දිනෙක හා වේලාවක මෙම දෙපාර්තමේන්තුවේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට/හෝ/හා පරීක්ෂණයකට පැමිණෙන ලෙස සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට නියම කරනු ඇත. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසියම් දීමනාවක් හෝ ගෙවනු නො ලැබේ.

6. තෝරාගන්නා අයදුම්කරුවන් තමා කැමති විශේෂඥතාවය ලබා ගැනීම පිළිබඳ පුහුණුව සඳහා දිවයිනේ එම විශේෂඥතාවය පිළිබඳ ප්‍රසිද්ධ වෛද්‍යවරුන් යටතේ නියමිත කාලය තුළ එම වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් පුහුණුව ලබා ගතයුතුය.

7. මෙම ශිෂ්‍යත්ව කාලසීමාව අවුරුදු දෙකකි. මෙම කාලසීමාව තුලදී ශිෂ්‍යත්ව හිමි කර ගන්නා එක එක අයදුම්කරුවකුට මසකට සියල්ල අඩංගු රු. 100ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ. අතර මගදී ඉගෙනීම නතර කළහොත් රජයෙන් ලබාගත් ගෙවීම් සියල්ල ආපසු ගෙවිය යුතුය.

8. සිය විශේෂඥතාවය ලබාගැනීම සම්බන්ධයෙන් මෙම කාල සීමාව තුල ඒ පිළිබඳ වෛද්‍යාචාර්යවරුන් දෙදෙනෙක් ළඟ හෝ හතර දෙනෙක් ළඟ හෝ පුහුණුව ලැබීමට පහසුකම් සැලසෙනවා ඇත. පුහුණුව ලබන කාලසීමාව තුළදී ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත් විය යුතුය.

9. පුහුණුව අවසානයේදී සෑම ශිෂ්‍යයෙකු විසින්ම තමා උගත් විශේෂඥ ක්‍රමය පිළිබඳව නිබන්ධනයක් සකස්කොට දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළයුතුය. ඔහු විශේෂඥයෙකු හැටියට පිළිගනු ලබන්නේ ඔහු ලබා තිබෙන පුහුණුව හා ඉගෙනීම සාර්ථක වී තිබෙන බව ඔප්පු වුවහොත් පමණකි. එසේ සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ඇති ශිෂ්‍යත්වධාරීන්ට විශේෂ සහතිකයක් දෙපාර්තමේන්තුව මගින් පිරිනැමෙනවා ඇත. මෙම සහතිකය පශ්චාත් උපාධි සහතිකයක් වශයෙන් ගණන් ගනු නොලැබෙන අතර, දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරුන් බඳවා ගැනීමේදී එම සහතිකය ලත් අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. ශිෂ්‍යත්ව කාලයේ මුල් සමය තුළ අපේක්ෂකයාගේ ප්‍රගති වාර්තා අසතුටු දායක වුවහොත් හෝ නියමිත දෙවසරක කාලය තුළ විවාහ වුවහොත් හෝ ශිෂ්‍යත්වය අවලංගු කරනු ලැබේ.

10. තෝරා ගන්නා සියලුම අයදුම්කරුවන් ගැසට් නිවේදනයේ අඩංගු පුහුණුවට අදාල සියලුම කොන්දේසිවලට එකඟ වන බව දක්වෙන ගිවිසුම් පතකට (ශත පනහේ මුද්දරයක් මත) අත්සන් තැබිය යුතුය.

11. අයදුම්කරුවන් පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 1970 අගෝස්තු මස 20 දින දහවල් 12ට පෙර ලැබෙන සේ, කොළඹ 8, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස් යන මගේ නිල නාමයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවර "උපාධිධාරී වෛද්‍යවරයන් පුහුණු කිරීම සඳහා ශිෂ්‍යත්ව" යනුවෙන් සඳහන් කළයුතුය.

විමල් නවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

1970 ජූලි මස 19 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

### උපාධිධාරී වෛද්‍යවරයන් විශේෂඥයින් වශයෙන් පුහුණු කිරීම සඳහා ශිෂ්‍යත්ව

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :——.
    (අ) පෙළපත් නාමය :——.
    (ආ) අනික් නම් :——.
(2) පෞද්ගලික ලිපිනය :——.
(3) ජාතිය :——.
(4) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.) :——.
    (අ) 1970.8.20 දිනට වයස :—
    අවුරුදු——, මාස——, දින.
(5) ස්ත්‍රී පුරුෂ භාවය :——.
(6) විවාහක ද ? :——.
(7) අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :—
    1. සිංහල :——.
    2. දෙමළ :——.
    3. ඉංග්‍රීසි :——.
(8) වෘත්තීය සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය)
(9) තමන් දැනට රැකියාවක නියුක්තද ? ඒ පිළිබඳ විස්තර— ශිෂ්‍යත්වයක් ලදහොත් රැකියාවෙන් මිදී පුහුණුව සඳහා පැමිණීම කළහැකිද යන්න :——.
(10) වෛද්‍ය කර්මයෙහි පළපුරුද්දක් ඇද්ද ? :——.
(11) තමන් ලැබීමට අදහස් කරන විශේෂඥතාවය කුමක්ද යන වග (ඒ සම්බන්ධව අනුගමනය කිරීමට බලාපොරොත්තු වන වැඩ පිළිවෙලේ කෙටි සටහනක්) :——.
(12) එම විශේෂඥතාවය ලැබීම සඳහා තමා ඇසුරුකිරීමට බලාපොරොත්තු වන විශේෂඥ වෛද්‍යවරුන් කවුරුදු යන වග :——.

    ලියාපදිංචි අංකය :——.
    (මෙම වෛද්‍යවරුන්ට පුහුණුව දීමට සෑදුට ප්‍රකාශ කරන ලිපි අමුණන්නේ නම් වඩා යෝග්‍ය වේ. උගන්වන වෛද්‍යවරයාටද රු. 100ක් මාස්පතා ගෙවනු ලැබේ.)

(13) වෙනත් කරුණු :——.

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව මාගේ තෝරාගන්ට පෙර දැනගන්නට ලැබුනහොත්, මා මෙම ශිෂ්‍යත්වයට නුසුදුස්සකු වන බවද ශිෂ්‍යත්වය ලැබීමෙන් පසු දැනගන්නට ලැබුනහොත් වහාම ශිෂ්‍යත්වය අවලංගු කරනු ලබන බවද මම දනිමි.

——.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——.

7-1054—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර

මේ දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ෆෝර්මය අනුව මෙම ඉල්ලුම් පත්‍ර පිළියෙල කර 1970 අගෝස්තු 22 වන දින හෝ ඊට පෙර, මහා මාර්ග අධ්‍යක්ෂ (ආයතන ශාඛාව), කොළඹ 1, යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. 1970.4.30 දිනැති රජයේ ගැසට් නිවේදනය අනුව ඉල්ලුම් පත්‍ර එවූ අයදුම්කරුවන් නැවත ඉල්ලුම් කිරීම අවශ්‍ය නැත. නව දැන්වීම අනුව ලැබෙන ඉල්ලුම් පත් සමග ඔවුන්ගේ ඉල්ලුම් පත් ද සලකා බලනු ඇත.

2. වැටුප.—මේ තනතුරට නියමිතව ඇත්තේ වර්ෂයකට රු. 4,728න් පටන්ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් සහිතව වර්ෂයකට රු. 6,456 දක්වා වැඩි වී යන වැටුප් ක්‍රමයකි. (ඒකාබද්ධ වැටුප).

3. (i) **සේවයේ යෙදවීමේ නියමයන්.**—මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුවේ.

(ii) දනුම් දී කෙටි කාලයක් ඇතුළත පත්වීම භාර ගැනීමට නියම කරනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම් :

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් හෝ සමත් වී සිටීම.

(ආ) ගොඩනැගිලිවල විදුලි නිර්මාණ සහ ස්ථාපන වැඩ ගැන සහ පහත සඳහන් කවර දෙයක් ගැන හෝ පළපුරුද්දක් තිබිය යුතුය. උඹුරුහැන් සහ එයට සබැඳි විහරු උවාරන යටිබහන්, විදුලි ඔසවනයන්, වතුර පොම්ප, වාසකසන යන්, අසනිවාරකයන්, එන්ජින් යෙදූ දනවනයන් සහ පරිනාමක උප පොලවල් ගැන රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන සේවයේ හෝ පිළිගත් වෙළඳ සමාගමක හෝ පරිපාලන තත්ත්වයෙන් අවුරුදු පහකට නොඅඩු කාලයක් සේවය කර තිබීම, සහ

(ඇ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ හෝ කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික ආයතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් (විදුලි) පිළිබඳ දවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම,

හෝ

(ii) විදුලි ෆෝමන් ඇධුනික පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ රජයේ විදුලි දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද III ශ්‍රේණිය සඳහා වූ පළමුවැනි දෙපාර්තමේන්තු විභාගය සමත් වී තිබීම

හෝ

(iii) ලන්ඩන් ආයතනයේ "සිටි සහ ගිල්ඩ්ස්' හි විදුලි ඉංජිනේරු ව්‍යවහාර දෙ.ද. සහ ඒ.ද. විභාගයේ මධ්‍යම ශ්‍රේණියෙන් සමත් වීම,

හෝ

(iv) ලන්ඩන් ආයතනයේ "සිටි සහ ගිල්ඩ්ස්" හි විදුලි ස්ථාපන සහ වැඩ පිළිබඳ විභාගයේ "බී" සහ "සී" පාඨමාලාවලින් සමත් වීම.

(ඈ) අයදුම්කරුවන් වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 35 ට වැඩි නොවිය යුතුයි.

**සටහන.**—රජයේ සේවයේ සිටින ඉල්ලුම්කරුවන් සඳහා වයස් සීමාව බල නොපානු ඇත. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක II ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුරෙහි සේවය කර ඇති ඉල්ලුම් කරුවන් සම්බන්ධයෙන් වයස සහ සුදුසුකම් ගැන නොතකා සලකා බලනු ලැබේ.

5. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි යන මේවාට සහ රජය විසින් කලින් කල නිකුත් කරන සෙසු නියෝග හෝ රෙගුලාසි වල වද යටත්වනු ඇත.

6. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකයක් හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන සහතිකය හෝ බාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් සනාථ කරන සහතික.

(ඇ) සේවය, පළපුරුද්ද ආදිය සනාථ කරන සහතික.

7. ආණ්ඩුවේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදුව නියමිත දිනට පසුව මේ කාර්යාල යට ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් එම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනට පෙර ලැබී තිබුනේ නම් සහ ප්‍රමාදයට සැලකිය යුතු හේතු දක්වමින් ඒවා පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කළහොත් පමණකි, ඒවා පිළිගනු ලබන්නේ.

8. ඉල්ලුම් පත්‍ර සහ එයට අදාල වෙනත් යම් ලියවිලිද මහා මාර්ග අධ්‍යක්ෂ, "ආයතන" ශාඛාවට මිස, දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධ සහ ඊට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

එන්. ජී. වික්‍රමසිංහ,
මහාමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහාමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

### ආදර්ශ ඉල්ලුම්පත්‍ර ෆෝර්මය

**මහා මාර්ග දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

(අ) පෙළපත් නම :————.

(ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය සහ ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

(ආ) 1970 අගෝස්තු 22 වෙනි දිනට වයස :—
අවුරුදු :————. මාස :————.

4. ජාතිය :————.

5. උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ පියාගේ :————.

(ආ) අයදුම්කරුගේ පියපස සීයාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පියපස සීයාගේ පියාගේ :————.

6. දනට යම් තනතුරක් දරන්නේ නම්, එය කුමක්ද යන්න සහ එහි වැටුප් විස්තර දක්වන්න :————.

7. අධ්‍යාපන සුදුසුකම් (සමත් කළ විභාග සඳහන් කරන්න) :————.

8. කාර්මික සුදුසුකම් (සමත් කළ විභාග සඳහන් කරන්න) :————.

9. විදුලි නිර්මාන සහ ස්ථාපන වැඩ ගැන පළපුරුද්ද සහ පත්වීම් ආදිය ගැන විස්තර :————.

මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව සොයා ගනු ලැබුවහොත්, තෝරීමට කලින් මා නුසුදුසු වීමටත්, පත්වීමෙන් පසුව එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත් වන බවද දනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–1120—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## 1971 වර්ෂයේදී රජයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම

පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් ඉල්ලුම් පත්‍ර, පදිංචි ස්ථානයට ඉතාම ආසන්නව පිහිටි රජයේ පාසලේ විදුහල්පති වෙත 1970.9.10 වැනි දිනට පෙර දෙමව්පියන් විසින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුයි. ඉල්ලුම් පත්‍රය පෞද්ගලිකව පාසල් ප්‍රධානියාට බාර දෙනු ලැබුව හොත් එය ලැබුණු බවට ඔහුගෙන් ලියවිල්ලක් ලබා ගත යුතු ය.

2. 1966 ජනවාරි 31 වැනි දින හෝ ඊට කලින් උපන් ළමයින් පමණක් 1971 ජනවාරි මාසයේ දී පාසල්වලට ඇතුළත් කර ගනු ලැබේ.

3. මෙම ළමයින් සඳහා ඇතුළත් කිරීමේ විභාගයක් නො පැවැත් වේ.

4. දෙමාපියන් පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය අනුව ඒ ඒ පාසල්වලට ඇතුළත් කර ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

පී. උඩගම,
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 ජූලි මස 22 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යංශයේ,
මූලික අධ්‍යාපන ශාඛාවේ දී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

————විද්‍යාලයේ පළමු වැනි ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

**ළමයා සම්බන්ධ විස්තර :—**

1. නම :————.

2. ස්ත්‍රී පුරුෂ භාවය :————.

3. ඉගැන්වීමේ මාධ්‍යය :————.

4. උපන් දිනය :—වර්ෂය :————, මාසය :————, දිනය :————.

**දෙමාපියන් සම්බන්ධ විස්තර :—**

| | මව | පියා/නීත්‍යනුකූල භාරකරු |
|---|---|---|
| 5. නම : | ———— | ———— |
| 6. ජාතිය : | ———— | ———— |
| 7. ආගම : | ———— | ———— |
| 8. පදිංචිය : | ———— | ———— |
| අංකය : | ———— | ———— |
| වීදිය : | ———— | ———— |
| නගරය : | ———— | ———— |
| ග්‍රා. සේ. කොට්ඨාශය : | ———— | ———— |
| (24 අංක දරණ සහල් සලාක පොතෙහි සඳහන් පරිදි) | | |
| 9. පදිංචි ස්ථානයේ සිට පාසැලට මාර්ගය ඔස්සේ ඇති සාමාන්‍ය දුර (දම්වැල් වලින්) : | ———— | ———— |
| 10. ඉහත ස්ථානයේ පදිංචියට ආ දිනය : | ———— | ———— |
| 11. දහවැනි ඡේදයේ සඳහන් දිනට පෙර ලිපිනය : | ———— | ———— |

12. පාසලේ සිටින සහෝදර හා/හෝ සහෝදරියන් පිළිබඳ විස්තර :—

| නම | ශ්‍රේණිය |
|---|---|
| ———— | ———— |
| ———— | ———— |

13. ඉල්ලුම්කරු මෙම පාසලේ සේවය කරන්නෙක්ද? එසේ නම් ඔහු—

(ඒ) දරණ තනතුර :————.

(බී) ඊට පත්වූ දිනය :————.

14. ඔබගේ ළමයා මෙම පාසලට ඇතුළත්වීමට නුපුළුවන් වුවහොත් ඔහු ඇතුළත් කිරීමට යෝජනා කරන පාසල් 3 ක් නම් කරන්න. මේ පාසල් ඔබ පදිංචි ස්ථානයේ සිට සාමාන්‍යයෙන් සැතැප්ම 2 ක් ඇතුළත විය යුතුය :—

(1) ————.

(2) ————.

(3) ————.

(ඉහත සඳහන් පාසැල්වලින් එකකට වුවද ඒවායේ ඇබෑර්තු නොමැති නම් ඔබගේ ළමයා ඇතුළත් කිරීමට ප්‍රා.අ.අ./ප්‍ර.අ.නි./ජනතා කමිටුව බැඳී නැති බැව් සැළකිය යුතුය.)

ඉහත සඳහන් විස්තර නිවැරදි බව සහතික කරන අතර, යථෝක්ත ස්ථානයේ පදිංචිය ඔප්පු කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට මා එකඟ වන බවත්, ඉහතින් සඳහන් කරුණු අසත්‍ය බව ඔප්පු වුවහොත්, මගේ ළමයා පාසලෙන් අස් කරගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුව නියම කරන පාසලකට ඔහු/ඇ යැවීමට මා එකඟ වන බවත්, මෙයින් ප්‍රකාශ කරමි.

තවද, මේ ළමයා දැනට රජයේ පාසලකට හෝ අනුමත කළ පාසලකට නොයන බවත්, මම ප්‍රකාශ කරමි.

————,
මවගේ/පියාගේ අත්සන.

දිනය :————.

7–1187—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## රෝහල් ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතික භාෂාවන් හා ගිණුම් පිළිබඳ පරීක්ෂණය—1970 පෙබරවාරි

රෝහල් ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ පහත නම් සඳහන් අයදුම්කරුවන් 1970 පෙබරවාරි මස 20 වැනි දින පවත්වන ලද රෝහල් ලිපිකරු සේවය පිළිබඳ වාර්තාවේ 'ඒ' උපග්‍රන්ථයේ නියම කොට ඇති පරීක්ෂණයේදී ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති විෂයයන්ගෙන් සමත් වී ඇති බැව් පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | සේවය කරන ස්ථානය | විෂය |
|---|---|---|
| ආරියතිලක, කේ. සී. එල්. | රජයේ රෝහල, මීගමුව | සිංහල 'ඒ' සහ 'බී' |
| කතිරවේලුපිල්ලෙයි, එස්. | සමාජ රෝග මර්දන ව්‍යාපාරය, කොළඹ 10 | දෙමළ 'ඒ' සහ 'බී' |
| මැනුයෙල් පිල්ලෙයි, ජී. එස්. | මහ රෝහල, යාපනය... | දෙමළ 'ඒ' සහ 'බී' |
| මුරුගේසුපිල්ලෙයි, පී, ... | ළය රෝහල, කදාන ... | ගිණුම්, දෙමළ 'ඒ' සහ 'බී' |
| පද්මලිංගම්, කේ. ... | මහ රෝහල, රත්නපුරය | දෙමළ 'ඒ' සහ 'බී' |
| පෙරේරා, ඒ. එස්. ... | ළය රෝහල, රාගම ... | සිංහල 'ඒ' සහ 'බී' |
| සිවරත්නම්, පී. ... | මහ රෝහල, යාපනය... | ගිණුම් |
| සුපිරමානියම්, එස්. ... | මහ රෝහල, යාපනය... | ගිණුම් |
| සිරිසේන, ටී. කේ. එස්. ... | මහ රෝහල, කොළඹ... | ගිණුම් |
| වික්‍රමසේකර, ඒ. ... | මහ රෝහල, ගාල්ල ... | ගිණුම් |
| වීරසිංහ, එස්. ... | රජයේ රෝහල, මාතලේ | සිංහල 'ඒ' සහ 'බී' |

ඩී. ඩී. විතානාච්චි,
වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 ජූලි මස 21 වෙනි දින,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
කොළඹ 1.

7–1163—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජකීය ලංකා ගුවන් හමුදාව

රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානය පිහිටි ඉඩමෙහි ඇති කැලෑ බෝගස කපා ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් 1970 අගෝස්තු මස 14 වැනි සිකුරාදා පෙරවරු 10 දක්වා කොළඹ 2 හි, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ, තැ. පෙ. 594, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ.

2. කොළඹ 2 හි, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ප්‍රධාන වැඩ නිලධාරීන්ගෙන් ලබා ගත්තා ආකෘති පත්‍රවල පිටපත් දෙකක් සහිතව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. අවශ්‍ය විස්තර එතුමාගෙන් ලබා ගත හැක. 1970 අගෝස්තු මස 13 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 වනතුරු ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. අත්සන් කර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළයුතු ටෙන්ඩර් සීල් තබා. "රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානය පිහිටි ඉඩමෙහි ඇති කැලෑ බෝගස කපා ඉවත් කිරීම පිළිබඳ ටෙන්ඩර්" යනුවෙන් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරෙහි ලියා, "සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, රාජකීය ලංකා ගුවන් හමුදාව, තැ. පෙ. 594, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

3. ආපසු ලබාගත හැකි රු. 10 ක තැන්පත් ටෙන්ඩර් මුදලක් සඳහා සහ ආපසු ලබා ගත නොහැකි රු. 1 ටෙන්ඩර් ගාස්තුවක් සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල හා ටෙන්ඩර් ගාස්තුව කොළඹ 2 හි, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරී තැනට ගෙවිය යුතුය.

ආර්. ආර්. මාරුප්,
බලගන නායක,
ගුවන් හමුදාධිපති වෙනුවට.

7–1161—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### බේරේ කාර්මික සංවර්ධන අංශයේ ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1970. 8. 14 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1970. 8. 12 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

7–1131—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව—ත්‍රිකුණාමලය

### 1970/71 දෙවන භාගය සඳහා ප්‍රාදේශීය ද්‍රව්‍ය මිලදී ගැනීම

1970/71 වර්ෂයේ දෙවන භාගය සඳහා ගොඩනැගිලි නැනීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් කොට්ඨාශය වෙනුවෙන් මවිසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය—වාන්ඇල, කන්තලේ, අල්ල, මොර වැව, වෙල්පන්කුලම, මංගල වැව සහ ත්‍රිකුණාමලය නගරය.

2. ත්‍රිකුණාමලය ඉ. සං. කාර්යාලයේදී, ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1970 අගෝස්තු මස 18 වන දින පෙ. ව. 10.30 දක්වා 1970/71 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා පහත සඳහන් ගොඩ නැගිලි ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ:—

(1) වියන ලද පොල්අතු ජෝඩු (අඩි 7 ක් දික්වූද, අඟල් 14 ක් පළල් වූද, 1,000ක මිල)
(2) හුනු බුසල් 1ක් (එකක්) රාත්තල් 44කට නොඅඩු බර තිබිය යුතුය
(3) තම්බපු හුනු බුසල් 1ක් (එකක්)
(4) කලු ගල් 6"×9" කියුබ් වලින්
(5) තලාපු කලු ගල් 2" කියුබ් වලින්
(6) තලාපු කලු ගල් 1½" කියුබ් වලින්
(7) තලාපු කලු ගල් ¾" කියුබ් වලින්
(8) තලාපු කලු ගල් 1" කියුබ් වලින්
(9) තලාපු කලු ගල් ½" කියුබ් වලින්
(10) පිලිස්සූ ගඩොල් 1000 (4½"×2¾"×8½")
(11) ගඟවැලි කියුබ් වලින්

3. ඉහතින් දක්වෙන ද්‍රව්‍යයන් ගෙන් අංක 4 සිට 9 දක්වා දක්වෙන ද්‍රව්‍යයන් සඳහා පහත දක්වෙන ක්‍රමයට මිල ගණන් දැක්විය යුතුය:—

(i) ගල්වල ළඟදී අට්ටි ගසා කියුබ් ගණනින් භාරදීමට—
(අ) දුපුරත ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.
(ආ) දුපුරත ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින්ම සපයා.

(ii) ගල්වල සිට වැඩපළට කොන්ත්‍රාත්කරුගේ වාහන වලින් ප්‍රවාහනය කර වැඩපොළේදී අට්ටි ගසා භාරදීමට—
(අ) පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයා.
(ආ) පුපුරන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින්ම සපයා.

4. ඉහතින් දක්වෙන අංක 1. 2. 3, 10 සහ 11 දක්වෙන ද්‍රව්‍යයන් වෙනුවෙන් පහත දක්වෙන පරිදි මිළ ගණන් දැක්විය යුතුයි:—

(අ) ලොරි ගමන් කළ හැකි ස්ථානයක පිහිටා තිබේනම් පෝරනුව/ගොඩගමන ස්ථානය අසලදීම භාරදීමට.
(ආ) වැඩ අංශයට ගෙනැවිත් භාරදීමට.

5. පොල්අතු සහ හුනු සැපයීම සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් එක් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50ක් (පනහක්) බැගින්ද, පොල්අතු සහ හුනු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රුපියල් 50 (පනහ) බැගින්ද තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම් පත් ලබාගත හැක. සියලුම තැන්පත් මුදල් මගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකි අතර එම රිසිට් පත් ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැක. ටෙන්ඩර් පත් ලබා ගැනීමට හැකි අවසාන දිනය 1970 අගෝස්තු 17 වැනි දින දවල් 11 තෙක් පමණක් බව සලකන්න.

6. සෑම ටෙන්ඩර් අයදුම් කරුවෙකුම ඔහුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. හුනු සහ පොල් අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍ය වෙනුවෙන් සෑම ව්‍යාපාරය කටම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු අතර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. කවර යෙහි වම් පස උඩ කෙළවරෙහි "ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර් පත් කවරයක බහා සීල් තබා ඉදිරිපත් කළ යුතුයි:—

"ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන නිලධාරි,
ඉඩම් සංවර්ධන කාර්යාලයය,
ත්‍රිකුණාමලය."

නැතහොත් ත්‍රිකුණාමලය ඉඩම් සංවර්ධන කාර්යාලයයෙහි ඒ සඳහා තබන කරන ලද ටෙන්ඩර් තැන්පත් පෙට්ටියෙහි තැන්පත් කළ හැකි ය.

7. 1970 අගෝස්තු මස 18 වෙනි දින පෙරවරු 11ට ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් එම කාර්යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී යෝග්‍යයයි සිතේ නම් ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැකිය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ට ඒ බව දැන්වූ විට සති දෙකක් ඇතුළත ද්‍රව්‍ය භාර දීමට හැකි විය යුතුයි. එසේ කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් කඩකළ කොන්ත්‍රාත් කරුවකු සේ සලකා ඒ අනුව කටයුතු කරනවා ඇත.

9. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයක කොටසක් භාර ගැනීම හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

ව්. කනගලිංගම්,
ඉඩම් සංවර්ධන නිලධාරී,
ත්‍රිකුණාමලය.

1970 ජුලි මස 21 දින,
ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන කාර්යාලයේ දීය,

7–1140—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

කොළඹ 10යේ, ඕල්කොට් මාවතේ, තැ. පෙ. අංක 355, දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයයේ, දුම්රිය මූලස්ථානයේ "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් අඟල් 1½ කොරල්ගල් කියුබ් දෙදහස් (2,000) කොන්ඩාවිල් හිදී සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 අගෝස්තු 26 වැනි දින බදාදා පෙරවරු 11 දක්වා භාර ගනු ලැබේ. පසු දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණිය හැක.

2. කොළඹ, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. අංක 370) මේ සඳහා පෝර්ම කොළ ලබා ගෙන සම්පූර්ණ කර අනු පිටපතක් සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරී තැනගෙන් ලබා ගත හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

1970 අගෝස්තු 12 වෙනි බදාදා පස්වරු 4 දක්වා ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 200 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 10 ක්ද තැන්පත් කර ලබා ගත් රිසිට්පත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේදීය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1970 ජූලි මස 23 වැනි දින,
තැ. පෙ. අංක 370,
කොළඹ දීය.

7–1129—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

කොළඹ 1, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන්හි රඳවා ගනු ලබන අයථා ආගමිකයින්ට 70.1.1 දින සිට 71.9.30 දින දක්වා කාලය තුළ පිසින ලද ආහාර සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

(අ) පොලිස් රඳවා ගැනීමේ කඳවුර—කොම්පඤ් ඥවීදිය,

(ආ) පොලිස් රඳවා ගැනීමේ කඳවුර සහ නිරෝධායන රඳවා ගැනීමේ කඳවුර, තලෙයිමන්නාරම.

2. පිළිවෙලින් පහත සඳහන් කාර්යාලවල හෝ කොළඹ සහ යාපනයෙන් පිටත ඕනෑම කච්චේරියක හෝ රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීමෙන් ලබා ගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970 අගෝස්තු මස 18 දින දහවල් 12 තෙක් පිළිවෙලින් පහත සඳහන් කාර්යාල වලින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක :—

(අ) කොළඹ 1, ඇඩිලන් චතුරශ්‍රයේ, කොළඹ පොලිස් අධිකාරි කාර්යාලය,

(ආ) යාපනය, උතුරු පළාත පොලිස් අධිකාරි කාර්යාලය.

3. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් ආකෘති පත්‍ර (පිටපත් 2 කින් යුතුව) කොළඹ 1, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට 1970 අගෝස්තු මස 19 දින පෙ. ව. 10 ට පෙර ලැබෙන සේ එවිය යුතුය. නැතිනම් ඒවා නියමිත දින නියමිත වේලාවට කලින් පොලිස් මූලස්ථානයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ඒවා නියමිත දින නියමිත වේලාවට කලින් පොලිස් මූලස්ථානයේ පොලිස් අධිකාරිට භාරදී එසේ භාරදුන් බවට ලියවිල්ලක් ලබා ගත යුතුය.

4. 1970 අගෝස්තු මස 19 දින පෙ. ව. 10 ට ඉහත සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

5. වැඩිදුර විස්තර පිළිවෙලින් කොළඹ 1, පොලිස් අධිකාරි කාර්යාලයෙන් සහ යාපනය උතුරු පළාත පොලිස් අධිකාරි කාර්යාලයෙන් ලබා ගත හැක.

පොලිස්පති.

පොලිස් මූලස්ථානය, කොළඹ 1,
1970.7.22.

7–1128—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## 1970-71 මුදල් වර්ෂය තුළ යාපනයේ බන්ධනාගාරයට අලුත් මාලු සහ කරවල සැපයීම (උපලේඛනය-'ඇ')

යාපනයේ බන්ධනාගාරයට 1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා අලුත් මාලු සහ කරවල සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් ('ලාංකික' යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙක් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව" කියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ, කොළඹ බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ඩබ්ලිව්. ජේ. ද සිල්වා මහතාට භාර දී ඔය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "යාපනය බන්ධනාගාරයට අලුත් මාළු සහ කරවල උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය" කියා ලියා මෙහි 8 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 8 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.35ට කොළඹ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩර් පෝරම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්තැනගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත පෝරමයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට (8 වෙනි ඡේදය බලන්න) පෙර දින ප.ව. 3.30 දක්වා පමණි.

6. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

7. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

8. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත් කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හා පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් වීනි නම්, තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධව කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලෙන් රු. 2,500 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවාට සිදුවනවා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, නැති නම් එහි ගෙන ගොස් භාර දුනහොත් එම නිවේදනය ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

යාපනය බන්ධනාගාරය

| | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | |
| උපලේඛනය 'ඇ' | 100 00 | 1,500 00 | 20.8.70 |

9. ඉදිරිපත් කරන මිළ ගණන් ඉලක්කමෙන් මෙන් වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ ම, එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් එම කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට ඔවුන් වෙනුවෙන් ඇප කරුවන් වශයෙන් පෙනී සිටීමට කැමති වගකිව යුතු පුද්ගලයන් දෙදෙනෙකු ගේ නම් ඉදිරිපත් කළ යුතුය.

11. ඒ ඒ කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට සුදුසු ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍ය ය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණය මෙහි 8 වැනි වගන්තියේ සඳහන්ව ඇත. අවශ්‍ය සියලුම විස්තර මෙම දැන්වීමේ 5 වෙනි ඡෙදයේ සඳහන් කාර්‍යාලයෙන් ලබාගත හැක.

12. ඒ ඒ ටෙන්ඩර් සඳහා ඇති සියලුම කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නො ලැබේ.

13. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

14. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ අකුරු බදු වශයෙන් දීම හෝ කළ නො හැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

15. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු තිබේ නම් කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. එවැනි කිසිම කෙනෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවිය යුත්තේ, ලාංකිකයන් පමණකි.

16. මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර් කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තම සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම්, දේපොල ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදයම් පාලකතැන විසින් සහතික කරන ලද රපෝර්තුවක් එවිය යුතු ය. දේපොල විස්තර ද සඳහන් කළ යුතුය.

මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද කොන්ත්‍රාත්තුකරුවකු නිවේදනයේ සඳහන් ටෙන්ඩර් කැඳවනු ලබන කොට්ඨාශයේ හෝ පළාතේ හැර ඉල්ලුම් කරනු ලබන්නේ නම් කුමන කොට්ඨාශයක හෝ කොට්ඨාශවල එම කොන්ත්‍රාත්තු තමා ඉටුකර ඇද්දැයි සඳහන් කළ යුතුය.

17. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. එබඳු නිළධාරියකු ගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිළධාරියා ද ඔහුගෙන් පසුව එම පදවිය දරන්නා වූ නිළධාරියා ද වේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1970 ජූලි මස 23 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

7-1130—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

අංකය : එල්. එම්. 1505 (2).

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1970 අගෝස්තු මස 28 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| 1. රෝසාවත්ත එළුගල්ල ජනපද පාර 1 සැතපුම ... | ... රු. 15,000.00 |
| 2. කළුදැල්ල මහපතන තරුණ ගොවි ජනපදයේ බිම් කට්ටි 71 සිට අඩි 10 ක පළල පාරක් තැනීම | ... රු. 30,000.00 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාමසංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිතිවලට සහ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 70.8.24 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝරම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයින් විසින් මහනුවර කච්චේරියේ තමන් විසින් කරන වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිති ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය. චෙක්පත්, මුදල් ඇණවුම් සහ තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝරම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් යැවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ වම් උඩ කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝරම තැපෑලෙන් නොඑවන්නේ නම් ගාළු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1970 අගෝස්තු මස 28 වැනි දින ප. ව. 2.30 ට ඉහතකී 357 දරන කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශය සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත් කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩුදෙන්වා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන නිල ධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇති නිශ්චිත ලියවිල්ල කින් එකී නිලධාරියා අනුමත කරන ලද ලාංකික නොවන කම්කරු වන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත් කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා 'ලාංකික' යන්නෙන් පරම් පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැන්නෙකු එකී පාඨයට ඇතුළත් වේ.

මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීම සඳහා සෑම කොට්ඨාශයක වම සාධාරණ වූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින්පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත් කරු එකඟ විය යුතුයි. කොන්ත්‍රාත් කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලබන කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටි පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විධිමත් පරිදි බලය දෙනු ලැබූ නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටී.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් විස්තර ඉල්ලුම් කළ විට මහනුවර දිසාපතිගෙන් ලබාගත හැකිය.

ඇම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

70.7.21 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

7-1180—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## 1970–71 මුදල් වර්ෂය තුල වැලිකඩ බන්ධනාගාරීය අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන මවිසින් වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1970–71 මුදල් වර්ෂය තුලදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර්, 1970 අගෝස්තු මස 25 වැනි දින පෙරවරු 10.30 දක්වා බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පිලිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතුය යි තීරණය කර ඇත :—

| සැපයුම් | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. | ඇප තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) මී හරක් හම් | 20 | 0 | 200 | 0 |
| (ආ) එළ හරක් හම් | 20 | 0 | 300 | 0 |
| (ඇ) ඔපකල රතු හම් | 20 | 0 | 200 | 0 |
| (ඈ) ඔපකල කළු හම් | 20 | 0 | 300 | 0 |
| (ඉ) එළු හම් | 20 | 0 | 300 | 0 |
| (ඊ) රබර් පතුල් සහ රබර් විලුම් | 20 | 0 | 300 | 0 |
| (උ) මුස්න මිටි | 20 | 0 | 200 | 0 |
| (ඌ) පිරිසිදු ඉරටු | 20 | 0 | 200 | 0 |
| (එ) ගල්ලැහැ පන් | 20 | 0 | 300 | 0 |
| (ඒ) පීරපු කොහු | 20 | 0 | 200 | 0 |
| (ඔ) ගුදිරි කොහු | 20 | 0 | 200 | 0 |
| (ඕ) මාදම්පා වේවැල් | 20 | 0 | 300 | 0 |
| (ක) පොල්කටු අඟුරු | 20 | 0 | 200 | 0 |
| (ඛ) බේකරි මුහුන් | 20 | 0 | 200 | 0 |

4. **විශේෂ විස්තර.**—මෙම ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරයට ගෙනවිත් බාරදිය යුතුයි.

(අ) පාවහන් සෑදීම සඳහා හොඳින් කෙලින් පදම්කල ඒවා විය යුතුයි.

(ආ) හොඳට වියලුනු, පාවහන් සෑදීම සඳහා හොඳින් කෙලින් පදම්කළ ඒවා විය යුතුයි.

(ඇ) පාවහන් සෑදීම සඳහා " ඒ " වර්ගයට අයත් හිල්, අඩයාලම් ලකුණු ආදියෙන් තොර ක්‍රෝම් වර්ගය විය යුතුයි.

(ඈ) පාවහන් සෑදීම සඳහා " ඒ " වර්ගයට අයත් හිල්, අඩයාලම් ලකුණුවලින් තොර කුනී ක්‍රෝම් වර්ගය විය යුතුයි.

(ඉ) හම් දහයේ (10) මිටියක් සාමාන්‍යයෙන් රාත්තල් පහකට (5) වැඩි නොවිය යුතුයි.

(ඊ) රබර් පතුල්—දිග නොයෙක් ප්‍රමාණයන්ගෙන් විය යුතුයි. රබර් විලුම්—මිම් ප්‍රමාණයන් 2½ " සිට 4 " දක්වා වූ ප්‍රමාණයන්

(උ) දිගින් අඩි පහකට (5) නොඅඩු, මේරූ, සවිමත් කෙලින් ලී විය යුතුයි. දුවට, ඇටවේරියා, කැබල්ල සුදුසුයි. මිටක වට රවුම අඟල් තුනේ (3) සිට 3½ දක්වා විය යුතුයි.

(ඌ) අඩි තුනක් (3) දිග මේරූ, වියලි පොල් කොල සූරා පිරිසිදු කරන ලද ඒවා විය යුතුයි.

(එ) දිගින් අඩි තුනහමාරකට (3½) නොඅඩු පැදුරු විවීම සඳහා සුදුසු මහත ඒවා විය යුතුයි.

(ඒ) ඉතා හොඳට තෙලද ලද වියලි, මුස්න සහ බුරුසු සෑදීමට සුදුසු ඒවා විය යුතුයි.

(ඔ) හින් කෙඳි සහිත, කොහු බත් නොමැති ගුදිරි සෑදීමට සුදුසු නො. 1කේ ඒවා විය යුතුයි.

(ඕ) වේවැල්, ඇඳ පුටු විවීමට සහ කූඩා සෑදීමට මෝරාපු ඒවා විය යුතුයි. දිගින් අඩි හතකට (7) නොඅඩු විය යුතුයි. වට ප්‍රමාණය අඟල් බාගයේ (½) සිට අඟල් 1½ වැඩි නොවිය යුතුයි.

(ක) මඳ පවනට දවුණු, දූවිලිවලින් තොර ඒවා විය යුතුයි. ප්‍රමාණය ඉක්මවා පිළිස්සී ඇති පොල්කටු අඟුරු සහ හතරෙන් අඟල් බාගයකට (½) අඩු කැලි බාරගනු නොලැබේ. දූවිල්ල සඳහා 5% සිට බර ප්‍රමාණයන් අඩු කරනු ලැබේ.

(ඛ) සීල් කොට ඇසුරූ ටින් විය යුතුයි.

5. ඉහත 3 වැනි ඡේදයේ දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.



6. ඉහත නම් කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරනවිට ඒවායේ නම සහ ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්‍යාලයේ තැන්පත් කළ යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත. රබර් පතුල් සහ විලුම් සැපයීමේදී ලංකා විද්‍යාත්මක හා පර්යේෂණ ආයතන මගින් පනවා ඇති නියමිත ද්‍රව්‍ය ප්‍රමාණයන්ට අනුකූලව එම රබර් පතුල් සහ විලුම් සාද තිබිය යුතු බවට එම ආයතනයේ අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් සහතිකයක් සමග ආදර්ශක ඉදිරිපත් කල යුතුයි. එම ආදර්ශකවල ලං. වි. හා ප. ආයතනයේ මුද්‍රාවද වැදී තිබිය යුතුය.

7. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතන.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ග්‍රාම සංවර්ධන සමිති.

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

8. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ, ඒ සඳහා නියමිත පෝර්මයන් මගින් පමණකී. එය ලබාගත හැක්කේ 1970 අගෝස්තු 24 වැනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කර ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත් මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්‍යාලයේදීත් කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කල හැකි බවත් සලකනු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රයක් සීල් තැබූ කවරයන්හි බහා එහි වම්පස කෙලවරේ " ........................... සැපයීම සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කොට ලියා පදිංචිකල තැපැලෙන් එවීම හෝ පහත අත්සන් කරන ලද අයගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළහැක.

10. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම්වලින් දක්විය යුතුයි. එසේ අකුරෙන් සහ ඉලක්කම්වලින් සඳහන් නොකල ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයක් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කලහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන් යොද සැබෑ බවට සහතික කළ යුතුයි.

11. වර්ෂ 1970 අගෝස්තු මස 25 දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාලසීමාව තුල අවශ්‍ය සැපයීම කිරීමට නොහැකි වූවහොත් එම කාලසීමාව සැපයීම ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුවනට සැපයීමට නොහැකිවන සැපයීම කොන්ත්‍රාත්කරුගේ වියදමෙන් වෙනත් මාර්ගවලින් ලබා ගැනීමේ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරි සතුවේ.

13. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කරන ලද කාර්ය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩර්යක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමට හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවකදී නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරි වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබාගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් අතුලත දී බන්ධනාගාර කර්මාන්ත අධිකාරි සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුයි. එම කාලසීමාව තුලදී කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත්වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැරහැර ගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමවලියෙහි ඇතුලත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැනගැනීමට අවැසි නම්, පහත අත්සන් කරන අයගෙන් ලබා ගැනීමට පුළුවන.

ඩබ්. ජේ. ද සිල්වා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරි වෙනුවට.

බන්ධනාගාර කර්මාන්ත අංශය,
වැලිකඩ බන්ධනාගාරය, කොළඹ 9,
1970, ජූලි මස 20 වැනි දින.

7–1079/1—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### කොච්චිකඩේ අතුරු මඩුවේ පිහිටි අංක 1 දරණ තේ කඩය

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත තේ කඩය බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1970. 8. 14 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබගාත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1970. 8. 12 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

7–1139—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව—1970/71 මුදල් වර්ෂය තුළ ටයර් සහ ටියුබ් සැපයීම

මෝටර් රථ, මොටර් බයිසිකල්, මෝටර් ට්‍රක්ස්, සහ ලොරි, ට්‍රැක්ටර්ස්, ට්‍රේලර්ස්, ඩම්පර්ස්, අර්ත්මූවර්ස්, සතුන් බැඳි වාහන, ගුවන් යානා යනාදිය සඳහා ටයර් සහ ටියුබ් ආනයනය කරන වෙළඳ ආයතනවලින්, තමන් ගබඩාකර ඇති තොග වලින් සැපයිය හැකි ටයර් සහ ටියුබ් සඳහා අඩුත්ම ශුද්ධ මිළ ගණන් දක්වෙන ලැයිස්තු, පහත දක්වෙන ආකාරයට පිටපත් දෙකකින් යුතුව සම්පූර්ණ විස්තර සමග ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලනු ලැබේ.

(අ) නිතිපතා ආනයනය කොට ගබඩා කර තබා ගන්නා වූ ප්‍රමාණයන්.

(ආ) රජයේ ගබඩා ඇණවුම් අනුව තොගවලින් සැපයීමේදී අයකරන ශුද්ධ මිළ ගණන්.

2. රේගු බදු රහිතව ආනයනය කොට සැපයීම සඳහා අය කරන්නා වූ මිළ ගණන් සහිත විස්තරාත්මක ලැයිස්තු පිටපත් දෙකකින් යුතුව, පහත දක්වෙන අයුරින් ඉදිරිපත් කරන ලෙස ආනයනය කරන්නවුන්ගෙන් ඉල්ලනු ලැබේ.

(අ) රේගු බදු රහිතව ආනයනය කර සැපයීමට හැකි ප්‍රමාණයන්.

(ආ) රේගු බදු රහිතව අනෙකුත් සියලුම අය කිරීම් සහිත ශුද්ධ මිළ ගණන්.

(ඇ) සෑම ටයරයක් සහ ටියුබයක් වෙනුවෙන් අවශ්‍ය විදේශ විනිමය සහ දේශීය මුදලින් වටිනාකම.

(ඈ) රජයේ ඇණවුම් යටතේ, රේගු බදු රහිතව ආනයනය කර සැපයීමට ගතවන කාලය.

3. රජයේ දෙපාර්තමේන්තුවලට අවුරුදුපතා අවශ්‍ය වන නා නා ප්‍රමාණවල ටයර් සහ ටියුබ් පිළිබඳ ඇස්තමේන්තුව, ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා ඇතුළත් කර ඇත. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී, මෙම ප්‍රමාණවලට පමණක් සීමා නොකොට, පළමුවැනි සහ දෙවැනි ඡෙදවල ඇති ආකාරයට තමන් සාමාන්‍යයෙන් ආනයනය කරන්නා වූ, සියලුම ප්‍රමාණවල ටයර් සහ ටියුබ් සඳහා මිළ ගණන් ඉදිරිපත් කරන ලෙස ටෙන්ඩර්කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ. මෙම ලැයිස්තුවේ දක්වෙන ප්‍රමාණය සාමාන්‍යයෙන් ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය වන අතර, ඒ සියල්ලම හෝ ඉන් කොටසක්, හෝ, මුළු තොගයම එකවර හෝ ඇණවුම් කරන්නේය යන්න ගැන පොරොන්දු විය නොහැකි බව කරුණාවෙන් සළකන්න. ඒ ඒ ප්‍රමාණය යටතේ සඳහන් කර ඇති ගණනට වඩා හෝ අඩුව හෝ ඇණවුම් කළද, ඒ සියල්ලම ඉදිරිපත් කර ඇති මිළ ගණන් අනුව සැපයිය යුතුය.

4. ඉදිරිපත් කරන්නා වූ රේගු බදු රහිත මිළ ගණන් කොළඹ නාගරික සීමා ඇතුළත ගෙනැවිත් භාරදීමට හා කොළඹින් බැහැර යැවීමේදී, ආසන්න දුම්රිය පොළට හෝ දුම්රිය බඩු ගබඩාවට ගෙන ගොස් භාරදීමට වැය වන්නා වූ ගාස්තුද ඇතුළත් විය යුතුය.

5. ගබඩා කර ඇති තොගවලින් සැපයීමේදී සහ රේගු බදු රහිතව ගෙන්වා සැපයීමේදී, කොළඹින් බැහැර ස්ථානවලට යවන විට දුම්රිය ගාස්තු තමන් දරන්නේද යන වග පැහැදිළි ලෙස දක්විය යුතුය.

6. සපයන සෑම ටයරයකම අනුක්‍රමික අංකයක් තිබිය යුතුය.

7. ළඟ ඇති තොගවලින් මිළයට ගනු ලබන්නේ හදිසියෙන් හා වහාම අවශ්‍ය වන ප්‍රමාණයන් පමණකි. එසේ මිළයට ගනු ලබන්නේ, සාර්ථක ටෙන්ඩර්කරුවන් ළඟ ඇති, විදේශ විනිමය සහතික පත්‍ර ක්‍රමය යටතේ ආනයනය කර තිබෙන තොගවලින්ය. රේගු බදු රහිතව ආනයනය කර සැපයීම සඳහා ඇණවුම් කරන (සාමාන්‍යයෙන් තොග වශයෙන්) ටයර් හා ටියුබ් සඳහා අවශ්‍ය විදේශ විනිමය මෙම දෙපාර්තමේන්තුවෙන් මුද හරිනු ලැබේ. විදේශ විනිමය සහතික පත්‍ර ක්‍රමය මීට අදාළ නැත. මෙසේ කරන ලද ආනයනයන් සඳහා ආනයනය බලපත්‍ර රජයෙන් ලබා දෙන බවත් ඒ නිසා ආනයන බලපත්‍ර ගාස්තුවක් අය නොවන බවත් සැළකිය යුතුය.

8. ශුද්ධ ලැයිස්තු මිළ ගණන් සහ අනිකුත් විස්තර පිටපත් දෙක බැගින් සකස් කර ගෝල්ෆේස් කොට් 2 කේ කොළඹ 3, තට්ටු ගෙවල් අංක 53, අංක (560 දරණ තැපැල් පෙට්ටිය යටතේ, කොළඹ 3,) විදේශීය හා දේශීය වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත 1970 සැප්තැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්ද පෙරවරු 9.30 ට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය. මිළ ගණන්, බහා එවන කවරයේ " ටයර් සහ ටියුබ් සැපයීම සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කළ යුතුය.

1970 ජූලි මස 31 දින,
කොළඹ දීය.

ආර්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

### උපලේඛනය

### 1970–71 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ටයර් සහ ටියුබ් පිළිබඳ අවශ්‍යතාවයන්

### ESTIMATED ANNUAL REQUIREMENTS OF TYRES AND TUBES FOR THE FINANCIAL YEAR, 1969–70

| කාර් වැන් | තිරු ගණන් | ටයර් | | ටියුබ් |
|---|---|---|---|---|
| *Passenger Cars : Sizes* | *Ply Rating* | *Tyres* | *Tubeless Tyres* | *Tubes* |
| 5.20 × 12 | 4 ply | 50 | — | 50 |
| 5.50 × 12 | 4 ply | 50 | — | 50 |
| 6.40 × 13 | 4 ply | 300 | — | 300 |
| 6.40 × 13 | 6 ply | 50 | — | — |
| 6.50 × 13 | 4 ply | 50 | — | 50 |
| 6.70 × 13 | 4 ply | 25 | — | 100 |
| 6.70 × 13 | 6 ply | 75 | — | — |
| 7.00 × 13 | 4 ply | 10 | — | 10 |
| 7.25 × 13 | 4 ply | 15 | — | 10 |
| 5.90 × 14 | 4 ply | 110 | — | 75 |
| 6.40 × 14 | 4 ply | 150 | — | 100 |
| 7.00 × 14 | 4 ply | 250 | — | 250 |
| 7.00 × 14 | 6 ply | 175 | — | — |
| 7.50 × 14 | 4 ply | 25 | — | 50 |
| 7.50 × 14 | 6 ply | 25 | — | — |
| 5.00 × 15 | 4 ply | 15 | — | 15 |

| කාර්, වෑන් *Passenger Cars* | තීරු ගණන *Ply Rating* | ටයර් *Tyres* | *Tubeless Tyres* | ටියුබ් *Tubes* |
|---|---|---|---|---|
| 5.90×15 | 4 ply | 30 | — | 100 |
| 5.90×15 | 6 ply | 50 | — | — |
| 6.40×15 | 4 ply | 50 | — | 350 |
| 6.40×15 | 6 ply | 300 | — | — |
| 6.70×15 | 4 ply | 100 | — | 250 |
| 6.70×15 | 6 ply | 150 | — | — |
| 7.10×15 | 6 ply | 30 | — | 30 |
| 7.60×15 | 6 ply | 175 | — | 50 |
| 5.25×16 | 4 ply | 50 | — | 50 |
| 6.00×16 | 4 ply | 150 | — | — |
| 6.50×16 | 6 ply | 25 | — | 25 |
| 4.50×17 | 4 ply | 5 | — | 5 |
| 5.00×17 | 4 ply | 5 | — | 5 |
| 5.50×17 | 4 ply | 15 | — | 15 |
| 5.20×10 | 4 ply | 250 | — | 250 |
| මෝටර් බයිසිකල් ස්කූටර්ස් *Motor Cycles, Scooters and Mopeds:* | | | | |
| 3.00×16 | 4 ply | 25 | — | 25 |
| 3.25×16 | 4 ply | 150 | — | 150 |
| 3.25×17 | 4 ply | 200 | — | 200 |
| 3.50×17 | 4 ply | 250 | — | 250 |
| 3.00×18 | 4 ply | 30 | — | 30 |
| 2.75×19 | 4 ply | 60 | — | 60 |
| 3.00×19 | 4 ply | 10 | — | 10 |
| 3.25×19 | 4 ply | 500 | — | 500 |
| 3.50×19 | 4 ply | 300 | — | 300 |
| 3.50× 8 | 4 ply | 25 | — | 25 |
| 4.00× 8 | 4 ply | 50 | — | 50 |
| ලයිට් ට්‍රක්ස් *Light Trucks* | | | | |
| 7.00×15 | 6 ply | 600 | — | 650 |
| 7.00×15 | 8 ply | 50 | — | — |
| 7.50×15 | 10 ply | 125 | — | 150 |
| 6.00×16 | 6 ply | 500 | — | — |
| 6.50×16 | 6 ply | 100 | — | 150 |
| 6.50×16 | 8 ply | 30 | — | — |
| 7.00×16 | 4 ply | 10 | — | 260 |
| 7.00×16 | 6 ply | 250 | — | — |
| 7.00×16 | 8 ply | 150 | — | 150 |
| 7.50×16 | 6 ply | 500 | — | — |
| 7.50×16 | 8 ply | 300 | — | — |
| 7.50×16 | 10 ply | 50 | — | — |
| ජීප්ස් *Jeeps :* | | | | |
| 7.00×15 | 6 ply | 300 | — | 300 |
| 6.00×16 | 6 ply Track Grip | 5,000 | — | — |
| 6.00×16 | 6 ply Double purpose | 500 | — | — |
| 7.00×16 | 6 ply | 400 | — | 400 |
| 7.50×16 | 6 ply | 700 | — | — |
| ට්‍රක්ස් *Trucks :* | | | | |
| 8.25×16 | 8 ply | 5 | — | 5 |
| 10.50×13 | 10 ply | 50 | — | 50 |
| 9.00×16 | 10 ply | 200 | — | 200 |
| 10.50×16 | 12 ply | 50 | — | 50 |
| 7.00×17 | 8 ply | 5 | — | 5 |
| 7.50×17 | 8 ply | 15 | — | 75 |
| 7.50×17 | 10 ply | 50 | — | — |
| 8.25×17 | 14 ply | 25 | — | 25 |
| 6.00×20 | 8 ply | 10 | — | 10 |
| 6.50×20 | 8 ply | 300 | — | 300 |
| 7.00×20 | 10 ply | 1,500 | — | — |
| 7.00×20 | 12 ply | 25 | — | — |
| 7.50×20 | 10 ply Traction Lug. | 25 | — | — |
| 7.50×20 | 12 ply | 750 | — | — |
| 7.50×20 | 12 ply Traction Lug. | 750 | — | — |
| 8.25×20 | 10 ply Traction Lug. | 50 | — | 1,000 |
| 8.25×20 | 12 ply Traction Lug. | 500 | — | — |
| 10.00×20 | 12 ply | 150 | — | 300 |
| 10.00×20 | 14 ply | 150 | — | — |
| 12.00×20 | 14 ply | 50 | — | 50 |
| 14.00×20 | 12 ply | 25 | — | 25 |
| 9.00×24 | 10 ply | 5 | — | 5 |
| 11.00×24 | 14 ply | 10 | — | 25 |
| 18. 7×7 | 6 ply | 5 | — | 5 |
| 7 × 9 | 10 ply | 5 | — | 5 |
| 600. × 9 | 6 ply | 15 | — | 15 |
| 25 × 6 | 8 ply | 10 | — | 15 |
| 25 × 6 | 12 ply | 5 | — | — |
| 27 × 6 | 12 ply | 25 | — | 25 |
| ට්‍රැක්ටර් *Tractors* | | | | |
| 4.00×19 | 4 ply | 500 | — | 500 |
| 6.00×16 | 6 ply | 300 | — | — |
| 6.00×19 | 4 ply | 50 | — | 150 |
| 6.00×19 | 6 ply | 75 | — | — |
| 10 ×28 | 4 ply | 50 | — | 50 |
| 11 ×28 | 4 ply | 100 | — | 150 |
| 11 ×28 | 6 ply | 50 | — | — |
| 11 ×36 | 4 ply | 100 | — | 100 |
| 11 ×36 | 6 ply | 125 | — | 125 |
| 13.50×32 | 6 ply | 40 | — | 40 |
| 7.50×16 Trailer | 8 ply | 50 | — | 50 |

| Sizes | තීරු ගණන Ply Rating | ටයර් Tyres | Tubeless Tyres | ටියුබ් Tubes |
|---|---|---|---|---|
| අර්ත් මුවර්ස්, ඩම්පර්ස්, ග්‍රෙඩර්ස්, *Earthmover, Dumper and Grader* | | | | |
| 8.25 × 18 | 8 ply | 10 | — | 10 |
| 10.00 × 24 | 14 ply | 30 | — | 30 |
| 12.00 × 24 | 16 ply | 5 | — | 5 |
| 13.00 × 24 | 8 ply | 10 | — | 25 |
| 13.00 × 24 | 12 ply | 15 | — | — |
| 14.00 × 24 | 14 ply | 20 | — | 60 |
| 14.00 × 24 | 16 ply | 30 | — | — |
| 14.00 × 24 | 20 ply | 5 | — | — |
| 18.00 × 24 | 16 ply | 5 | — | 5 |
| 21.00 × 24 | 20 ply | 10 | — | 10 |
| 18.00 × 25 | 24 ply | 5 | — | 25 |
| 21.00 × 25 | 24 ply | 10 | — | 10 |
| 24.00 × 25 | 28 ply | 10 | — | 10 |
| 16.00 × 25 | 24 ply | 5 | — | 5 |
| 29. 5 × 25 | 28 ply | 10 | — | 10 |
| 26. 5 × 25 | 20 ply | 5 | — | 5 |
| 7.50 × 24 | 10 ply | 5 | — | 5 |

7-1148—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## යාපනය දිස්ත්‍රික්කයේ කරාච්චි ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ තිරුවෛයාරු තරුණ ගොවිපලට යන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය සෑදීම

අංක 14,913 හා 70.7.2 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකර ඇති ඉහත සඳහන් වැඩ සඳහා වූ ටෙන්ඩර් භාරගන්නා දිනය 70.8.11 වැනි දින ප. ව. 2.30 දක්වා දීර්ඝ කර ඇති බව සටහන් කර ගන්න.

කේ. පොන්නම්පලම්,
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

7-1124—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## කොළඹ නව මැගසින් බන්ධනාගාරයට අයත් හිස් ගෝනි පරණ ප්‍රවෘත්ති පත්‍ර, හිස් බෝතල් යනාදිය විකිණීම, 1969-70

කොළඹ 9, නව මැගසින් බන්ධනාගාර සහකාර අධිකාරි විසින් පහත සඳහන් ද්‍රව්‍යයන් විකිණීම සඳහා 1970 අගෝස්තු මස 28 වැනි දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ:—

(1) හිස් ගෝනි 650.

(2) පරණ ප්‍රවෘත්ති පත්‍ර රා. 470.

(3) හිස් බෝතල් 340.

(4) හිස් තේ පෙට්ටි 8.

2. ටෙන්ඩර් පත් පිළිගනු ලබන්නේ ලාංකිකයින්ගෙන් පමණකි. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහාම නියමිත ෆෝර්මයක් මගින් පමණක් බවත්, එය ලබා ගත හැක්කේ 1970 අගෝස්තු මස 27 වැනි දින පස්වරු 2 දක්වා පමණක් බවත්, ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 10ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත්. එම ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම කච්චේරියකදී හෝ මෙම කායඹාලයේ දීත් තැන්පත් කළ හැකි බවත්, මින් දන්වනු ලැබේ. තවද එම කුවිතාන්සි මෙම කායඹාලය වෙත ඉදිරිපත් කිරීමේදී එකී ද්‍රව්‍ය පරීක්ෂා කළ හැක.

3. ටෙන්ඩර් කරුවන් විසින් ද්‍රව්‍ය සියල්ලක්ම වෙනුවෙන් ඒකාබද්ධ මිලක් සඳහන් කළ යුතුයි. වැඩිම මිලට ද්‍රව්‍ය සියල්ලක්ම දෙනු ලැබේ. ටෙන්ඩර්පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචි කල තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කල හැක. සෑම ලියුම් කවරයකම වම්පස ඉහළ කෙළවරේ "හිස් ගෝනි යනාදිය සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කල යුතුයි. ටෙන්ඩර් කරුවන් විසින් යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුයි.

4. 1970 අගෝස්තු මස 28 වැනි දින පෙරවරු 10.35 ට පහත අත්සන් කරන ලද මගේ කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන් විසින් අනුමත කරන නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී, ඉදිරිපත් විය හැක.

5. යම් ටෙන්ඩරයක් භාරගත් බව ලිපියකින් දන්වා දින හතක් (7) ඇතුළතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකි වීනම් හෝ ඉවත් කර ගැනීමේ කායඹ පැහැර හැරියේ නම් ටෙන්ඩර්පත් වෙනුවෙන් තැන්පත් කල මුදල් රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ නාමාවලියට ඇතුළත් කරනු ලැබේ.

6. තවත් වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ඒවා ලබාගත හැක.

පී. ඩබ්ලිව්. පෙරේරා,
සහකාර බන්ධනාගාර අධිකාරී.

1970 ජූලි මස 20 වැනි දින,
කොළඹ, නව මැගසින් බන්ධනාගාරයේ දී ය.

7-1080—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ අනුරාධපුර උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා, අනුරාධපුර උතුරු මැද පළාතේ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, 1970 අගෝස්තු මස 18 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකැරේ:—

| අංකය | වැඩ විස්තරය | ලියාපදිංචි කළ මුදල රු. | ටෙන්ඩර් ඇප මුදල රු. |
|---|---|---|---|
| 1 ... | මහවිලච්චිය ව්‍යාපාරයේ, දකුණු ඉවුරු ඇලේ සිට වම් ඉවුරු ඇලට ළඟා වීමට ඇති පාරට ගල් අල්ලා තාර දැමීම. සැ. 0 ද. 0—සැ. 0 ද. 26.40 | 36,000 ... | 50 |
| 2 ... | මහවිලච්චිය ව්‍යාපාරයේ, දකුණු ඉවුරු ඇලේ සිට වම් ඉවුරු ඇලට ළඟා වීමට ඇති පාරට ගල් අල්ලා තාර දැමීම. ද. 26.40–සැ. 1 ... | 36,000 ... | 50 |
| 3. ... | මහවිලච්චිය ව්‍යාපාරයේ, දකුණු ඉවුරු ඇලේ සිට වම් ඉවුරු ඇලට ළඟා වීමට ඇති පාරට ගල් අල්ලා තාර දැමීම. සැ. 1 ද. 0–සැ. 1 ද. 26.40 ... | 36,000 ... | 50 |
| 4 ... | මහවිලච්චිය ව්‍යාපාරයේ, ලුනුඔය හරහා අඩි 4ක් පළල, අඩි 100ක් දිග, ස්පෑන් 3ක් සහිත ශක්තිමත් කොන්ක්‍රීට් පාලමක් සෑදීම ... | 32,000 ... | 50 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට, සමුපකාර සමිතිවලට හා ග්‍රාමසංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970 අගෝස්තු මස 14 වෙනි දින දහවල් 12 දක්වා කායඞාල වේලාවන් තුළදී අනුරාධපුර/මහකනදරාව/පදවිය/රාජාංගනය සහ වාරිමාර්ග කායඞාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් අයදුම්පත්වල පමණක් ටෙන්ඩර් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩ සඳහා ඉහත සඳහන් ටෙන්ඩර් ඇප මුදල් ඉහත සඳහන් කායඞාල වල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය සඳහා සියළුම විස්තර, සැලසුම් ආදිය කායඞාල වේලාවන් තුළදී අනුරාධපුර වාරිමාර්ග කායඞාලයෙන් ලබාගත හැක.

ඩබලිව්. එස්. සහාරත්නම,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අනුරාධපුර උප කොටස.

1970 ජූලි මස 20 වෙනි දින,
වාරිමාර්ග කායඞාලය,අනුරාධපුරයේ දීය.

7–1185—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව—මධ්‍යම කොට්ඨාශය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හක්ගල උද්භිද උද්‍යානයේ වීදුරු නිවාසය වැඩිදියුණු කිරීම සඳහාවූ ටැන්ඩර්පත් මහනුවර ගොඩනැගිලි දෙපාතීමේන්තුවේ මධ්‍යම කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු කාර්යාලයෙහි වූ ටැන්ඩර් මංඩලයේ සභාපති තැන විසින් 1970 ක්වූ අගෝස්තු මස 26 වැනි දින පෙ. ව. 10.30 වන තෙක් බාර ගනු ලැබේ.

2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නුවරඑළිය දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) ගෙන් ලබා ගත් ආකෘතිපත්වල ටැන්ඩර්පත් පිළියෙල කර අනුපිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි වන අතර සැලසුම්වල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 13,500 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයාට ටැන්ඩර් තැන්පත් මුදල වන රු. 25.00 තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය 1970 අගෝස්තු මස 14 වැනි දින ප. ව. 4.30 පෙර ඉදිරිපත් කල විට මේ සඳහා ටැන්ඩර්පත් එවීමට සුදුසුසත්වෙනවා ඇත. ටැන්ඩර්පත් ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10.00 බැගින්වූ ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරියාට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුය.

4. ටැන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ වාතීා පොත හෝ ඔහු වෙත නිකුත් කර ඇති පිරික්සුම් ලිපිය හෝ ඉදිරිපත් කළ යුතුය.

5. ටැන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාත්මේන්තුවේ ප්‍රධාන කායඞාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

6. ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත්කරුවන් විසින් ටැන්ඩර් තැන්පත් කළ කුවිතාන්සිය ඉදිරිපත් කරන විට, තමා දැනට කරගෙන යනු ලබන වැඩ විස්තරය සඳහන් කළ යුතු අදාල පෝර්මය නිකුත් කරන නිලධාරියාගෙන් ලබා ගෙන සියලු වැඩ විස්තර එහි සඳහන් කර නියමිත ටැන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

7. ටැන්ඩර් ලබා ගැනීමට අදහස් කරන අය තම තමන් විසින් දැනට කරගෙන යනු ලබන වැඩවල තත්වය හා ප්‍රගතිය දැක්වෙන ඒ ඒ දිස්ත්‍රික් ඉංජිනේරුගෙන් ලබා ගත් ලිපියක් තමන් වෙත ටැන්ඩර්පත්‍ර නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

සී. යෝගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු (ගොඩනැගිලි).

මහනුවර ගොඩනැගිලි දෙපාතීමේන්තුවේ,
අධිකාරී ඉංජිනේරු කායඞාලයේදීය,
70. 7. 19.

7–1059—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙනිය

### ගන්නෝරුවේ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයට ආදහනාගාරයක ගොඩනැගිල්ලක් ඉදිකිරීම

1. ඉහත සඳහන් ආයතනයට ආදහනාගාරයක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අගෝස්තු මස 18 වෙනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ—5, නාරාහේන්පිට, පිහිටි කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කල යුතුය. ඔහුගෙන් රූප සටහන් විස්තර හා අනිකුත් තොරතුරු ලබා ගත හැකිය.

3. සෑම ටෙන්ඩර් අපේක්ෂකයෙකු විසින් රු. 25,000 කට නොඅඩු මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් ලබා ගැනීම සඳහා ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ ටෙන්ඩර් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල විට 1970.8.14 දින ප. ව. 3 දක්වා ටෙන්ඩර් පත් ලබාගත හැකිය :—

(අ) 3 වෙනි ඡේදයේ සඳහන් අයුරු ලියා පදිංචි වී ඇති බව ඔප්පු කිරීම.

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලට කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ, කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කල යුතුය.

එල්. එස්. එස්. ජයසුන්දර,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ—5,
1970 ජූලි මස 20 වැනි දින දීය,

7–1049—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍යය විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970.8.21 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ :—

කලු ගම්මිරිස් රාත්තල් 2,000 ක් පමණ.

2. කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයෙන් ටෙන්ඩර් අයදුම් පත් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයෙහි (පෝර්ම) ඔබගේ වැඩිම මිළ ගණන සඳහන් කර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා මුද්‍රාකර " ගම්මිරිස් ඇට මිළට ගැනීම " යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කර, සභාපති, කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම විද්‍යාලය, කුණ්ඩසාලේ යන ලිපිනයට ලේඛක ගත තැපැලෙන් එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට නියමිත අවසාන දින දවල් 12 වන තුරු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. එම නිකුත් කිරීම කරනුයේ, එක් ටෙන්ඩර් පෝර්මයක් වෙනුවෙන් රුපියල් 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ කළ හැක.

4. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ එක් නියෝජිතයෙකුට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී එනම්, 1970. 8. 21 වෙනි දින පස්වරු 2.30 ට ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහතකී දිනයේදී ඉහතකී වේලාවේදී කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

5 කොන්දේසි නොමැතිවන අතර, ටෙන්ඩර් ස්ථිර විය යුතුය. ටෙන්ඩර් පත් එවීමට අදහස් කරන්නවුන්ට කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ කළමනාකරු හමුවී කාර්යාල වේලාව තුළ සඳහන් ගම්මිරිස් තොගය පරීක්ෂා කළ හැක.

6. තෝරාගත් ටෙන්ඩර්කරුට හෝ ටෙන්ඩර්කරුවන්ට දින 14 ක් ඇතුලත ඒ බව දන්වනු ලැබේ. ඒ බව ඔවුන්ට දන්වා සත් දිනක් ඇතුලත එහි සඳහන් මුලු මුදල ගෙවිය යුතුය. මුදල ගෙවා දින 14 ක් තුළ එම බඩු ගෙන යා යුතුයි. ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යැවීමෙන් හෝ එහි සඳහන් ස්ථානයේ තැබීමෙන් හෝ ටෙන්ඩරය භාරගත් බව ඔහුට දැන්වූවා සේ සලකනවා ඇත. කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වෙන අන්දමකට තීරණය නොකල හොත්, නියමිත කාලසීමාව තුළ දී ගෙන නොගොස් ගබඩාවේ ඉතිරි වෙන බඩු නැවත විකුණා දැමීමට හෝ වෙනත් සුදුසු සක් කිරීමට හෝ ඉඩ තිබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට ඒවා ගැන කිසිම අයිතිවාසි කමක් ඉදිරිපත් කළ නොහැක.

7. (අ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනට කලින් ටෙන්ඩරය අස්කර ගන්නා බව නොදැන්නුවහොත් හෝ (ආ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ඒවා නොඑවූවහොත් හෝ (ඇ) ටෙන්ඩරය තෝරාගත් බව දැන්වීමෙන් පසුව නියමිත කාලසීමාව තුළදී මුදල් නොගෙවා හෝ බඩු ඉවත් නොකර හෝ හැරිය හොත්, තැන්පත් මුදල රාජසන්තක කරනවා ඇත.

8. තෝරාගත් ටෙන්ඩර්කරුවෙකු බඩු ගෙනයාම ප්‍රතික්ෂේප කළ හොත් හෝ ගෙනයාමට බැරිවූවහොත්, තැන්පත් මුදල රාජසන්තක කරනු හැර, කොන්දේසි කඩකරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛන යේ ඔහුගේ නම ඇතුලත් කිරීමටද ඉඩ ඇත.

9. කිසිම හේතුවක් නො දක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඇත.

එම්. එල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපලවල්).

1970 ජූලි මස 20 වැනි දින,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදිය.

7–1070—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් දේ ප්‍රවාහනය සඳහා ටෙන්ඩර්—මහනුවර 1970-71

1970 ඔක්තෝම්බර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ :—

(i) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි සුරාබදු ගුදම් සහ ද්‍රම්පිය බඩු ඩබඩාව අතරද,

(ii) මහනුවර දිස්ත්‍රික්කය තුළ හා දිවයිනේ වෙනත් පෙදෙස්වල පිහිටි එනම්, යාපනය, වවුනියාව, මඩකලපුව සහ ත්‍රිකුණාමලය සුරාබදු ගුදම් අතර හා ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ස්කාගාර අතරද,

අරක්කු හා වෙනත් දේ එහා මෙහා ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල්, 1 වැනි මහලේ පිහිටි සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙනඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අගෝස්තු මස 24 වන දින පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ. රුපියල් 100 ක මුදලක් සුරාබදු දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සුරාබදු කොමසාරිස් වෙතින් ඉල්ලුම්කළ විට ලබාගතහැකි ටෙන්ඩර් පෝර්මයක මෙම ටෙනඩර් සකස් කළයුතු අතර, මේ පිළිබඳ අවශ්‍ය සියලුම විස්තර සුරාබදු කොමසාරිස්ගෙන් නොමිලයේ ලබාගත හැකිය. ටෙන්ඩර් පත්‍ර 1970 අගෝස්තු 22 වන දින දහවල් 12 න් පසුව නිකුත් කරනු නොලැබේ.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970 ජූලි මස 16 වන දින,
කොළඹ 1,
හේමාස් ගොඩනැගිල්ලේ—පළමුවැනි මහලේ,
සුරාබදු කොමසාරිස් කායාලයේ දීය.
එල්බී/ඊ/437

7–1061—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් දේ ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් කළුතර—1970-71

1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කල පරිච්ඡේදය තුළ :—

(i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි සුරාබදු ගුදම් සහ ද්‍රම්පිය බඩු ගබඩාවද, කළුතර දිස්ත්‍රික්කය තුළ හා පිටත පිහිටි ස්කාගාරද,

(ii) කළුතර දිස්ත්‍රික්කය තුළ හා දිවයිනේ වෙනත් පෙදෙස්වල පිහිටි ගුදම් අතරද,

අරක්කු හා වෙනත් දේ එහා මෙහා ප්‍රවාහනය සඳහා ටෙන්ඩර්පත්‍ර කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, 1 වැනි මහලේ පිහිටි සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 අගෝස්තු මස 24 වන දින පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ. රුපියල් 100 ක මුදලක් සුරාබදු දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සුරාබදු කොමසාරිස් වෙතින් ඉල්ලුම්කළවිට ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක මෙම ටෙන්ඩර් සකස් කළයුතු අතර, මේ පිළිබඳ අවශ්‍ය සියලුම විස්තර සුරාබදු කොමසාරිස්ගෙන් නොමිලයේ ලබාගත හැකිය. ටෙන්ඩර්පත්‍ර 1970 අගෝස්තු 22 වන දින දහවල් 12 න් පසුව නිකුත් කරනු නොලැබේ.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970 ජූලි මස 16 වන දින,
කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ,
1 වැනි මහලේ,
සුරාබදු කොමසාරිස් කායාලයේ දී.
එල්බී/ඊ/437

7–1062—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සමාජසේවා දෙපාර්තමේන්තුව

### කොග්ගල, මීරිගම, අනුරාධපුර, කයිතඩි යන ස්ථානයන්හි පිහිටි රජයේ මහළු නිවාසවලට සේවාවන් හා ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

මෙහි උපලේඛණයෙහි දෙවන තීරුවෙහි සඳහන්කොට ඇති සේවාවන් හා ද්‍රව්‍යයන් 1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලය තුල, සැපයීම සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලයෙන් හෝ කොග්ගල, මීරිගම, අනුරාධපුර සහ කයිතඩි යන පලාත්වල පිහිටි රජයේ මහළු නිවාසවලින් ලබාගත හැකි ආකෘතිපත්‍ර වල (පිටපත් දෙකකින් යුක්තව) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවෙහි අවශ්‍ය නම් කොන්ත්‍රාත්තුවට අදල කොන්දේසි ටෙන්ඩර්කරුවනට තේරුම් කර දෙනු ඇත. මෙහි උප ලේඛනයෙහි දක්වා ඇති සේවා එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සම්බන්ධයෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය. එක් එක් මහළු නිවාසයට එක් එක් සේවාවක් හෝ සැපයීමක් හෝ සඳහා ටෙන්ඩර් වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

3. ටෙන්ඩර් භාරගැනීම 1970 අගෝස්තු මස 25 වැනි දින දවල් 12.00 ට අවසන් වන අතර, එදිනම පස්වරු 2.30 ට ඒවා විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවෙහිදි ටෙන්ඩර්කරුවනට මෙම ස්ථානයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම හා ඔවුන් ඉදිරිපත් කොට ඇති ගාස්තු ප්‍රමාණයන්ද එසේ පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලබනවා ඇත.

4. ටෙන්ඩර් ආකෘති පත්‍රයක් ලබා ගැනීම සඳහා මෙහි උප ලේඛනයෙහි තුන්වන තීරුවෙහි නියමිත තැන්පත් මුදල මා වෙත හෝ කොග්ගල, මීරිගම, අනුරාධපුර, කයිතඩි යන ස්ථානයන්හි පිහිටි රජයේ මහළු නිවාසයක අධිකාරි වෙත හෝ ගෙවා ඒ තැන්පත් මුදල සඳහා ලැබූ කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. මෙම ආකෘති පත්‍ර තැපෑලෙන් ඉල්ලා සිටින අය, එසේ ආකෘති පත්‍ර ලබා ගෙන ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනට කලින් තම ටෙන්ඩරය ඉදිරිපත් කිරීමට හැකිවන තරම් කල් ඇතිව එම නියමිත ප්‍රමාණයට මුදල් ඇණවුමක් සමාජ සේවා අධ්‍යක්ෂට ලැබෙන සේ මෙම කාර්යාලයට එවිය යුතුය.

ප්‍රතික්ෂෙප කරනු ලැබූ ටෙන්ඩර්කරුවන්ගේ ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන් කැමැත්තේ නම් ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. එසේ නැතිනම් ඒවා ලියාපදිංචි කළ තැපෑලෙන් '' සමාජ සේවා අධ්‍යක්ෂ, බාලදක්ෂ මාවත, කොළඹ 3 '' යන ලිපිනයට එවිය හැකිය. ''1970/1971 වර්ෂයට ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම සඳහා වූ ටෙන්ඩරය ............ (මහළු නිවාසයේ නම ලියන්න) රජයේ මහළු නිවාසය '' යන පාඨය ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ ඉහල වම් කෙළවරේ ලිවිය යුතුය.

6. නියමිත ටෙන්ඩර් පත් සෑම අයුරින්ම සම්පූර්ණව පිළියෙල කිරීමට ටෙන්ඩර් කරුවන් වග බලා ගත යුතු වේ. නියමිත අන්දමට පිළියෙල කර නොමැති ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමට සමාජ සේවා අධ්‍යක්ෂට බලය තිබේ.

7. යම් ටෙන්ඩර්කරුවෙකුගේ ටෙන්ඩරය භාරගත් බවට ඔහුට දැනුම් දීමෙන් පසු ඔහු විසින් කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂේප කළ හොත්, නැත හොත් එය, පැහැර හැරියහොත්, එසේත් නැතිනම් අවශ්‍ය අවස්ථාවේදී ඇප මුදල තැන්පත් නොකළ හොත්, ඔහුගේ ටෙන්ඩරයට අදාල තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ.

8. යම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ කිසිදු විරෝධතාවයකට ඉඩ නොමැතිව ප්‍රතික්ෂේප කරන්නටත්, අවුරුද්දකට නොවැඩි ඕනෑම කාල සීමාවකට යම් ටෙන්ඩරයක් නොපිළිගන්නටත්, ආණ්ඩුවට බලය තබා ගනු ලැබේ.

ප්‍රේමචන්ද්‍ර ද සිල්වා,
සමාජ සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
බාලදක්ෂ මාවත,
කොළඹ 3,
1970 ජූලි මස 20 දිනදීය.

## ඉහතින් සඳහන් කරන ලද උප ලේඛනය

| | (1) ආයතනයේ නම | (2) සැපයෙන ද්‍රව්‍ය හෝ සේවය | (3) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (4) ඇපය රු. |
|---|---|---|---|---|
| 1. | මීරිගම රජයේ මහළු නිවාසය ... | දර ප්‍රවාහනය ... | 10 ... | රු. 100/– |
| 2. | කයිතඩි රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | (කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමට පෙර, |
| 3. | අනුරාධපුර රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | ගෙවා ඇති තැන්පත් මුදලට අමතර වශයෙන් තවත්, රු. 90 ක් |
| | | | | ගෙවීමෙන් ඇප මුදල සම්පූර්ණ කරන ලෙස පිළිගත් ටෙන්ඩරය |
| | | | | හිමි ටෙන්ඩර්කරුට නියම කරනු ලබනවා ඇත). |
| 4. | කොග්ගල රජයේ මහළු නිවාසය ... | මිනී පෙට්ටි සැපයීම ... | 10 ... | රු. 25/– |
| 5. | මීරිගම රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | (කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමට පෙර |
| 6. | අනුරාධපුර රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | ගෙවා ඇති තැන්පත් මුදලට අමතර වශයෙන් තවත් රු. 15 ක් |
| 7. | කයිතඩි රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | ගෙවීමෙන් ඇප මුදල සම්පූර්ණ කරන ලෙස පිළිගත් ටෙන්ඩරය |
| | | | | හිමි ටෙන්ඩර්කරුට නියම කරනු ලබනවා ඇත.) |
| 8. | කොග්ගල රජයේ මහළු නිවාසය ... | කිළිටි රෙදි පිරිසිදු කිරීම ... | 25 ... | රු. 100 |
| 9. | මීරිගම රජයේ මහළු නිවාසය ... | එම ... | 25 ... | (කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමට පෙර |
| 10. | අනුරාධපුර රජයේ මහළු නිවාසය ... | එම ... | 25 ... | ගෙවා ඇති තැන්පත් මුදලට අමතර වශයෙන් තවත් රු. 75 ක් |
| 11. | කයිතඩි රජයේ මහළු නිවාසය ... | එම ... | 25 ... | ගෙවීමෙන් ඇප මුදල සම්පූර්ණ කරන ලෙස පිළිගත් ටෙන්ඩරය |
| | | | | හිමි ටෙන්ඩර්කරුට නියම කරනු ලබනවා ඇත.) |
| 12. | කොග්ගල රජයේ මහළු නිවාසය ... | නිවාසයේ නේවාසිකයින්ගේ දැළි රැවුල් හා කොන්ඩා කැපීම සඳහා අර්ධකාල කරණවෑමියෙකුගේ සේවය | 10 ... | රු. 50/– (කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමට පෙර ගෙවා ඇති තැන්පත් මුදලට අමතර වශයෙන් තවත් රු. 40 ක් ගෙවීමෙන් ඇප මුදල සම්පූර්ණ කරන ලෙස පිළිගත් ටෙන්ඩරය |
| 13. | මීරිගම රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | හිමි ටෙන්ඩර්කරුට නියම කරනවා ඇත) |
| 14. | අනුරාධපුර රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | |
| 15. | කයිතඩි රජයේ මහළු නිවාසය ... | එම ... | 10 ... | |

7–1071—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පුත්තලම් දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ ගරාජයක් හා වතුර බසින නල (වෝටර් සීල්) වැසිකිළියක් සෑදීම සඳහා ටෙන්ඩර්

පුත්තලම් දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ ගරාජය හා වතුර බසින නල (වෝටර් සීල්) වැසිකිළියක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් 1970 අගෝස්තු මස 14 වැනි දින ප. ව. 2.30 දක්වා පුත්තලමේ දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ, දිස්ත්‍රික් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී එක් එක් විෂයයන් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව සකස් කර, ඒවා එකම කවරයක බහා මුද්‍රා තබා, ලියුම් කවරයේ වම් උඩ කෙළවරේ “ පුත්තලම දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ ගරාජය හා වතුර බසිනා නල (වෝටර් සීල්) වැසිකිළියක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ” යන්න සඳහන් කොට, පුත්තලම දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ, දිස්ත්‍රික් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩරය සඳහා රු. 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මුදල් තැන්පත් කළ හැකිය. 1970 අගෝස්තු මස 13 වැනි දින දහවල් දොළහ (12.00) දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩරයන් සම්බන්ධ සියළු විස්තර ඇතොත් පුත්තලම දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරීගෙන් ලබාගත හැකිය.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

1970.7.23 දින, පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

7–1157—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැති ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය පරිදි "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවට කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත චැක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් විධිමත් ලෙස දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවොත් හෝ ඔහු අතටම භාරදුන්නා සේ සලකනු ලැබේ.

14. කිසියම් සේවකයකු සේවයේ යෙදවීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

15. කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යොදවනු ලබන ලද කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥා පනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. තනි වශයෙන් හෝ වෙනත් අයකුගේ නමක් සමග රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් කිසිවෙකු සමග හෝ තමාට සැහේ යයි හැඟියන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වව්නියාවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියාගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙනිය, 1970 ජූලි මස 23 වෙනි දින.

7–1158—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත අංක 42 ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත දක්වන දිස්ත්‍රික්කයන්හි පිහිටි නි. මී. යෝ. ක්‍රා. ගබඩා සහ හාල් මෝල්වල ඇති කෝළන් ගෝනි මිළදී ගෙන යාම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1970 අගෝස්තු 11 වැනි අඟහරුවාදා ප. ව. 2.30 වනතෙක් බාරගනු ලැබේ.

(1) කුරුණෑගල දිස්ත්‍රික්කය.

(2) කෑගල්ල දිස්ත්‍රික්කය.

(3) අම්පාර දිස්ත්‍රික්කය.

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 42 ස්ථානයෙහි ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත කාර්යාලයේ නි. මී. යෝ. ක්‍රා. අංශයට එක් එක් දිස්ත්‍රික්කයක් සඳහා රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කර, 1970 අගෝස්තු 11 වැනි අඟහරුවාදා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනුපිට පතද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සහකාර ගොවිජන සේවා කාර්යාල වලින් විමසා දැනගත හැක.

ඩබ්ලිව්. එස්. ඇපා,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

තැ. පෙ. අංක 537,
කොළඹ 7,
1970 ජූලි 23 වැනිදා.

7–1154—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීම-ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් දිනය දීර්ඝ කිරීම-තිරුවාන ගල් සැපයීම-මිගමුව කම්හල

ඉහත සඳහන් දෑ සැපයීම පිළිබඳව ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් දිනය 1970 අගෝස්තු මස 7 වන දින පස්වරු 3 දක්වා දීර්ඝ කරනු ලැබේ.

නැවත ලබාගත හැකි රුපියල් 500 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා නැවත නොගෙවන රුපියල් 10 ක ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසුව, පහත අත්සන් තබන අයගෙන් 1970 අගෝස්තු මස 6 වන දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ලියකියවිලි ලබාගත හැක.

සැපයීමට බලාපොරොත්තුවන තිරුවාන ගල් සැම්පලයක් ද ටෙන්ඩර්පත සමග ඉදිරිපත් කළ යුතුය.

සැපයීම් කළමනාකරු.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් හා වාප්පු දෙපාර්තමේන්තුව,
අංක 55, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 7.

7–1200/1—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සේවාවට නුසුදුසු බව තීරණය කළ ඉතා පැරණි යතුරු ලියන දෙකක්, පාවිච්චි කරන ලද ටයර් අටක් (ටියුබ් සමග) හා පරණ පත්‍ර හොණ්ඩර 1½ක් විකිණීම

පහත දක්වා තිබෙන උපකරණ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අංක 16 පිහිටි ශාඛා කාර්යාලයෙන් මිළ දී ගෙන එම ස්ථානයෙන් ඒවා ඉවත් කර ගැනීම පිණිස 1970 අගෝස්තු මස 26 වැනි දින ප. ව. 3 වන තෙක් මා විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

### විස්තර

(1) යතුරු ලියනය (ඉංග්‍රීසි අන්ඩර්වුඩ්) අංක එස්. 5834068

(2) යතුරු ලියනය (ඉංග්‍රීසි අන්ඩර්වුඩ්) අංකය නොපෙනේ.

(3) වෑන් ටයර් ටියුබ් සමග (600×16)—4

(4) ජීප් ටයර් ටියුබ් සමග (600×16)—4

(5) පරණ පත්‍ර හොණ්ඩර 1½

ඉහත සඳහන් ද්‍රව්‍ය අංක 16, ඇල්බට් චන්ද්‍රවංකයේ පිහිටි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ශාඛාවේදී සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුළ පරීක්ෂා කළ හැකිවේ.

පසුව ආපසු ගෙවනු ලබන රු. 5 තැන්පත් මුදලක් තබනු ලබන අයවලුන්ට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහකාර (සංවිධාන හා පාලනය) නිලධාරී තැන විසින් 1970 අගෝස්තු මස 26 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

වැඩිමනත් විස්තර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අංක 16, ඇල්බට් චන්ද්‍රවංකයේ පිහිටි ශාඛා කාර්යාලයෙන් ලබා ගත හැක.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1970 ජූලි මස,
අංක 16, ඇල්බට් චන්ද්‍රවංකය,
කොළඹ 7,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දීය.

7–1116—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ලංකා පිගන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### කැලෑදර සැපයීම සඳහා වූ ටෙන්ඩරය

කොළඹ 7, අංක 55, රොස්මීඩ් පෙදෙසේ, ලංකා පිගන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තැන විසින් 1970.8.7 වන දින පස්වරු 3 දක්වා [illegible] කම්හලට කැලෑදර සැපයීම සඳහා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

නැවත ලබාගත හැකි රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා නැවත නොගෙවන රුපියල් 10 ක ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසු පහත අත්සන් තබන අයගෙන් 1970.8.6 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ලියකියවිලි ලබාගත හැක.

සැපයීම් කළමනාකරු.

සැපයීම් හා වාණිජ දෙපාර්තමේන්තුව,
ලංකා පිගන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
අංක 55, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 7.

7-1200/2—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනා ගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩය සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 12.8.70 වෙනි බදාදා පූ. භා. 10 වනතෙක් භාරගනු ලැබේ.

(1) ජාඇල ඩිපෝවේ පාරවල් හා අංගන ඉදි කිරීම.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනු පිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් පත් යනාදිය ඔහුගේ කාර්යාල යේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධ යෙන් රු. 35,000 ක් හෝ එයට අධික වැඩවන කර්මාන්ත සම්බන්ධ යෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති.

අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා රු. 100 ක මුදලක් ටෙන්ඩර් ඇප මුදල් වශයෙන්ද ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක්ද ප්‍රධාන ගිණුම් නිලධාරිතැන වෙත ගෙවා, එම කුවිතාන්සිය 7.8.70 දින දහවල් 12 ට පෙර මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත්‍ර ප්‍රධාන සිවිල් ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍රධාන ගිණුම් නිලධාරිතැන වෙත මුදලින් පමණක් තැන්පත් කළ යුත්තේ එම සහතික පත්‍ර පිළිගනු ලැබුවේ නම් පමණකි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන.

අංක 200, කිරුළපාර,
නාරාහේන්පිට, කොළඹ 5.

7-1195—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්ඩි 1/33/70

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ද්‍රව එච්සීඑන් සිලින්ඩර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ද්‍රව එච්සීඑන් සිලින්ඩර සැපයීම සඳහා පහත සඳහන් උප ලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින් ;

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ.පෙ. 584 හිමි කොළඹ, රජින විදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ඔක්තෝබර් මස 27 වෙනි දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම් වලින් ;

(ii) 1 වැනි ඡේදයේ (iv) වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයන්ට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම්, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම් වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
1970 ජූලි මස 15 වැනි දින.

### අදාල උප ලේඛනය

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 | .. Liquid HCN Cylinders each Cylinder containing 75 lbs Liquid HCN (Hydrocyanic Acid) of the highest commercial purity 96% | 50 only .. | In any convenient packing |
| 2 | .. HCN Discoids .. .. .. .. | 1,875 lbs. .. | In tins of various sizes |

*Note.*—If item 1 liquid HCN is not available supply the following instead :

HCN Discoids in the following sizes : 5,625 lbs.
750 × 54 oz. tins
750 × 40 oz. tins.
1,219 × 16 oz. tins.

7-1046—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට අවුරුද්දක කාල සීමාවක් ඇතුලත සෑම දුම්රිය ස්ථානයන්හි හා දුම්රිය ස්ථාන අවට භූමි භාගවල දැන්වීම් ප්‍රදර්ශණය කරවීම සඳහා 1970 අගෝස්තු 21 වෙනි සිකුරාදා පෙ. ව. 10 දක්වා, කොළඹ 10, තැ. පෙ. අංක 355 ලංකා දුම්රිය සේවයේ දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ලියාපදිංචි ටෙන්ඩර්කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ. තව වර්ෂ 1 හෝ 2 කට මෙම කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමේ අභිමතය ටෙන්ඩර් මණ්ඩලය සතුව ඇත.

2. මෙතෙක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ මේ සම්බන්ධව සැලකිලිමත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ නාමයන් ලියාපදිංචි කරන ලෙස, කොළඹ 10, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරි වෙත පහත සඳහන් තොරතුරු සපයමින් 1970 අගෝස්තු මස 10 වෙනි සඳුදා දින හෝ ඊට පෙර අයදුම් කළ යුතුය.

(අ) මෙම වර්ගයේ ව්‍යාපාර ගැන කලින් ඇති පළපුරුද්ද සම්බන්ධව විස්තර සහිත ප්‍රකාශයන්ද, පෙර පළපුරුද්ද, කාර්යක්ෂමතාව සහ මුදල් ස්ථාවරත්වය පිළිබඳව මහා භාණ්ඩාගාර චක්‍රලේඛන 1085 පී/28/2 හා 1961.5.26 අනුව ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඉටුකරන ලද රජයේ කොන්ත්‍රාත්තු දැක්වෙන ප්‍රකාශයත් සහ එහි විස්තර.

(ඇ) සතු ඉඩකඩම් දේපල හා වෙනත් ව්‍යාපාර සම්බන්ධකම්ද, එය පිහිටි දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්කද දැක්වෙන සම්පූර්ණ විස්තර සහිත ප්‍රකාශයක් සහ,

(ඈ) රජයේ කොන්ත්‍රාත්තු කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්තුකරුවන්ගේ නම් ලේඛනයට සිය නම් ඇතුලුවී නැති බවට ප්‍රකාශයක්.

3. කොළඹ 10, තැ. පෙ. අංක 355, දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ වාණිජ අධිකාරි කාර්යාලයෙන් ලබාගත යුතු ආකෘති පත්‍රවල (දෙපිටපතකින් යුතුව) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. රු. 1,000 ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි කාර්යාලයේ හෝ කොළඹින් බැහැර නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 අගෝස්තු මස 19 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මෙයට සහ ඊට අදාළ කොන්දේසි සමග ටෙන්ඩර් මුද්‍රා තබා කොළඹ 10, තැ. පෙ. අංක 355, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති නමට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. එසේ නැත්නම් ලිපිනය සහ සේවය විස්තර කවරයේ සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර්, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාරගැනීමට බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ පැමිණ භාරදී එය භාරගත් බවට ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. ඉහත සඳහන් නියමිත දිනය සහ වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එසේ කැමැත්තේ නම් ටෙන්ඩර්කරුවන්ටද එහි පෙනී සිටිය හැක. 1970 අගෝස්තු 21 වෙනි සිකුරාදා පෙ. ව. 10.30 ට කොළඹ 10, තැ. පෙ. අංක 355 දරණ දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සිට ඉදිරියට සති 6 ක කාලයකට ටෙන්ඩර් පත්‍රවල සඳහන් කර ඇති ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වැඩිපුර විස්තර කොළඹ 10, ලංකා දුම්රිය සේවයේ වාණිජ අධිකාරි කාර්යාලයෙන් ලබා ගත හැක.

එස්. ජේ. වී. වීරරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට,
ලං. දු. දෙ.

තැ. පෙ. අංක 355,
කොළඹ 10,
1970.7.23.

7–1161—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### වානේ සැපයීම සඳහා ටෙන්ඩරය

1970 සැප්තැම්බර් මස 24 වැනි දින පෙරවරු 10 වන තෙක් වානේ කිලෝග්‍රෑම්ස් 1,50,000 ක් පමණ සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. රුපියල් 100 ක ආපසු ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම් මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් 1970 සැප්තැම්බර් 23 වැනි දින දහවල් 12 න් පසු භාරගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රුපියල් 5 ක් ගෙවීමෙන් ලබාගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. අංක 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5.

7–1194—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් දේ ප්‍රවාහනය සඳහා ටෙන්ඩර්—1970/71

යාපනය සුරාබදු ගුදම හා දුම්රිය බඩු ගබඩාව අතර, 1970 ඔක්තෝබර් 1 වන දින සිට 1971 සැප්තැම්බර් 30 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ අරක්කු හා වෙනත් දේ ප්‍රවාහනය සඳහා ටෙන්ඩර්පත්‍ර කොළඹ 1, ගෝමාස් ගොඩනැගිල්ලේ 1 වැනි මහලේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 අගෝස්තු 24 වන දින පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. සුරාබදු කොමසාරිස් වෙතින්, ඉල්ලුම් කළ විට ලබාගත හැකි පෝරමයක ටෙන්ඩර්පත්‍ර සකස් කළ යුතු වන අතරම, මේ පිළිබඳ සියලුම විස්තර ද සුරාබදු කොමසාරිස්ගෙන් ලබාගත හැකිය. 1970 අගෝස්තු මස 22 වන දින දහවල් 12 න් පසු ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු නොලැබේ.

ඩී. බී. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970 ජූලි මස 16 වන දින,
කොළඹ 1, ගෝමාස් ගොඩනැගිල්ලේ,
පළමුවැනි මහලේ,
සුරාබදු කොමසාරිස් කාර්යාලයේදීය.
එල්බී/5/137.

7–1166—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### පානීය පරිපාක ස්පිරිත්තු ඉම්පීරියල් ගැලුම් 3,00,000 ක් සැපයීම සඳහා වූ ලෝකව්‍යාප්ත ටෙන්ඩරය

පානීය පරිපාක ස්පිරිත්තු ඉම්පීරියල් ගැලුම් 3,00,000ක් සැපයීම සඳහා ලංකාව, කොළඹ 1, තැ. පෙ. 500, මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 1, ගෝමාස් ගොඩනැගිල්ලේ, 1 වැනි මාලයේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගතහැකි නියමිත පෝරමයන්හි ටෙන්ඩර් ඉදිරිපත් කළයුතු අතර, ඒ පිළිබඳ සියලුම තොරතුරු ද එම කාර්යාලයෙන් ලබාගත හැකිය.

3. කච්චේරියක හෝ කොළඹ 1, ගෝමාස් ගොඩනැගිල්ලේ, 1 වැනි මාලයේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයේ හෝ රු. 100ක මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීම පිට 1970 ඔක්තෝබර් මස 30 වැනි සිකුරාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඩී. බී. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
1 වැනි මාලය,
ගෝමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1970. 7. 20.

7–1178—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

9. **තැන්පත් මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු, මා විසින් නියම කරන ලද ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දනගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුලුවන.

එච්. සී. ඌරාගොඩ,<br>
සෞඛ්‍ය සේවා අධිකාරී තැන,<br>
අනුරාධපුරය.

1970 ජූලි මස 21 වැනි දින,<br>
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී ය.

## උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) ප්‍රමාණය | (4) අවසාන දිනය |
|---|---|---|---|
| අනුරාධපුර දුම්රිය පොළේ සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය දක්වාත් එතැන් සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | අනුරාධපුර | ... 6,000 | 70.8.21, පෙ.ව. 10 ට |
| ත්‍රිකුණාමලය දුම්රිය පොළේ සිට ත්‍රිකුණාමලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලය දක්වාත් එතැන් සිට ත්‍රිකුණාමලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | ත්‍රිකුණාමලය | ... 6,500 | |
| කැකිරාව දුම්රිය පොළේ සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලය දක්වාත්, එතැන් සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලයාධිපති තැන යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කැකිරාව | ... 3,550 | |

7-1156/1—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

1970 ඔක්තෝබර් 1 වෙනිද සිට 1971 සැප්තැම්බර් 30 වෙනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ ටෙන්ඩර් පිළිබඳ විස්තර දක්වා ඇති පිටිකිරි සහ සීනි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාලවල සහ ගබඩාවල සිට /සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරී තැනගේ පාලනය යටතේ පවත්නා කාර්යාල සහ ගබඩාවල සිට දිස්ත්‍රික් පරිපාලකවරයින්ගේ කාර්යාල සහ ගබඩාවල සිට /දුම්රිය ස්ථානවල සිට /පිටිකිරි සහ සමුපකාර සංගම්වල සිට /සීනි, කිරි මධ්‍යස්ථානවලට උපලේඛනයේ සඳහන් එක් එක් සේවය සඳහා වෙන වෙනම සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන ඡේදයේ සඳහන් පරිදි රු. 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට කලින් දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය, වවුනියාව සහ ගාල්ල යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට කලින් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට කලින් තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරිනට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු පිටිකිරි සහ සීනි දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, අනුරාධපුරය " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම්/ගණකාධිකාරී මහතාට දීමෙන් හෝ ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරන ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරණ වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මා විසින් නියම කරන ලද ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම්පත්‍රයක් මගින් පුලුවන.

එච්. සී. ඌරාගොඩ,<br>
සෞඛ්‍ය සේවා අධිකාරී,

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,<br>
අනුරාධපුරය,<br>
1970 ජූලි මස 21 වැනි දින.

### උපලේඛනය

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>පිටිකිරි සහ සීනි ප්‍රමාණය දළ වශයෙන්<br>පිටිකිරි හො. | 3<br><br>සීනි හො. | 4<br>අවසන් දිනය සහ වේලාව |
|---|---|---|---|---|
| 1. ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ ත්‍රිකුණාමලයේ සමුපකාර සංගමයේ සිට සීනි, ත්‍රිකුණාමලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ ත්‍රිකුණාමලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට | ත්‍රිකුණාමලය ... | 50 | 16 | 1970.8.21 පෙ.ව. 10ට |
| 2. අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ අනුරාධපුරයේ සමුපකාර සංගමයේ සිට සීනි, අනුරාධපුරයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට | අනුරාධපුරය ... | 36 | 13 | 1970.8.21 පෙ.ව. 10ට |
| 3. කැකිරාව දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ කැකිරාව සමුපකාර සංගමයේ සිට සීනි, කැකිරාවේ සෞඛ්‍ය කාර්යාලයාධිපතිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයාධිපතිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට | කැකිරාව ... | 30 | 11 | 1970.8.21 පෙ.ව. 10ට |
| 4. අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ කහටගස්දිගිලිය සමුපකාර සංගමයේ සිට සීනි, කහටගස්දිගිලිය සෞඛ්‍ය කාර්යාලයාධිපති තැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයාධිපති තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානයට ගෙන යාමට | කහටගස්දිගිලිය ... | 10 | 3 | 1970.8.21 පෙ.ව. 10ට |

7–1156/2—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර් කරුවන්ගේ සුදුසුකම්.**—1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකත් ඇතුලුව) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමු වැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී විසින් බාර ගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලවලින් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් බාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, අනුරාධපුරය" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසනා දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදයම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන් වලට අනුව වටුවරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහාමෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා අවන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කියිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

එච්. සී. ඌරාගොඩ,
සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුර.

1970.7.21,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | (3) ඇප තැන්පත් මුදල රු. ශ. | (4) මාසයකට අවශ්‍ය සේදීම් ගණන | (5) මසකට සෝදන සාමාන්‍ය කැලි ගණන | (6) ටෙන්ඩර් වසන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| **රජයේ රෝහල—අනුරාධපුරය :** | | | | | |
| I කොටස—ශල්‍යාගාරය— | | | | | |
| ළමා වාට්ටුව, ගැබිනි මව්වරු, පිරිමි සහ ගැහැණු ශල්‍ය ... ... | 100 0 ... | 300 0 ... | 30 ... | 8,200 | |
| II කොටස—සාමාන්‍ය වාට්ටු ... ... | 50 0 ... | 200 0 ... | 4 ... | 5,000 | |
| III කොටස—ක්ෂය රෝගී වාට්ටු ... ... | 25 0 ... | 100 0 ... | 4 ... | 500 | |
| IV හෙදි අභ්‍යාස විද්‍යාලය අ'පුරය ... ... | 25 0 ... | 100 0 ... | 3 ... | 100 | |
| **රජයේ රෝහල—ත්‍රිකුණාමලය :** | | | | | 70.8.21 පෙරවරු 10 ට |
| I කොටස—ශල්‍යාගාරය— | | | | | |
| ළමා වාට්ටුව, ගැබිනි මව්වරු, පිරිමි සහ ගැහැණු ශල්‍ය ... ... | 100 0 ... | 300 0 ... | 30 ... | 5,000 | |
| II කොටස සාමාන්‍ය වාට්ටු ... ... ... | 50 0 ... | 200 0 ... | 4 ... | 1,000 | |
| III කොටස—ක්ෂය රෝග වාට්ටු ... ... | 25 0 ... | 100 0 ... | 4 ... | 300 | |

7-1156/3—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—වියලි කිරි හා කිරි ප්‍රවාහනය—1970-71

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් වන ආයතනයන්ට දුම්රියපලවල සිට වියලි කිරිත්, සමූපකාර සමිතිවල සිට සීනිත්/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ/සෞඛ්‍ය කාර්යාලයාධිපතීන්ගේ කාර්යාල/ගබඩා හරහා කිරි මධ්‍යස්ථානවලට ප්‍රවාහනය සඳහා ලාංකිකයන්ගෙන් හා ලාංකික සමාගම්වලින් එවනු ලබන, සිල් තැබූ ටෙන්ඩර් පත් මාතර සෞඛ්‍ය සේවා අධිකාරි විසින් බාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම**—රුපියල් සියයක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කර කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසාන දිනට පළමු දිනයන්හි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, රත්නපුරය හෝ වවුනියා යන සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලවලින් ලබා ගත හැකිය. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට කැමති සෞඛ්‍ය සේවා අධිකාරිට හෝ දන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම කාර්යාලයකින් ලබා ගත හැකිය. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි විට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. සැපයිය යුතු වියලි කිරි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමග ඇති උපලේඛනයේ තෙවන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " මාතර සෞඛ්‍ය සේවා අධිකාරි " කියා එවිය යුතුය. ටෙන්ඩර් පත් බහා එවන සීල් කරන ලද කවරයේ වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවක්ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහල කෙලවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කල යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරිට දී එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරන ලද කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

6. **ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ සිව් වන තීරයේ සඳහන් දිනයේ පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුව හොත් එම සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කර බැලිය හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු වන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මා විසින් නියම කරණ ලද ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය. එක කොටසකට රු. 400/- ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටිපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හ ර පිළිපැදිය යුතු වන්නේය.

11. **වෙනත් විස්තර**—තව දුරටත් විස්තර දැන ගැණිම සඳහා දෙවන ඡෙදයේ සඳහන් කුමන කාර්‍යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පිලිවන.

වෛද්‍ය අයි. ඒ. එස්. සිරිවර්ධන,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි

1970 ජූලි මස 19 වැනි ද,
මාතර, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදීය.

උපලේඛනය

| 1<br>සේවය | 2<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ප්‍රදේශය | 3<br>දෙමසකට වරක් සැපයිය යුතු ප්‍රමාණය<br>වියලි කිරි පිටි හොණ්ඩර | <br><br>සීනි හොණ්ඩර | 4<br>ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| (1) තංගල්ල බාහිර දුම්රිය බඩු ගබඩාවේ සිට වියලි කිරිත්, බටහිර ගිරුවා පත්තුවේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සිට සීනිත්, තංගල්ලේ සෞඛ්‍ය කාර්‍යාලයට හා එහි සිට තංගල්ල සෞඛ්‍ය කොට්ඨාශයේ කිරි මධ්‍යස්ථානවලට ප්‍රවාහනය කිරීම ... ... ... ... ... | තංගල්ල ... | 6 ... | 2 ... | 197 අගෝස්තු මස 25 වැනි දින පෙරවරු 10 ට |
| (2) බෙලිඅත්ත බාහිර දුම්රිය බඩු ගබඩාවේ සිට වියලි කිරිත්, කන්දබඩ පත්තුවේ විවිධ සේවා සමුපකාර සංගමයේ සිට සීනිත් හක්මන සෞඛ්‍ය කාර්‍යාලයට හා එහි සිට හක්මන සහ වලස්මුල්ල සෞඛ්‍ය කොට්ඨාශවල කිරි මධ්‍යස්ථානවලට ප්‍රවාහනය කිරීම... ... ... ... ... | වලස්මුල්ල ... | 24 ... | 9 ... | |
| (3) මාතර දුම්රිය පලේ සිට වියලි කිරිත්, වැලිගම් කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතියේ අකුරැස්ස ශාඛාවේ සිට සීනිත්, කොටපොල, අකුරැස්ස හා කඹුරුපිටිය සෞඛ්‍ය කොට්ඨාශවල කිරි මධ්‍යස්ථානවලට ප්‍රවාහනය කිරීම ... | අකුරැස්ස, කොටපොල හා කඹුරුපිටිය ... | 17 ... | 6 ... | |
| (4) හම්බන්තොට සෞඛ්‍ය කාර්‍යාලයේ සිට වියලි කිරිත්, තංගල්ල දකුණු ගිරුවාපත්තුව විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සිට සීනිත්, හම්බන්තොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශයේ කිරි මධ්‍යස්ථානවලට ප්‍රවාහය කිරීම ... | හම්බන්තොට ... | 3 ... | 1 ... | |

සටහන.—ඉහත සඳහන් එක් කොටසක් වෙනුවෙන් ඇප මුදල රු. 400කි. කිරි මධ්‍යස්ථානවල බඩු බාහිරාදිය සෞඛ්‍ය කාර්‍යාලවලටත්, සෞඛ්‍ය කාර්‍යාලවල බඩු බාහිරාදිය කිරි මධ්‍යස්ථානවලටත් ප්‍රවාහනය කොන්ත්‍රාත්කරු විසින්ම කළ යුතුය. ඒ වෙනුවෙන් අමතර ගාස්තුවක් ගෙවනු නොලැබේ.

7–1146—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

දකුණු කොළඹ කලුබෝවිල රෝහලේ සූතිකාගාර වාට්ටුවේ බිම "ටෙරාසෝ" උලු සවි කර සකස් කිරීම සඳහා වූ ටෙන්ඩර්පත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ වූ ප්‍රාදේශිය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් 1970 අගෝස්තු මස 19 දින පූර්වභාග 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. දකුණු කොළඹ ගොඩනැගිලි දිස්ත්‍රික් ඉංජිනේරුතැනගෙන් ලබා ගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙළ කොට අනුපිටපත් ද සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය විස්තර ඔහුගෙන් ලබා ගත හැක. සැලැස්ම ද ඔහුගේ කාර්යාලයෙන් බලාගත හැකිය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ 1969.10.1 දිනට පසු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 15,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 අගෝස්තු මස 10 වැනි දින ප. ව. 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ප්‍රමාදවීමේ ගාස්තුවක්, නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරුගේ, කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

4ඒ. අයදුම් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම තමුන් කරන වැඩයේ තත්ත්වය සහ ප්‍රගතිය සම්බන්ධයෙන් දැනට වැඩ කරන දිස්ත්‍රික්ක ඉංජිනේරුතුමාගෙන් සහතිකයක් ලබාගෙන තිබිය යුතුය.

5. ටෙන්ඩර්පත් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳවූ සියලු විස්තර අඩංගු කළ ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරිතැනගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයේ පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කළ හැක.

එන්. ජී. රාජන්,
බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු
(ගොඩනැගිලි).

1970 ජූලි 31 වැනි දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි
ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ
බ. කො. අ. ඉ. (ගො.) කාර්යාලයේ දීය.

7–1136—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### තැපැල් ගෙනයාම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

1970 ඔක්තෝබර් පළමුවැනි දින සිට සතර වසක් තුළ පුත්ගුඩතිව් (කළුදසිපිඩඩි) හා නයිනතිව් ජෙටි අතර යාන්ත්‍රික බෝට්ටු මගින් තැපැල් ගෙනයාමේ කොන්ත්‍රාත්තුව සඳහා එවනු ලබන ටෙන්ඩර්, කොළඹ 1, පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලයේ තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 අගෝස්තු මස 20 වැනි දින පෙ. ව. 10 වන තෙක් භාර ගනු ලැබේ.

පෝස්ට්මාස්ටර් ජනරාල් තැනගෙන් ඉල්ලුම් කොට ලබාගත් ආකෘතිපත්‍රවල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. මීට අදාල සියලු විස්තර ද ඔහුගෙන් ලබාගත හැක. රුපියල් දහයක් ගෙවා තැපැල් කාර්යාලයකින් හෝ කච්චේරියකින් ලබාගත හැකි කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනුයේ 1970 අගෝස්තු මස 12 වැනි දින දහවල් 12 වන තෙක් පමණි.

වී. ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සංදේශ අධ්‍යක්ෂ.

පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය,
කොළඹ 1,

7–1183—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1970–71 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටෙන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයයෙන් හෝ මෙහි මතු 2 වන ඡේදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 1970.10.1 වනදා සිට 1971.9.30 වනදා දක්වා වකවානුව තුලැ දුම්රියපොළෙන්/පොළවලින්/පොළවලට/පොළට ආයතනවලින්/ආයතනවලට/කාර්යාලයට/කාර්යාලයයෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකිකවූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලිනුත්, සමූපකාර සමිතිවලිනුත් පුත්තලමේ සෞ. සේ. අධිකාරිතැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් වියැ යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතැයි. රු. 100ක මුදලක් ළඟමැ ඇති කච්චේරියේ පුත්තලම සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොටැ එහි ලදුපත ලබාගෙනැ ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1970.8.24 වනදා දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකිය :—

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| බදුල්ල | කළුතර | මාතලේ | වවුනියා |
| කොළඹ | මහනුවර | මාතර | |

නියමිත ආකෘතිපත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැළකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර ඉහත 2 වන ඡේදයෙන් කියැවුනු කවර හෝ සෞ. සේ. අධිකාරි කාර්යාලයෙයකින්ද ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළයුතු ටැන්ඩර්පත්‍ර " බඩු ඇදීම සඳහා ටැන්ඩරය " යනුවෙන් වම් පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත පිට නම් ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර්පත්‍ර 1970.8.25 වනදා පෙරවරු 10ට පෙර පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත ලැබෙනසේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. නැතහොත් සෞ. සේ. අධිකාරි කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටැන්ඩර්කරුවන්, කැමති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත් අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරි කාර්යාලවලැ ලේකම්/ගණකාධිකාරී වෙත බාර දී ඊට ලදු පතක් ලබා ගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර් කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදා ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විටැ දක්විය යුතුයි.

8. ටැන්ඩර්පත්‍ර 1970.8.25 වනදා පෙරවරු 10 ට සෞ. සේ. අධිකාරි කාර්යාලයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම්ලත් නියෝජිතයින්ට හෝ තමන් කැමති නම්, පුත්තලම සෞ. සේ. අධිකාරි සමග විධිවිධාන සලසාගෙන ඔහුගේ අවසරය පිටැ, ටැන්ඩර් විවෘත කරන විටැ පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටැන්ඩර් බාර ගැනීම අවසන් වන දවසේ සිටැ හය මාසයක් දක්වා පිළිගත හැකිසේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර්පත්‍ර පසුවැ අස්කළ හැකි නොවේ.

10. පුත්තලම සෞ. සේ. අධිකාරි ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදානමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේ දී ටැන්ඩර්කරු සේවයට ගතයුත්තේ ලාංකිකයින් පමණකි. මෙහිදී " ලාංකිකයා " යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. පුත්තලම සෞ. සේ. අධිකාරිගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළාක් සේ සලකා, කොන්ත්‍රාත්තුව අවලංගු කොටැ එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥාපනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම්, එකතුකිරීම්, යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත් කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්මැ ආණ්ඩුව මුදගත යුතුයි.

13. පුත්තලම සෞ. සේ. අධිකාරිතැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 300 කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව පුත්තලම සෞ. සේ. අධිකාරි විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර්කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලිවූවොත් හෝ අපොහොසත් වූවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවී, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමට ද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර්කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපැලෙන් යවා තිබෙ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර් කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. පුත්තලම සෞ. සේ. අධිකාරිගේ අවසරයක් කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිසැ අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. පුත්තලම සෞ. සේ. අධිකාරිතැන සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කලැ ඒ කියන තැනැත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටැන්ඩර් සියල්ලමැ හෝ ඉන් කිසිවක් හෝ පිටු දකීමත්, යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂතැන සමග කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම කවරක් වුවද, තමන් කැමති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස පුත්තලම සෞ. සේ. අධිකාරි වෙත තිබේ. එබඳු විටැකදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙනගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වුවහොත් නැත්නම් අපොහොසත් වූවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වූවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරට මැ සපුරා නැතහොත්, කිසිදු ටැන්ඩරයක් සලකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡේදයේ දක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිව්වුවෙන්.**—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබෙද යන වග මේ සමග ඇති උපලේඛනයේ දක්වේ. මෙහි දක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**—කොන්ත්‍රාත් කරු විසින් ගෙන ගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවූවොත් හෝ හොරකම් කරනු ලැබූවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක් හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද ඇතුළත් කොටැ, අලාභ

හානි සිදුවූ හෝ හොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දක්විය යුතු මිළ ගණන්.**—(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී-I උප ලේඛනයෙහි දක්විය යුතු—

පළමුවැ රාත්තල් 28 දක්වා ද,

දෙවැනුව රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,

තුන්වැනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,

සිව්වැනුවැ රාත්තල් 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වා ද,

පස්වැනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වා ද,

හයවැනුවැ හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,

හත්වැනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වා ද,

අටවැනුවැ හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද,

නමවැනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද,

දසවැනුවැ හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරම ගෙන යාම සඳහා එක් එක් බර-ගොල්ල උදෙසා මිළ ගණන් දක්වය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දක්වෙන බර කුමක් වුවද මුළ දුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුනම්, ඒවාගෙ ගෙවම් බී-I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිවෙ නම් ඒවායෙ ගෙවීම් තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී-II උපලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යැම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී-II උපලේඛන යෙහි මිළ ගණන් දක්විය යුතුයි—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා

(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා

(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා

(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිළ ගණන් වෙන වෙනම දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන් මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැලකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරන විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

1970.7.22. වැනි දිනය

ආර්. එච්. පීරිස්,
පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරි.

දිනය : 1970...........

————————,
නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය: 1970...........

————————,
ටැන්ඩර්කරුගේ අත්සන.

## 1970/71 ගබඩා බඩු ඇදීම සඳහා ටැන්ඩර් කොන්දේසි ව 24 වන ඡේදයේ කියැවෙන උපලේඛනය

**පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය**

පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරය — දුම්රිය පොලෙන් පොලට ආයතනවලින්/කාර්යාලවලින්/ආයතනවලට/කාර්යා( වලට දුර ප්‍රමාන දල වශයෙන්

| දුම්රිය පොළෙන්/ පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට | කිට්වුවෙන සැලකිය හැකි දුර සැතපුම |
|---|---|---|
| **I වන කොටස—පුත්තලම දිස්ත්‍රික්කය** | | |
| පුත්තලම ... | පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය සහ ළදරු සුභසාධක චිකිත්සා ගාරය, මන්නාරම පාර, පුත්තලම ... | 1 |
| | දිසා රෝහල, පුත්තලම ... ... | ½ |
| | ළය රෝහල, පුතතලම ... ... | ½ |
| | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, පුත්තලම ... | 1 |
| | ග්‍රාමීය රෝහල, කොට්ටුකච්චිය ... | 10 |
| | දි. රෝහල, ආණමඩුව ... ... | 16 |
| | ම. බෙ. හල, කබ්බෝව ... ... | 9 |
| | ම. බෙ. හල, කරතිව ... ... | 15 |
| | ම. බෙ. හල, වන්නාතවිල්ලු ... | 13 |
| මදුරන්කුලිය ... | ම. බෙ. හල, මදුරන්කුලිය ... | 4 |
| | මාතෘ නිවාසය, මහකුඹුක්කඩවල ... | 11½ |
| පාලාවි ... | ග්‍රා. රෝහල, කල්පිටිය ... ... | 25 |
| | ම. බෙ. හල සහ මාතෘ නිවාසය, මාම්පුරි ... | 7 |
| | ම. බෙ. හල, තලවිල ... ... | 18 |
| මුන්දල් ... | පර්යන්ත ඒකකය, මුන්දල් ... | ½ |
| | ම. බෙ. හල, කොට්ටන්තිව ... | 8 |
| **II වන කොටස—හලාවත දිස්ත්‍රික්කය** | | |
| බෝලවත්ත ... | සෞ. වෛ. නි. කාර්යාලය, දන්කොටුව... | 3 |
| | පර්යාන්ත ඒකකය, දන්කොටුව ... | 2 |
| | ම. බෙ. හල, නයිනමඩම... ... | 3 |
| | ම. බෙ. හල, මැල්ලව ... ... | 9 |
| ලුනුවිල ... | ම. බෙ. හල, කොස්වත්ත ... | 5 |
| | ම. බෙ. හල, පොකුවටවන ... | 4 |
| | ම. බෙ. හල, ලුනුවිල ... ... | ½ |
| නාත්තන්ඩිය ... | ම. බෙ. හල, නාත්තන්ඩිය ... | ¼ |
| | සෞ. වෛ. නි. කාර්යාලය, මාරවිල ... | 3 |
| | දිසා රෝහල, මාරවිල ... ... | 3½ |
| | ම. බෙ. හල, වලහපිටිය ... | 3½ |
| කුඩාවැව ... | ම. බෙ. හල, කුඩාවැව ... ... | 4½ |
| මාදම්පේ ... | පර්යාන්ත ඒකකය, මාදම්පේ ... | 1 |
| | බෙහෙත් ගබඩාව, මාදම්පේ ... | 1 |
| | ම. බෙ. හල, තඹගල්ල ... ... | 5 |
| | පර්යාන්ත ඒකකය, ගල්මුරුව ... | 3 |
| හලාවත ... | මූලික රෝහල, හලාවත... ... | ½ |
| | සෞ. වෛ. නි. කාර්යාලය, හලාවත ... | ¼ |
| | ම. බෙ. හල, කොක්කාවිල ... | 7 |
| බංගදෙනිය ... | ම. බෙ. හල, පල්ලම ... ... | 12 |
| බත්තුළුඔය ... | ම. බෙ. හල, ආනවිලුන්දව ... | 2 |
| | ම. බෙ. හල, උඩප්පුව ... ... | 4 |
| | ම. බෙ. හල, කටුපොක ... | 4 |
| | ම. බෙ. හල, මුදලක්කුලිය ... | 14 |

7–1176—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය

**ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙන යාම 1970–71**

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1970 ඔක්තෝම්බර් 1 වැනිද සිට 1971 සැප්තැම්බර් මස 30 වැනිද දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛණයෙහි පළමු වන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි බෙදාසස්ථානවලට පිරිසිදු එළකිරි ගෙන යාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතර සෞඛ්‍ය සෙවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිත් වලටද තැන්පත මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වෙවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් වල හෝ සමිත් වල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම කාර්යාලයකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දක්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 4 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, මාතර'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරි මහතාට දීමෙන් එය ලැබුනු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 5 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලන මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කරගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමු වන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

9. ටෙන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටෙන්ඩර් බාරගැනීමේ අවසන් දවසේ සිට හය මාසයක් දක්වා පිළිගත හැකි සේ තබා ගත යුතුයි. ඉදිරිපත් කළ ටෙන්ඩර් පත්‍ර පසුව අස් කළ හැකි නොවේ.

10. තැන්පත් මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු, මා විසින් නියම කරන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

12. වෙනත් විස්තර.—තව දුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

වෛද්‍ය, අයි. ඒ. එස්. සිරිවර්ධන,
මාතර, සෞඛ්‍ය සේවා අධිකාරි.

1970 ජූලි මස 14 වැනි දින,
මාතර, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

## උපලේඛනය

| (1) සේවය | (2) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ප්‍රදේශය | (3) ඇප මුදල රුපියල් | (4) සාමාන්‍යයෙන් මසකට ප්‍රවාහනය කල යුතු කිරි පයින්ට් ප්‍රමාණය | (5) ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1. මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සිට මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශයේ කිරි මධ්‍යස්ථානවලට අළුත් එළකිරි ප්‍රවාහණය කිරීම | මාතර ... | 200 ... | 3,000 | 1970 අගෝස්තු මස 25 දින උදේ 10 ට |
| 2. වැලිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සිට වැලිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශයේ කිරි මධ්‍යස්ථාන වලට අළුත් එළකිරි ප්‍රවාහණය කිරීම | වැලිගම ... | 200 ... | 2,000 | |

7-1081—70.7.31 වැනි දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

යොමුව. පී.එස්සී. 2/23/70

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පෙනබාර්බිටෝන් බී. පී. යනාදිය සැපයීම සඳහා ටෙන්ඩර්පත්

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පෙනබාර්බිටෝන් බී. පී. යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,895 දරණ 1970 පෙබරවාරි මස 27 වැනි දිනැති ''රජයේ ගැසට් පත්‍රයේ'' පළකොට ඇති නාමාවලියෙහි සඳහා මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදි ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර්පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ඔක්තෝබර් 20 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත්කරනු ලබන්නේ—

(i) මා විසින් හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡේදයේ iv වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවෙනුවට.

කොළඹ, 1970 ජූලි 21.

## අදල උපලේඛනය

## SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Phenobarbitone B.P. 1 gr. (60 mgm.) .. .. .. | 11,000,000 Tablets .. | In bottles of 1,000 tablet |
| 2 .. | Ephedrine Hydrochloride B.P. 1/4 gr. (15 mgm.) .. .. | 24,000,000 Tablets .. | do. |
| 3 .. | Phenytoin Sodium B.P. 1½ grains (100 mgm.) (Capsules should be dry filled) | 1,000,000 Capsules .. | In air-tight screw cappe bottles of 1,000 capsule |
| 4 .. | Benzhexol Hydrochloride B.P. 2 mgm. .. .. | 6,000,000 Tablets .. | In bottles of 1,000 tablet |
| 5 .. | Prednisolone B.P. 5 mgm. each .. .. .. | 4,000,000 Tablets .. | do. |
| 6 .. | Primidone B.P. 250 mgm. each. .. .. .. | 850,000 Tablets .. | do. |
| 7 .. | Phenylbutazone B.P. (sugar coated) 100 mgm. each .. .. | 3,500,000 Tablets .. | do. |
| 8 .. | Aluminium Hydroxide B.P. .. .. .. | 6,000,000 Tablets .. | In well closed screw capped bottles of 500 tablets |

7–1143—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මානසික රෝහල අංගොඩ, කිලිටි රෙදි ඇපිල්ලීම

සේවය හා ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.—1970 ඔක්තෝම්බර් 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවන වගන්තියේ දක්වා තිබෙන ආයතනයන්හි කිලිටි රෙදි ඇපිල්ලීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබනු ලද ටෙන්ඩර් පත්‍ර අංගොඩ මානසික රෝහල් අධිකාරි විසින් බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් තැන්පත් මුදල්.—මෙම උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් කරන ලද මුදල මා නමට කොළඹ කච්චේරියෙහි තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා මෙවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම්කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

4. වත්කමේ විස්තර.—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට දන්විය යුතුයි.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහ තැන්පත් කරන ලද මුදල් අහිමි වන්ට ඉඩ තිබේ.

5. සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.—දළ වශයෙන් මසකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මෙහි පහත සඳහන් උපලේඛනයේ 5 වන වගන්තියේ දක්වා ඇත.

6. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''මානසික රෝහල් අධිකාරි අංගොඩ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාව සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙලවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් තමාම ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් එය ලැබුණු බවට කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

7. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.—මෙහි පහත සඳහන් උපලේඛනයෙහි 6 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

8. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකු ගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

9. ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පලමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉක්මවනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේනම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

12. **අනිත් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව කොන්ත්‍රාත්කරු දැරිය යුතුයි.

(ii) **කිලිටි රෙදිවල විසබීජ නැතිකිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිලිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන ඇති අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත ටෙන්ඩර් තැන්පත් මුදල බැඳීමෙන් පසු ඉල්විය හැක.

ආර්. ජී. ජයසුන්දර,
මානසික රෝහල් අධිකාරි.

### උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ඇප තැන්පත් මුදල රු. | මසකට සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු සාමාන්‍ය කෑලි ගණන | ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| **මානසික රෝහල, අංගොඩ** | | | | | |
| 3 වෙනි අංකය :— | | | | | |
| ගැහැණු වාට්ටු අංක 21, 22, 23, 24, 25, 26, 27, 28 සහ 29 ... | 100 ... | 500 ... | 4 වරක් ... | 7,500 පමණ ... | 1970.8.21—පෙ.ව 10 ට |
| 4 වෙනි අංකය :— | | | | | |
| ක්ෂය රෝග හා අනෙකුත් බෝවෙන රෝග වාට්ටු අංක 15, 16, 17, 18, 32, 33, 34 සහ 35 ... ... | 100 ... | 300 ... | 5 වරක් ... | 3,000 පමණ ... | එම |
| මුල්ලේරියාව රෝහල—අංක 1 ... ... | 100 ... | 300 ... | 3 වරක් ... | 3,500 පමණ ... | එම |
| මුල්ලේරියාව රෝහල—අංක 2 ... ... | 100 ... | 300 ... | 4 වරක් ... | 5,500 පමණ ... | එම |

7–1119—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 අගෝස්තු මස 21 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
|---|---|
| යටිකිඳ ප්‍රා. ආ. නි. කොටසේ, තල්දෙන-අංගොඩ පාර-1 වන සැතපුම් ½ ගල්දමා තාර දැමීම හා වැඩිදියුණු කිරීම. ... | 30,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට 1970 අගෝස්තු මස 14 වැනි දින පස්වරු 3 තෙක් බදුල්ලේ කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදාළ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1970 අගෝස්තු මස 21 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස් ය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර් කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පනපොත පෙරළිවූ පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ලේ දිසාපතිගෙන් දැනගත හැකිය.

ච. දිසානායක,
උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල.
1970 අගෝස්තු මස 22 වැනි දින.

7–1151—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1970-71 මුදල් වර්ෂයේ ප්‍රථම භාගය සඳහා අනුරාධපුර කොට්ඨාශයට ප්‍රාදේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම**

අනුරාධපුර ව්‍යාපාරයේ අනුරාධපුර, කුරුණෑගල, පදවිය සහ පුත්තලම යන දිස්ත්‍රික්කවලට අයත් පහත සඳහන් කායසීංශ සඳහා ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීමට ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1970.8.29 වැනි දින දවල් 12 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

**අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කායසීංශ**—අනුරාධපුර නවනගර අංශය, මහකනදරාව අංශය, රාජාංගන දකුණු ඉවුර අංශ සහ දේවහුව අංශය.

**කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කායසීංශ**—රාජාංගන වම් ඉවුරට අයත් ගොඩනැගිලි අංශ.

**පදවිය දිස්ත්‍රික්කයට අයත් කායසීංශ**—පදවිය නවනගර අංශයට අයත් ගොඩනැගිලි අංශ.

**පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කායසීංශ**—පුත්තලම දිස්ත්‍රික්කයේ සියලුම ගොඩනැගිලි අංශ.

**ප්‍රාදේශීය උපකරණ**

(1) ඉරු දෙකේ පොල්අතු (දිග අඩි 7 ක් සහ පළල අඟල් 18 කට නොඅඩු 1,000 බැගින්)

(2) දිය ගසන ලද හුණු බුසලක් සඳහා (රා. 44 කට නොඅඩු බරක් ඇති)

(3) තම්බාපු හුණු බුසල්වලින්

(4) කළුගල් 6″×9″ කියුබ්වලින්

(5) කැටගල් කියුබ්වලින් (2″×1½″,×1″,×¾″× සහ ½″)

(6) පිළිස්සූ ගඩොල් (8¾″×4¼″×2¾″ යන ප්‍රමාණයේ 1,000 බැගින්)

(7) ගංගා වැලි කියුබ්වලින්

සැපයීම සඳහා මිළ ගණන් වෙන් වෙන්ව දැක්විය යුතුයි.

(අ) වත්තෙන්/පෝරණුවෙන්/ගල්වළෙන් (ලොරි යානැකි සැතපුම් 5 ක් දුර ස්ථානයක් විය යුතුයි.)

(ආ) කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමට ඔහුගේ වාහන වලින් ගෙනැවිත් භාරදීම (පැටවීම බෑම සහ නියමිත අයුරු ඇසිරීම ඇතුලුව)

එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් මුදලින් රු. 50 ක් මෙම කායසීලයේ තැන්පත් කිරීමෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ අනුමත කරන ලද ටෙන්ඩර් පෝර්ම මෙම කායසීලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1970.8.29 වැනි දින පෙරවරු 10.30 දක්වා පමණි.

මෙම කායසීලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝර්මවල ඉල්ලුම් කළ යුතු අතර ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1970.8.29 වැනි දින දවල් 12 ට පෙර මෙම කායසීලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ " ඉඩම් සංවර්ධන නිලධාරි, අනුරාධපුරය " යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කළ හැකිය. ටෙන්ඩර් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ.............. ව්‍යාපාරයට ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩරය යනුවෙන් සඳහන් කළ යුතුයි.

1970.8.29 වැනි දින පස්වරු 2.30 ට අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ඉඩම් සංවර්ධන කායසීලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් ඒ බව දන්වා සතියක් ඇතුලත අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි සමග පොරොන්දුවකට බැඳිය යුතු අතර, ඔහු විසින් කරනු ලබන ඇනවුම්වලට අනුව දක්වන දිනයේ සිට සතියක් ඇතුලත උපකරණ සැපයීම් කළ යුතුයි. මෙම කාලය ඇතුලත පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ ද්‍රව්‍ය සැපයීමට අපොහොසත්වන ටෙන්ඩර්කරුවන්ගේ නම් කොන්දේසි කඩකළ ටෙන්ඩර්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට සිදුවන අතර, තැන්පත් මුදල් ද රජය සතු කිරීමට ඉඩ තිබේ.

තවද, වැඩි විස්තර අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් දැන ගත හැකිය.

එන්. බී. එෆ්ජ්. භාරතී,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අනුරාධපුරය.

1970 ක්වූ ජූලි මස 23 වැනි දින,
අනුරාධපුර ඉඩම් සංවර්ධන කායසීලයේ දීය.

7–1149—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ජීඑම්/ඒසී/එල්. 72/2.

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොලොන්නාවේ, මහා මාර්ග දෙපාර්තමේන්තුවේ රජයේ කම්හන්ත ශාලාවේ තිබෙන, දළ වශයෙන් ටොන් 15 ක් පමණ ගැල්වනයිස් යකඩ සුන්බුන් මිළයට ගැනීම හා ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් පත් කොළඹ 1, පරණ මිනින්දෝරු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලෙහි ඇති මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1970 අගෝස්තු මස 26 වැනි බදාදා දින පෙරවරු 11 වනතෙක් භාර ගනු ලැබේ.

2. කොලොන්නාවේ මහා මාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු හා කර්මාන්තශාලීය සාමාන්‍යාධිකාරීතැනගෙන් ලබා ගත් ආකෘති පත් වල ටෙන්ඩර් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැක.

3. ඉහත කියන ලද ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු හා සාමාන්‍යාධිකාරිවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25 තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1970 අගෝස්තු මස 21 වැනි සිකුරාදා දින පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කිරීමේ නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 1, පරණ මිනින්දෝරු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලෙහි ඇති මහා මාර්ග දෙපාර්මේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. රාජගෝපාල්,
ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු හා
කර්මාන්තශාලීය සාමාන්‍යාධිකාරී.

1970 ජූලි මස 21 වන දින,
රජයේ කර්මාන්තශාලාව,
කොලොන්නාව.

7–1174—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

**පීක් කැප් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

නාරාහේන්පිට, සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයේ ඇති ආදර්ශ අනුව පීක් කැප් සැපයීම සඳහා ටෙන්ඩර්, කොළඹ තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 අගෝස්තු මස 17 වැනි දින පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. 1970 අගෝස්තු මස 17 වැනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන වේලාවේදී පැමිණ සිටිය හැක.

3. කොළඹ, නාරාහේන්පිට පිහිටි තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා කටයුතු පිළිබඳ සහකාර අධිකාරී කාර්යාලයෙන් නිකුත් කරන ආකෘතිපත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළයුතු ය. වැඩි විස්තර ද එම කාර්යාලයෙන් ම ලබාගත හැක. කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරණ කවුන්ටරයේ රු. 50ක මුදලක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ආකෘතිපත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1970 ජූලි මස 31 වැනි දින සිට 1970 අගෝස්තු මස 14 වැනි දින පස්වරු 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

ඇම්. පී. ද සිල්වා,
සහකාර පෝස්ට් මාස්ටර් ජනරාල් (තැපැල් සේවා).

තැපැල් අංශය,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

7–1177/1—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

1970 අගෝස්තු මස 17 වැනි දින සඳුදා පෙ. ව. 10 වන තෙක්, කොළඹ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ දී, අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් පහත සඳහන් වැඩ සඳහා අනු පිටපතක් සමග පිළියෙල කළ ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) නාවලපිටිය තැපැල් කාර්යාලයේ සහකාර නිලධාරීන් සඳහා නිල නිවාස ඉදිකිරීමට යෝජිත ඉඩම වටා කම්බි ගැසීම.

(2) ආගරපතන උප තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම වටා කම්බි ගැසීම.

(3) කොත්මලේ තැපැල් කාර්යාලීය සුළු සේවක මහතුන්ගේ නිල නිවාසවලට නඩත්තු රෙපයෙරු වැඩ කිරීම.

(4) නුවරඑළිය තැපැල් කාර්යාලයීය ගොඩනැගිල්ලේ වහලයට හා නිලධාරීන්ගේ වැසිකලියට අවශ්‍ය නඩත්තු රෙපරේරු කිරීම.

(5) කඳපොල තැපැල් කාර්යාලයේ වැසිකිළි තුනක් ජලමුද්‍රා බවට හැරවීම.

(6) මහනුවර තැපැල් කාර්යාලයීය ගොඩනැගිල්ලට වර්ණ ආලේප කර්ම හා වෙනත් නඩත්තු රෙපරේරු වැඩ කිරීම.

(7) පුස්සැල්ලාව තැපැල් කාර්යාල ගොඩනැගිල්ලට වර්ණ ආලේප කර්ම හා වෙනත් නඩත්තු වැඩ කිරීම.

(8) ගම්පොල තැපැල් කාර්යාලයීය ගොඩනැගිල්ලට වර්ණ ආලේප කර්ම හා වෙනත් නඩත්තු වැඩ කිරීම.

(9) හැටන් තැපැල් කාර්යාලයීය ගොඩනැගිල්ලට වර්ණ ආලේප කර්ම හා වෙනත් නඩත්තු රෙපරෙරු වැඩ කිරීම.

2. ඉහත සඳහන් වැඩ සඳහා රු. 10,000 කට හෝ ඉන් ඉහල ගණනකට, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ ප්‍රසිද්ධ වැඩ දෙපාරතමෙන්තුවේ හෝ වෙනත් එවැනි රජයේ දෙපාර්තමේන්තුවල හෝ ගොඩනැගිලි වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචිවී සිටින අයට හා අනුමතකළ සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර 1970 ජූලි මස 12 වැනි දින පස්වරු 2 දක්වා මහනුවර ප්‍රාදේශීය තැපැල් අධිකාරි (මධ්‍යම) කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ. ප්‍රාදේශීය තැපැල් අධිකාරි විසින් සෑහීමකට පත්වන පරිදි ඉහත විස්තර සඳහන් සුදුසුකම් අනුව තමාගේ ලියා පදිංචිය ඔප්පු කිරීමට සෑහෙන සාධක ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවනට පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් අපේක්ෂකයින් විසින්, දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකදී, එක් එක් වැඩය වෙනුවෙන් රුපියල් 25 ක් බැගින් මුදල් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි මහනුවර ප්‍රාදේශීය තැපැල් අධිකාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. අනුමත කරනලද සමිති වෙනුවෙන් ඉහත සඳහන් තැන්පත් මුදල අයකරනු නො ලැබේ.

4. ටෙන්ඩර් 1970 අගෝස්තු මස 17 දා පෙ. ව. 10 ට කොළඹ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේදී, අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට එහි පෙනී සිටීමට අවසර ඇත. අමතර විස්තර මහනුවර ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

7–1177/2—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

නාගොඩ ගම්බද උසාවියේ වහළ අළුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, ගාල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉන්ජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 අගෝස්තු මස 26 වැනි දින පෙරවරු 10.30 වන තෙක් බාර ගනු ලැබේ.

2. ගාල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු, වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 13,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 අගෝස්තු මස 14 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

6. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳව සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර් ලබා ගැනීමට අදහස් කරන අය, තම තමන් විසින් දැනට කරගෙන යනු ලබන වැඩවල තත්වය හා ප්‍රගතිය දැක්වෙන ඒ ඒ දිස්ත්‍රික් ඉන්ජිනේරුවරුන්ගෙන් ලබා ගත් ලිපියක් තමන් වෙත ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු ද වේ.

එම්. කුමාරස්වාමි,
දකුණු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි),
ගාල්ල.

ගාල්ලේ
අධිකාරි ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (ගොඩනැගිලි),
1970.7.20.

7–1150—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## 1970–71 මුදල් වර්ෂය තුළ යාපනය බන්ධනාගාර කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන්කරනු ලබන මවිසින් යාපනය බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1970–71 මුදල් වර්ෂය තුලදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් 1970 අගෝස්තු 29 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබෙ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ වියයුතු යයි තීරණය කොට ඇත :—

| සැපයුම් | | ටෙන්ඩර් තැන්පත් මුදල් | | | ඇප තැන්පත් මුදල් | |
|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | රු. | ශ. |
| (අ) මාදම්පේ වේවැල් | ... ... | 20 | 0 | ... | 250 | 0 |
| (ආ) පීරපු කොහු | ... ... | 10 | 0 | ... | 25 | 0 |
| (ඇ) ගොමපොහොර | ... ... | 10 | 0 | ... | 25 | 0 |

4. විශේෂ විස්තර—යාපනය බන්ධනාගාරයට ගෙනවිත් භාරදිය යුතුයි.

(අ) මාදම්පේ වේවැල් කුඩා සෑදීමට සහ වෙනත් වේවැල් වැඩ සඳහා සුදුසු හොඳට මෝරණ ලද අඩුම දිග අඩි 7ක් විය යුතුයි. අවශ්‍යතාවය අනුව වේවැල් සෑම තැනම අඩුම වට ප්‍රමාණය අඟල් ½ක් විය යුතුයි.

(ආ) පීරපු කොහු හොඳට වියළී තිබිය යුතු අතර දූවිල්ලෙන් තොරවිය යුතුය. තෙත්වූ හෝ වර්ණ වෙනස්වූ කොහු භාරගනු නොලැබෙ. කොහුවල දිග අඟල් 12ක් විය යුතුයි. වියලීම සඳහා සියයට 3නේ සිට බර ප්‍රමාණයක් අඩුකරනු ලැබෙ.

(ඇ) වන්නි ගොම පොහොර ගල්, වැලි, හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයන්-ගෙන් තොරව තිබිය යුතුයි. ලොකු තල්කොල කුඩා 150 කට නොඅඩු ප්‍රමාණයකින් යුත් ගොම ලොරියක් සඳහා මිළ ගණන් ඉදිරිපත්කළ යුතුය. කොපායි එළිමහන් සිර කඳවුරට ගෙනවිත් භාරදිය යුතුය.

5. ඉහත 3 වැනි ඡේදයේ දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.

6. ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත්කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම සහ ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්‍යාලයේ තැන්පත් කළ යුතුය. ආදර්ශක නොමැතිව ඉදිරිපත්කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. පහත සඳහන් ආයතනයන් සඳහා නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන,
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති,
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

8. ටෙන්ඩර් ඉදිරිපත්කළ යුත්තේ නියමිත පෝර්ම මඟින් පමණකි. ඒවා ලබාගත හැක්කේ 1970 අගෝස්තු මස 28 වැනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත්කර ලබාගත් රිසිට් පත් ඉදිරිපත්කිරීමෙන් පමණක් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්‍යාලයේදීත්, මෙම කාර්‍යාලයේදී හෝ ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බව සලකන්න.

9. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම්පස කෙළවරේ "මාදම්පේ වේවැල්/පීරපු කොහු/වන්නි ගොම පොහොර සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන්කොට ලියා පදිංචිකළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන්කරන අයගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය හැක.

10. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයෙහි අකුරෙන් හා ඉලක්කම්වලින් දැක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක්කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර් කරුවන් විසින්ම අත්සන් යොදා සැබෑ බවට සහතික කළයුතුය.

11. වර්ෂ 1970 අගෝස්තු මස 29 වැනි දින පෙරවරු 10.30ට පහත අත්සන්කරන අයගේ කාර්‍යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘතකරනු ලැබේ. එහිදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාලසීමාව තුල අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකිවූවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම් ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවක දී කොන්ත්‍රාත්කරුට සැපයිය නොහැකිවන සැපයීම් කොන්ත්‍රාත්කරුගේ වියදමින් වෙනත් මාර්ගවලින් ලබා ගැනීමේ අයිතිය යාපනය බන්ධනාගාර අධිකාරි සතුවේ.

13. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද කාර්‍යය ඉටුකිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීම හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක නතවාලීමේ සම්පූර්ණ අයිතිය යාපනය බන්ධනාගාර අධිකාරි වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබාගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින දහයක් ඇතුළතදී යාපනය බන්ධනාගාර අධිකාරී සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාවතුල කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහු ගේ නම හා ලිපිනය වගකීම් පැහැර හැරගිය කොන්ත්‍රාත්කරුගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැනගැනීමට අවැසි නම් පහත අත්සන් කරන අයගෙන් එය ලබාගත හැක.

සී. ඇෆ්. බර්තොලමියුස්,
යාපනය බන්ධනාගාර අධිකාරී.

1970 ජූලි මස 16 වැනි දින,
යාපනය බන්ධනාගාරයේ දීය.

7-1133—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### අලුත් මෝටර් වාහන සැපයීම

පහත සඳහන් මෝටර් වාහන සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා කොළඹ 1, ලෝටස් පාරේ තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ 6 වෙනි මහලේ, පාලන අංශයේ, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ගැනුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1970 අගෝස්තු මස 17 දින. පෙ.ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

| අංක | වාහනයේ විස්තර | අවශ්‍ය ගණන |
|---|---|---|
| 1 ... | දකුණෙන් පදවන සාමාන්‍ය හැසිරවීම් සහිතව ඩීසල් වලින් ක්‍රියා කරන ටොන් 3නේ බර වැඩ සඳහා සිලින්ඩර් 6න් යුක්ත වින්ඩ්ස්ක්‍රීන් එකක් සහිතව, මෙරට බොඩි ගැසීමට හැකි ලොරි චැසි (අවුරුදු 1ට අවශ්‍ය අමතර කොටස් සහිතව) | 3 |
| 2 ... | දකුණෙන් පදවන සාමාන්‍ය හැසිරවීම් සහිතව සැහැල්ලු වැඩ සඳහා සිලින්ඩර් 4න් යුත් ඩීසල් ඇන්ජිම සහිත මෙරට බොඩි ගැසීමට හැකි ලොරි චැසි (අවුරුදු 1 ට අවශ්‍ය අමතර කොටස් සහිතව) | 3 |
| 3 ... | දකුණින් පදවන පැට්‍රල්වලින් ක්‍රියා කරන සැහැල්ලු මෝටර් වාහන, ඔගීන් 4–6 දක්වා ගෙන යා හැකි ස්ටේෂන් වැගන් වර්ගය, ඔස්ටින් කේම්බ්‍රිජ් වර්ගයට හා සමාන වාහන (අවුරුදු 1ට අවශ්‍ය අමතර කොටස් සහිතව | 3 |

2. කොළඹ, ලෝටස් පාරේ තැ. වි. මූලස්ථානයේ පස්වෙනි මහලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්‍යාලයෙන් ලබාගත් පෝර්ම පිටපත් 2න් යුක්තව ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් කාර්‍යාලයේදී මෙම ටැන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමටද අවශ්‍ය විස්තර දැනගැනීමට ද පුළුවන.

3. මෙම වාහන 1971 අගෝස්තු මස 31 දිනට පෙර නියත වශයෙන්ම සපයන බවට, ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පතෙහිම සඳහන් කළ යුතුයි.

4. කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කාර්‍යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ තැපැල් කාර්‍යාලයක ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන්, රු. 200ක් තැන්පත් කොට එම කුවිතාන්සිය ප්‍රධාන විදුලි සංදේශ කාර්‍යාලය වෙත 1970 අගෝස්තු මස 13 දින දවල් 12 ට පෙර ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගැනීමට හැකි වේ.

5. වැඩ විස්තරවල සඳහන් පරිදි ඉහත සඳහන් වාහනවලට අවශ්‍ය අමතර කොටස් හා ආයුධ වෙනුවෙන් වෙන වෙනම මිළ ගණන් එහිම ඉදිරිපත් කළ යුතුය.

වී. ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැ. සහ වි. ස. මූලස්ථානය,
ලෝටස් පාර, කොටුව,
කොළඹ 1.

7-1179—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### වවුනියාව සුරාබදු ගුදමේ අරක්කු සහ වෙනත් දේ ප්‍රවාහණය සඳහා ටෙන්ඩර්—1970/71

1970 ඔක්තෝබර් 1 වන දින සිට 1971 සැප්තැම්බර් 30 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ වවුනියාව සුරාබදු ගුදම හා දුම්රිය බඩු ගබඩාව අතර අරක්කු සහ වෙනත් දේ ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් පත්‍ර උතුරු කොට්ඨාශය භාර යාපනයේ සහකාර සුරාබදු කොමසාරිස් තැන විසින් 1970 අගෝස්තු මස 24 වන දින පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මේ සඳහා රුපියල් 10ක් තැන්පත් කිරීමෙන් ලබාගත් කච්චේරි කුවිතාන්සියක්, එකී සහකාර සුරාබදු කොමසාරිස් තැන වෙත ඉදිරිපත් කළවිට ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1970 අගෝස්තු 22 වන දින දහවල් 12ට පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

3. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ද එම සහකාර සුරාබදු කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970 ජූලි මස 16 වන දින,
කොළඹ 1,
හේමාස් ගොඩනැගිල්ලේ,
සුරාබදු කොමසාරිස් කාර්යාලයේ දීය.

7-1165—70.7.17 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

### පාලම් සංවිධානය

කොළඹ 1, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රත්මලානේ, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පාලම් අංගනයේ ඇති මෙහි පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍ර සූත්‍ර හා වාහනය මිළදී ගෙන, ඉවත් කරගැනීම වෙනුවෙන් 1970ක් වූ අගෝස්තු මස 19 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| අංකය | | විස්තරය | | හැඳින්වීමේ අංකය | ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 3 | ... | ලොරිය ර. වැ. දෙ. (ටොන් 5 යි) | 260 | අයි. සී. 1057 | 1 |
| 10 | ... | බ්‍රේඩ්ෆර්ඩ් පොම්පය | ... | ර. වැ. දෙ. 87 ... | 1 |
| 11 | ... | බ්‍රේඩ්ෆර්ඩ් පොම්පය | ... | ර. වැ. දෙ. 86 ... | 1 |
| 12 | ... | ඉලෙක්ට්‍රික් ක්‍රෂර් | ... | ර. වැ. දෙ. 17 ... | 1 |
| 28 | ... | ගල් ක්‍රෂර් ... | ... | ර. වැ. දෙ. 6 ... | 1 |

2. රත්මලානේ, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ යාන්ත්‍රික අංශයේදී, ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ අවසාන දිනය දක්වා සතියේ දිනවල පෙරවරු 10 සිට දහවල් 12 දක්වා යන්ත්‍ර සූත්‍ර හා වාහනය පරීක්ෂා කළ හැකිය.

3. කොළඹ 1, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ විසින් හෝ කොළඹින් පිටත කච්චේරියකින් හෝ රු. 50 සඳහා නිකුත් කරන ලද ටෙන්ඩර් තැන්පත් කුවිතාන්සියක්, රත්මලානේ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරුතැනගේ කායර්‍යාලයට ඉදිරිපත් කොට, ලබාගත් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත්‍ර සකස් කළයුතු වේ. 1970 අගෝස්තු මස 12 වන දින ප.ව. 4 දක්වා පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ඉන්පසු, ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ, ආපසු ගෙවනු නොලබන දිනකට රු. 10ක් වූ අමතර ප්‍රමාද ගාස්තු ගෙවීමෙන් අනතුරුව පමණකි. තැපෑලෙන් එවනු ලබන ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු වේ. ටෙන්ඩර් පත් එවනු ලබන ලියුම් කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ, '' පාලම් සංවිධානයේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍රසූත්‍ර හා වාහන මිළදී ගෙන ඉවත් කරගැනීම සඳහා ටෙන්ඩර් '' යනුවෙන් සඳහන් කළ යුතුය.

4. 1970 අගෝස්තු මස 19 වන දින පෙරවරු 11.05 ට දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැකිය.

5. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් වටිනාකම සම්පූර්ණයෙන්ම ගෙවා, ප්‍රයෝජනයට ගත නොහැකි යන්ත්‍ර සූත්‍ර සහ වාහනය, ටෙන්ඩරය භාරගත් දිනයේ සිට දින දහයක් ඇතුළදී පාලම් අංශයෙ අංගනයෙන් ඉවත් කරගත යුතුය.

6. ලාංකිකයින්ට හා ලාංකික සමාගම් සහ කොම්පැනිවලට පමණක් ටෙන්ඩර් සීමාවෙන් අසාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් සහ කොන්ත්‍රාත් කොන්දේසි අනුව කායර්‍යන් නිසි ලෙස ඉටු කරනු ලබන සාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්ද අයදුම් පත් අනුව ආපසු ගෙවනු ලැබේ.

එස්. ජයවීරසිංහම්,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

1970 ජූලි මස 15 වැනි දින,
රත්මලානේ, මහමාර්ග දෙපාර්තමේන්තුවේ,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කායර්‍යාලයේ දීය.

7–1175—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් කොට්ටාව-අතුරුගිරිය පාරේ ධාවන මාර්ගය ශක්තිමත් කිරීම හා පටු කොටස් පලල් කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 අගෝස්තු මස 12 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. කොළඹ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘතිපත්වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනුපිටපතකින් ද යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි වන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලා ගැනීමට පුළුවන.

3. රුපියල් 46,000 නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 අගෝස්තු මස 7 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු නොගෙවන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, පහල චැතැම් වීදියේ පිහිටි මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එස්. පද්මනාදන්,
අධිකාරි ඉංජිනේරු, බටහිර කොට්ඨාශය,
(මහා මාර්ග).

මහාමාර්ග දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 ජූලි මස 23.

7–1134—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## පිත්තල යතුරු තහඩු සැපයීමේ ටෙන්ඩරය—පියවූ දිනය : 1970.2.10 දින

| සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන් |
|---|---|---|---|
| 1. (1) එක යතුරු තහඩුවක යතුරු වෙනත් යතුරු තහඩුවකට මාරුකළ නොහැකි යතුරු ජෝඩුවක් සහ සවිකිරීමේ උපකරණ කොටස් සහිත ලිවර් 4 රේ, අහල් 5, පිත්තල දෙර බෝල යතුරු තහඩු | 11 ... | සිද්දික් ඒජන්සි ... | ... රු. 13 තහඩුවක් |
| (2) එම අහල් 6 එම ... | — ... | එම | ... රු. 14 තහඩුවක් |
| (3) එක යතුරු තහඩුවක යතුරු වෙනත් යතුරු තහඩුවකට මාරුකළ නොහැකි, යතුරු ජෝඩුවක් සහිත දෙපැත්තටම යතුරු විවර ඇති, අල්මාරි වලට හා ලාච්චුවලට සුදුසු අහල් 2, ලිවර් 4 රේ පිත්තල යතුරු තහඩු | — ... | බී. ඩී. සෝමපාල සහ සමාගම | ... රු. 3.30 තහඩුවක් |
| (4) එම අහල් 2½ එම ... | — ... | එම | ... රු. 3.55 තහඩුවක් |
| (5) එම අහල් 3 එම ... | — ... | එම | ... රු. 3.80 තහඩුවක් |

7–1172/1—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ලෝහ ඔප ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය—පියවූ දිනය : 1970.4.7 දින

| සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන |
|---|---|---|---|
| 2. ලෝහ ඔප ද්‍රව්‍ය ''බ්‍රාසෝ'' වලට සමාන අවුන්ස 12 ටින්වලින්, (ශුද්ධ) කාඩ්බෝඩ් කාටූන්වල අසුරන ලද දුසිම් 3—4 දක්වා අඩංගු ටින් වලින් | 4 ... | (1) සී/ස. ලුවිස් බ්‍රවුන් සහ සමාගම, ටින් 2,700 සඳහා පමණි | රු. 2.75 ටින් එකක් |
| | | (2) සී/ස. රෙකිට් ඇන්ඩ් කෝල්මන් ඔෆ් සිලෝන්, ඉතිරි ටින් 27,300 සඳහා | රු. 3.42 ටින් එකක් |

7–1172/2—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## වානේ සේප්පු සැපයීමේ ටෙන්ඩරය—පියවූ දිනය : 1970.2.10 දින

| සැපයීම හෝ සේවයේ විග්‍රහය | ලද ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන් |
|---|---|---|---|
| 3. සොරුන්ගෙන් හා ගින්නෙන් ආරක්ෂා සහිත, වානේ සේප්පු ... | 3 ... | සීමාසහිත ඇල්පා ඉන්ඩස්ට්‍රීස් ... | රු. 1,050එකක් |

සැ. ඕ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970.7.31 දින,
කොළඹ දී ය.

7–1172/3—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් ප්‍රතිඵල

| විෂයය | අවසන් කළ දිනය | ලැබුණු මිළ ගණන් සංඛ්‍යාව | සාර්ථක ටැන්ඩර් කරුවන්ගේ නම සහ ලිපිනය | ප්‍රදනය — කොළඹ වරායේ සිට ද්‍රව්‍ය ඉවත් කිරීම, ප්‍රවාහණය හා නිකුත් කිරීම | ටොන් එකකට — වැඩකරන වේලාවල් තුල රු. ශ. | ටොන් එකකට — වැඩකරන වේලාවලින් බැහැර රු. ශ. | එක් තොග යකට අඩුම අයකිරීම රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 1970/71 වර්ෂය තුල ද්‍රව්‍ය ඉවත් කිරීම, ප්‍රවාහණය හා නිකුත් කිරීම සඳහා ටෙන්ඩරය | 1970.2.25 | (7) හතයි | කොළඹ, රැජින වීදියේ සීමා සහිත කාගෝ බෝට් ඩිස්පැච් සහ සමාගම | විෂය අංක 1 : වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩල භූමියේ ඕනෑම ගුදමක හෝ අංගනයක හෝ සිට අමු ද්‍රව්‍ය රසායනිකයන් යන්ත්‍රෝපකරණ ආදිය ඉවත් කර, වාලච්චිනයට යැවීම සඳහා ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය වැගන් වලට හෝ ට්‍රක් රථ වලට ප්‍රවාහණය කර බාරදීම සඳහා, ඉවත් කර ගැනීමේ සියළු වියදම් ඇතුළුව | 4 0 ... | 6 0 ... | 47 50 |
| | | | | විෂය අංක 2 : වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩල භූමියේ ඕනෑම ගුදමක හෝ අංගනයක හෝ සිට අමු ද්‍රව්‍ය, රසායනිකයන්, යන්ත්‍රෝපකරණ ආදිය ඉවත් කර වාලච්චිනයට යැවීම සඳහා ලොරි වලට ප්‍රවාහණය කර බාර දීම සඳහා, ඉවත් කිරීමේත් සියළු වියදම් ඇතුළුව | 3 0 ... | 4 50 ... | 45 0 |
| | | | | විෂය අංක 3 : වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය විසින් හෝ රේගුව විසින් හෝ පීඩාකාරී ද්‍රව්‍ය වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය භූමියේ ඕනෑම ගුදමක හෝ අංගනයක හෝ සිට ඉවත් කර, වාලච්චිනයට යැවීම සඳහා ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වැගන් වලට හෝ ට්‍රක් රථ වලට ප්‍රවාහණය කර බාරදීම සඳහා, ඉවත් කිරීමේත් සියළු වියදම් ඇතුළුව | 8 0 ... | 12 0 ... | 75 0 |
| | | | | විෂය අංක 4 : අප විසින් ආනයනය කරනු ලබන කඩදාසි හා බෝඩ් වර්ග, වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ගුදමක හෝ අංගනයක සිට ලොරිවලට පටවා, කොළඹ නගර සීමාව ඇතුලත ඕනෑම ස්ථානයකට බාරදීම සඳහා ටොන් එකකට, හැනැප්මකට වැය වන ඉවත් කිරීමේ සියළු වියදම් | 4 50 ... | 6 50 ... | 50 0 |

| විෂයය | අවසන් කළ දිනය | ලැබුණු මිළ ගණන් සංඛ්‍යාව | සාර්ථක ටැන්ඩර් කරුගේ නම සහ ලිපිනය | ප්‍රදානය | ටොන් එකකට | | එක් තොගයකට |
|---|---|---|---|---|---|---|---|
| | | | | කොළඹ වරායේ සිට ද්‍රව්‍ය ඉවත් කිරීම, ප්‍රවාහණය හා නිකුත් කිරීම | වැඩකරන වේලාවල් තුල රු. ශ. | වැඩකරන වේලාවලින් බැහැර රු. ශ. | අඩුම අයකිරීම් රු. ශ. |
| | | | | විෂය අංක 5 : අප විසින් ආනයනය කරනු ලබන කඩදසි හා බෝඩ් වර්ග, වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ගුදමක හෝ අංගනයක සිට ලොරිවලට පටවා, කොළඹ නගර සීමාවෙන් පිටත ඕනෑම ස්ථානයකට බාරදීම සඳහා ටොන් එකකට, සැතැප්මකට වැයවන ඉවත් කිරීමේ සියළු වියදම් | 3 50 ... | 5 0 ... | 60 0 |
| | | | | විෂය අංක 6 : පාර්සල් තැපැල් හෝ ගුවන් මගින් හෝ ලැබෙන ඕනෑම ද්‍රව්‍යයක් ඉවත් කර, කොළඹ නගර සීමාව ඇතුලත ඕනෑම තැනකට බාරදීම සඳහා වැය වන ඉවත් කිරීමේ සියළු වියදම් | 20 0 ... | 30 0 ... | — |
| 1970/71 වර්ෂය තුල ද්‍රව්‍ය ඉවත් කිරීම, ප්‍රවාහණය හා නිකුත් කිරීම සඳහා ටෙන්ඩරය | 1970.2.25 ... | හතයි (7) ... | කොළඹ, රජින වීදියේ සීමා සහිත කාගෝ බෝට් ඩිස්පැච් සහ සමාගම | ත්‍රිකුණාමල වරායේ සිට ද්‍රව්‍ය ඉවත් කිරීම, ප්‍රවාහණය හා නිකුත් කිරීම— | | | |
| | | | | විෂය අංක 1 : ත්‍රිකුණාමල වරාය භූමියේ ඕනෑම ගුදමකින් හෝ අංගනයකින් අමු ද්‍රව්‍ය රසායනිකයන්, යන්ත්‍රෝපකරණ ඉවත්කර වාලච්චිනයට යැවීම සඳහා ලං. දු. දෙ. වැගන් රථවලට හෝ ට්‍රක් රථවලට, ප්‍රවාහණය කර බාරදී අඩුක් කිරීමට වැය වන සියළු වියදම් | 5 0 ... | 7 0 ... | 35 0 |
| | | | | විෂය අංක 2 : ත්‍රිකුණාමල වරාය භූමියේ පිහිටි ඕනෑම ගුදමකින් හෝ අංගනයකින් බඩු ඉවත්කර වාලච්චිනයට යැවීම සඳහා ත්‍රිකුණාමල වරායේ ඇතුළත දී ලං. දු. දෙ. වැගන් වලට හෝ ට්‍රක්වලට ප්‍රවාහණය කිරීමේත් සියළු ගාස්තු | 6 0 ... | 8 90 ... | 45 0 |
| | | | | විෂය අංක 3 : වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය විසින් හෝ රේගුව විසින් හෝ පීඩාකාරී ද්‍රව්‍ය වශයෙන් වර්ග කරනු ලබන ද්‍රව්‍ය ත්‍රිකුණාමල වරාය භූමියේ ඕනෑම ගුදමක හෝ අංගනයකින් ඉවත් කර, වාලච්චිනයට යැවීම සඳහා ලං. දු. දෙ. වැගන් රථවලට හෝ ට්‍රක් රථවලට ප්‍රවාහණය කර භාරදී අට්ටි ගසා දීම සඳහා ඉවත් කිරීමේ ගාස්තු ඇතුළුව | 9 0 ... | 12 0 ... | 75 0 |

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2, 1970 ජූලි 13 දින.

7-1092—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උපලේඛනයේ දක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙ.ව. 9.30ට සිදු කරනු ලැබේ :—

2. උපලේඛනයේ සඳහන් ස්ථානයන්හිදී මෙම එන්ජින් පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත දක්වෙන පරිදි මුදලින්ම කළ යුතුය:—

(අ) ඇන්ජිමේ විකුණුම් මිළෙන් 1/4ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකුණුම් මිලෙන් ඉතිරි 3/4 කොටස දින 3ක් ඇතුළත දී ;

(ඇ) කෙසේ වුවද, යම් ඇන්ජිමක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලන්සුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලන්සුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ දින 14ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී ඇන්ජිමේ විකුණුම් මිළෙන් 1/4ක තැන්පත් මුදලක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය. එම ලන්සුව පිළිගනු ලැබුවහොත් විකුණුම් මිලෙන් ඉතිරි 3/4 මුදල අවසාන පිළිගැනීමේ දන්වීම එවා දින 3ක් ඇතුළත ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමි වීමයි. ලන්සුව ප්‍රතික්ෂෙප කරනු ලැබුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. වෙන්දේසියේ විකුණුන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමියෙහි ම තිබෙන්නට හරිනු ලැබේ.

## උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | එන්ජින් තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| — | ඇලිසා ග්‍රෙග් (178–සී.එජ්. 10842) | පුගතදස යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 18. 9.70 |
| ටී 224 | යන්මාර් | පානදුර ධීවර කාර්යාලය | |
| එස්අයිසී 125 | ටෝර්පිඩෝ | එම | |
| එස්අයිසී 105 | සයිලන්සරය සහ මැනිපෝල්ඩ් | එම | 14. 9.70 |
| ජේබී 26 | කුබොටා | එම | |
| එස් 247 | පර්කින්ස් | බලපිටිය ධීවර කාර්යාලය | 18. 9.70 |
| ටී 377 | කෙල්වින් | ධීවර කාර්යාලය, අම්බලන්ගොඩ | 19. 9.70 |
| එස් 199 | අ.බ. 22 ලිස්ටර් | වැලිගම ධීවර කාර්යාලය | |
| ටී 388 | අ.බ. 22 ලිස්ටර් | එම | |
| එස් 179 | නෝර්ත්පවර් ඇන්ජිමේ කොටස් | එම | 17. 9.70 |
| ටී 312 | පෙටා | එම | |
| එස් 14 | යන්මාර් | එම | |
| එස්අයිසී 92 | ටෝර්පිඩෝ | දික්වැල්ල ධීවර කාර්යාලය | |
| එස් 173 | ලිස්ටර් | එම | 18. 9.70 |
| එස් 142 | අ.බ. 20 කෙල්වින් | තංගල්ල ධීවර කාර්යාලය | |
| ටී 295 | අ.බ. 16 යන්මාර් | එම | 19. 9.70 |
| ජේපීඑජ් 40 | ඩියුට්ස් | හම්බන්තොට ධීවර කාර්යාලය | 14. 9.70 |
| ටී 106 | අ.බ. 11 බුක් | මීගමුව ප්‍රාදේශීය ධීවර කාර්යාලය | |
| ටී 88 | අ.බ. 9 ඩියුට්ස් | එම | |
| ටී 18 | අ.බ. 8 යන්මාර් | එම | |
| ටී 73 | ඇලිසා ග්‍රේග් | එම | 8.10.70 |
| එස්අයිසී 75 | ටෝර්පිඩෝ | එම | |
| ටී 16 | යන්මාර් | එම | |
| එස් 18 | පාර්සන්ස් | එම | |
| ටී 80 | බුක් | ධීවර කාර්යාලය, කටුනේරිය | |
| එජ් 21 | බුක් | එම | 10.10.70 |
| ජේපීඑජ් 48 | අ.බ. 17 කුබෝටා | එම | |
| ටී 324 | අ.බ. 16 පෙටා | හලාවත ධීවර කාර්යාලය | |
| ටී 328 | අ.බ. 16 පෙටා | එම | 11.10.70 |
| එස් 1 | කෙල්වින් | කල්පිටිය ධීවර කාර්යාලය | |
| එස් 24 | අ.බ. 12 3/4 ලිස්ටර් | එම | |
| ඩබ්එජ් 2 | අ.බ. 22 ඩයියා | එම | 3.10.70 |
| ජේබී 77 | රුසියන් | එම | |
| එම්සී 48 | කෙල්වින් | පොයින්ට් පේද්‍රු ධීවර කාර්යාලය | |
| ජේබී 63 | බුක් | එම | 23.10.70 |
| එන්එල් 51 | බුක් | එම | |
| වීඅයිසීඑස් 30 | ඇලිසා ග්‍රේග් | කන්කසන්තුරේ ධීවර කාර්යාලය | 24.10.70 |
| එස්අයිසී 64 | ටෝර්පිඩෝ | කයිට්ස් ධීවර කාර්යාලය | |
| එස් 381 | එම | එම | 26.10.70 |
| එස්අයිසී 126 | ටෝර්පිඩෝ | කලයාඩි ධීවර කාර්යාලය | |
| එස් 382 | බුක් 2 සිලින්ඩර් | එම | 28.10.70 |
| එස්අයිපි 127 | ටෝර්පිඩෝ | මුලතිව් ධීවර කාර්යාලය | |
| එස්අයිසී 102 | ටෝර්පිඩෝ | එම | 15.10.70 |
| එස්අයිසී 124 | ටෝර්පිඩෝ | පෙසාලෙයි ධීවර කාර්යාලය | |
| එස්අයිසී 76 | එම | එම | 17.10.70 |
| එස්අයිසී 85 | ටෝර්පිඩෝ | තොණ්ඩවෙලි ධීවර කාර්යාලය | |
| එස්අයිසී 121 | එම | එම | 18.10.70 |
| ජේබී 83 | රුසියන් | එම | |

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| එම්සී 136 | බුක් | ත්‍රිකුණා ෆලය ධීවර කාර්යාලය | |
| ඩබ 11 | යන්මාර් | එම | |
| එස් 276 | බුක් | එම | |
| ඩබ 4 | බුක් | එම | 2.10.70 |
| එස්අයිසී 137 | ටෝර්පිඩෝ | එම | |
| ජීජීපී 22 | අ.බ. 31 බුක් | එම | |
| ජේපීඑජ් 53 | ඇලිසා ග්‍රේග් | වෙන්කලාඩි ධීවර කාර්යාලය | 3.10.70 |
| ටී 48 | අ.බ. යන්මාර් | මඩකලපුව ධීවර කාර්යාලය | 4.10.70 |

1970.7. 23 වැනි දින,
කොළඹ ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

වික්‍රමසිංහ පතිරණ,
ධීවර අධ්‍යක්ෂ.

7-1167—70.7.31 දින අංක 14,917 දරණ ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### ඇන්ජින් සහිතවූ/රහිතවූ/පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා වෙන්දේසියේ විකිණීම

ඇන්ජින් සහිත වූ/රහිතවූ ටොන් 3½රේ පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දිනයන්හිදී සහ ස්ථානයන්හිදී පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. උපලේඛනයෙහි සඳහන් ස්ථානයන්හිදී මෙම යාත්‍රා පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින් ම කළ යුතුය :—

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් ¼ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3ක් ඇතුළත දී :

(ඇ) කෙසේ වුවද යම් යාත්‍රාවක්/ඇන්ජිමක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලන්සුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලන්සුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ දින 14ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී යාත්‍රාවේ/ඇන්ජිමේ විකුණුම මිළෙන් ¼ක තැන්පත් මුදලක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමිවීමයි. ලන්සුව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා මුදල් ගෙවීමෙන් පසු ඉවත් කර ගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමි භාගයෙහි තිබෙන්නට හරිනු ලැබේ.

### උප ලේඛනය

#### බෝට්ටු සහ එන්ජින්

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දින |
|---|---|---|---|
| ජේපීඑජ් 11 | — | හැරිසන් ලිස්ටර් යාත්‍රාංගනය, කොම්පඤ්ඤවීදිය | |
| එම්බී 5 | — | එම | 70. 9. 9 |
| එස් 175 | ඇලිසෝ ග්‍රේග් | එම | |
| එස්අයිසී 105 | අ. බ. 24 ටෝර්පිඩෝ | මෝදරවැල්ල | 70. 9.10 |
| එස් 118 | — | එම්. ජේ. ඩයස් යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 70. 9.11 |
| එස්අයිසී 42 | ටෝර්පිඩෝ | ලංකා ධීවර සංස්ථාවේ යාත්‍රා දියත් කරන ස්ථානය, මට්ටක්කුලිය | 70. 9.12 |
| ටී 224 | — | ගල්කිස්ස වෙරල | 70. 9.13 |
| එස්අයිසී 105 | (ඒරාව පළුණයි) | ධීවර කාර්‍යාලය, පානදුර | 70. 9.14 |
| එල් 2 | — | කටුකුරුන්ද යාත්‍රා සාංන්නන්ගේ සමුපකාර සමිතියේ යාත්‍රාංගනය, උතුරු කළුතර | 70. 9.16 |
| ටී 289 | — | එම | |
| ටී 175 | යන්මාර් | කටුකුරුන්ද යාත්‍රා සාදන්නන්ගේ සමුපකාර සමිතියේ යාත්‍රාංගනය උතුරු කළුතර | 70. 9.16 |
| කේ.බී.බී. 1 | — | එම | එම |
| වීජේ 6 | — | එම | එම |
| ඇම්ජේඩී 12 | අ.බ. 22 ලිස්ටර් | එම | එම |
| එම්බී 109 | — | මරදන, බේරුවල | 70. 9.17 |
| ජේපීඑජ්. 21 | — | එම | එම |
| ටී 237 | යන්මාර් | එම | එම |
| ටී 386 | — | එම | 70. 9.17 |
| එස් 164 | — | එම | එම |
| එල් 7 | — | නවලංකා යාත්‍රාංගනය, බේරුවල | එම |
| එස් 234 | යාත්‍රාවේ ඇන්ජින් කොටසක් ඇත | බලපිටිය වෙරල | 70. 8.19 |
| එන්සී 24 | — | එම | එම |
| එස්අයිසී 90 | ටෝර්පිඩෝ | එම | එම |
| ටී 369 | — | එම | එම |
| එස්අයිසී 178 | — | එම | එම |
| ජේබී 10 | — | බලපිටියේ ධීවර කාර්‍යාලය අසල | එම |
| ටී 377 | — | අම්බලන්ගොඩ වෙරල | 70. 9.19 |
| ටී 153 | බුක් | හික්කඩුව වෙරළ | 70. 9.20 |
| එස් 199 | — | මාගාල්ල වෙරල | 70. 9. 9 |
| එස්අයිසී 1 | — | ගන්දර වෙරල | 70. 9.10 |
| එස් 93 | අ.බ. 10 කුබොටා | මිරිස්ස වෙරල | 70. 9.11 |
| එස් 108 | යන්මාර් | එම | එම |

| යාත්‍රා අංකය | ඇන්ජිමේ | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| එස් 4 | (කඳේ කොටස් කිහිපයක්) | ධීවර කාර්යාලය, වැලිගම | 70. 9.12 |
| ටී 343 | (හැච් කවර් සහ මාළු ලෑලි 2) | එම | එම |
| එස් 27 | (හැච් කවර් සහ ඊරාව) | එම | 70. 9.12 |
| එස් 86 | එම | එම | එම |
| එස් 113 | (හැච් කවර් 2ක් සහ ඊරාව) | එම | එම |
| ටී 295 | — | තංගල්ල වෙරළ | 70. 9.13 |
| එස්අයිසී 15 | — | එම | එම |
| එන් එල් 2 | — | එම | එම |
| එස්අයිසී 217 | — | හම්බන්තොට වෙරළ | 70. 9.14 |
| එස් 32 | පාර්සන්ස් | කුච්චිදූව | 70. 9.23 |
| ටී 18 | අ.බ. 8 යන්මාර් | එම | එම |
| එම්සී 7 | පාර්සන්ස් (බ්ලොක් එක පමණයි) | එම | එම |
| එස් 18 | — | එම | එම |
| එස් 20 | — | ජේපීඑෆ්ජ් යාත්‍රාංගනය, මීගමුව | 70. 9.24 |
| ටී 44 | — | කලාදුව, මීගමුව | 70. 9.25 |
| ටී 37 | අ.බ. 11 පාර්සන්ස් | මීගමු වෙරළ | 70. 9.26 |
| ටී 37 | — | අළුත් කුරුව | එම |
| ටී 51 | — | මීගමුව | එම |
| ටී 71 | — | එම | එම |
| ටී 103 | — | එම | එම |
| එස් 78 | — | එම | එම |
| ටී 73 | — | පිටිපන වීදිය, මීගමුව | 70. 9.27 |
| ටී 159 | — | සෙන්තප්පාඩුව, මීගමුව | 70. 9.28 |
| එස්අයිසී 75 | — | තලගහපාර, මීගමුව | 70. 9.30 |
| එස්අයිසී 103 | ටෝර්පිඩෝ | නාඩුපාඩු වෙරළ, හලාවත | 70.10. 1 |
| ටී 473 | — | හලාවත පාලම අසල | 70.10. 2 |
| ටී 52 | ඇන්ජිමේ කොටසක් බෝට්ටුවේ ඇත | කල්පිටිය | 70.10. 3 |
| එන්එල් 51 | — | පවර් ක්‍රාෆ්ට් යාත්‍රාංගනය යාපනය | 70. 9.16 |
| එස්අයිසී 84 | අ.බ. 24 ටෝර්පිඩෝ | එම | එම |
| එම්සී 83 | — | එම | එම |
| ටී 136 | අ.බ. 10 බුක් | එම | එම |
| ඩීසී 4 | — | වැල්වැටිතුරෙයි වෙරළ (කට්ටියාර්) | 70. 9.17 |
| එස් 335 | පර්කින්ස් | මයිලඩ්ඩි වෙරළ | 70. 9.18 |
| එම්සී 30 | — | වෙලානෙයි | 70. 9.19 |
| එම්සී 84 | — | කරිකෝප්පු | 70. 9.20 |
| ටීඑස් 51 | — | එම | 70. 9.20 |
| ටීඑස් 59 | — | කයිට්ස් | 70. 9.24 |
| ජේබී 63 | — | කරෙයියූර් ධීවර වරාය | 70. 9.23 |
| එස්අයිසී 67 | — | ඉම්පැරිඩ්ඩි, යාපනය | 70. 9.26 |
| එස්අයිසී 8 | — | සලපිත්ආරු, ත්‍රිකුණාමලය | 70.10. 1 |
| එම්සී 136 | — | අභ්‍යන්ත වරාය, ත්‍රිකුණාමලය | 70.10. 2 |
| එම්සී 117 | — | එම | එම |
| ඩබලිව් 4 | — | එම | එම |
| එස්අයිසී 137 | — | එම | එම |
| එස් 276 | — | එම | එම |
| ආර්එස් 9 | අ.බ. 30 පර්කින්ස් (බ්ලොක් එක පමණයි) | එම | එම |
| ටී 235 | — | සිලෝන් ෂිප් යාත්‍රාංගනය, චයිනාබේ | 70.10. 3 |
| එස් 71 | ලිස්ටර් | රා. ලං නා. හමුද භූමිභාගය, ත්‍රිකුණාමලය | 70.10. 4 |
| විජේ 17 | බුක් | මන්නාරම් පාලම අසල | 70.10. 5 |
| ටීඑස් 61 | — | සවුත්බාර් මන්නාරම | 70.10. 6 |
| ටීඑස් 21 | — | නාඩුකුඩාවෙරල | 70.10. 8 |
| එස්අයිසී 121 | — | ඉරුක්කුලම්පිඩි | 70.10. 9 |
| එස්අයිසී 85 | — | එම | එම |
| ජේබී 84 | — | වන්කාලෙයි | 70.10.10 |
| එස්අයිසී 76 | — | තලෙයිමන්නාරම | 70.10.11 |
| එස්අයිසී 124 | — | එම | එම |
| එස් 326 | — | එම | එම |
| එස් 117 | — | සෙල්වම් යාත්‍රාංගනය, මුලතිව් | 70.10.13 |
| එස් 92 | අ.බ. 8 යන්මාර් | ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය, අම්පාර | 70.10. 8 |
| ඩබ 5 | — | උප්පොඩෙයි | 70.10. 9 |

1970.7.23 දින,
කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

වික්‍රමසිංහ පතිරණ,
ධීවර අධ්‍යක්ෂ.

7–1168––70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## වෙන්දේසියේ විකිණීමක්

කාලයක් පාවිච්චි කරන ලද පහත සඳහන් භාණ්ඩයන් 1970 අගෝස්තු මස 7 වන දින පෙරවරු 10.30 කොළඹ 3 සර් අර්නස්ට් ද සිල්වා මාවතෙහි කායශීල භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. කායශීලයීය වේලාව තුල දී මෙම භාණ්ඩයන් පරීක්ෂා කර බැලිය හැක :—

යතුරු ලියන

ඔලිම්පියා සිංහල 2

ඉම්පීරියල් ඉංග්‍රීසි 2

රෙමින්ටන් දෙමළ 3

බයිසිකල්

චීන වර්ගයේ බයිසිකල් 1

ව. ආ. ජයවර්ධන,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්.

1970 ජූලි මස 17 දින දී
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3.

7–1134—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## පරණ බඩු බාහිරාදිය විකිණීම

1970 අගෝස්තු මස 14 වන දින උදේ 9 ට උතුරු මැද පළාතේ පොලිස් අධිකාරි තැනගේ බඩු ගබඩාවේදී ප්‍රසිද්ධියේ විකුණනු ලැබේ. මෙම බඩු වෙන්දේසියෙන් ගත් විගසම මුදල් ගෙවිය යුතු මෙන්ම මෙම බඩු මුට්ටු ගෙන යා යුතුය :—

1. විදුලි පංකා ... ... 2 යි
2. විදුලි උදුන් (කෑම පිසින) ... 6 යි
3. උස් පුටු ... ... 1 යි
4. බයිසිකල් හුලං පොම්ප ... 3 යි
5. යකඩ ඉස්තිරික්ක ... 1 යි
6. වොලිබෝල් කවර ... 13 යි
7. වොලිබෝල් දැල් ... 10 යි
8. කාකි බට කබා ... ... 21 යි
9. ගැලුම් 4 ටින් ... ... 45 යි
10. විදුලි පන්දම් ... ... 10 යි
11. මේස ලාම්පු ... ... 1 යි
12. බාල්දි ... ... 14 යි
13. ඇඳුම් පලස් ... ... 20 යි
14. ඇඳුම් පෙට්ටි ... ... 10 යි
15. වෙලන පටි ජෝඩු ... 24 යි
16. භූමිතෙල් උදුන් ... 12 යි
17. ගුඩිරි ... ... 55 යි
18. මදුරු දැල් ... ... 53 යි
19. උදලු ... ... 7 යි
20. වැහි කබා පටි ... ... 1 යි
21. රබර් බෝල ... ... 1 යි
22. කලු වැහි කබා ... ... 8 යි
23. රබර් වැහි කබා ... ... 8 යි
24. රේක්ක ... ... 2 යි
25. ලී රාක්ක ... ... 9 යි
26. කැරන් බෝඩ ... ... 3 යි
27. පාපැදි ... ... 4 යි
28. සාමාන්‍ය පුටු ... ... 16 යි
29. කැන්වස් සපත්තු ජෝඩු ... 5 යි
30. හිස් පිජ්ප ... ... 3 යි
31. ඇඳුම් බුරුසු ... ... 14 යි
32. බැටන් පොලු ... ... 6 යි
33. කැලැ කබා ... ... 8 යි
34. පො. රි. තොප්පි ... 4 යි
35. බූට් සපත්තු ජෝඩු ... 40 යි
36. හම් පටි පො.කො. ... 15 යි
37. උණ්ඩ උර ... ... 15 යි
38. සාමාන්‍ය තොප්පි ... 2 යි
39. පාපැදි කවරය ... ... 1 යි
40. ලන්තෑරුම් ... ... 6 යි
41. පාපැදි බඩු ඇදීමේ උපකරණ ... 1 යි
42. ඇල තොප්පි ... ... 75 යි
43. කාකි කලිසම් ... ... 32 යි
44. හම් සපත්තු ජෝඩු ... 155 යි
45. මේස් කුට්ටම් ... ... 16 යි
46. උ.පො.ප. සපත්තු ජෝඩු ... 1 යි
47. උ.පො.ප. තොප්පි ... 1 යි
48. බූට් සපත්තු ජෝඩු ... 6 යි
49. කාකි දිග කලිසම් ... 1 යි
50. හම් සපත්තු ... ... 6 යි
51. මේස් කුට්ටම් ... ... 8 යි
52. කාකි බට කබා ... ... 2 යි
53. කාකි කොට කලිසම් ... 1 යි
54. කැලැ කබා ... ... 7 යි
55. කැරම් බෝඩ ... ... 1 යි

ල. ග. ඩො. ල. ශ්‍රී. හේරත්,
පොලිස් අධිකාරි, උතුරු මැද පළාත.

1970 ජූලි මස 20 වැනි දින,
අනුරාධපුරය.

7–1124—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

හිස් ඇසුරුම් පෙට්ටි, හිස් පිප්ප, හිස් ටින් යනාදිය විකිණීම පිණිස, ප්‍රසිද්ධ වෙන්දේසියක් 1970 අගෝස්තු මස 7 වැනි සිකුරාදා පස්වරු 1 ට මරදාන් දුම්රිය ගබඩාවේදී පැවැත් වේ. විකුණූ දින සිට දින 3 ක් ඇතුළත ඉවත් කරනු නොලැබූ සෑම කොටසකටම දිනකට ශත පණහක කුලියක් අයකරනු ලැබේ.

ඇම්. සරීන්,
දුම්රිය ගබඩා අධිකාරී.

1970 ජූලි මස 20 වැනි දින,
කොළඹ,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දීය.

7–1121—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

**පාවිච්චි කරන ලද පිටත සවිකරන සමුද්‍ර මෝටර් වෙන්දේසියේ විකිණීම**

1. පාවිච්චි කරන ලද පිටත සවිකරන සමුද්‍ර මෝටර් වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උපලේඛනයේ දක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙරවරු 9.30 ට සිදු කරනු ලැබේ.

2. උප ලේඛනයේ සඳහන් ස්ථානවලදී පිටත සවිකරන මෝටර් පරීක්ෂාකර බැලිය හැකිය.

3. ජයග්‍රාහී ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ මුදල එකවරම ගෙවා පිටත සවිකරන මෝටර් එකවරම ඉවත් කරගෙන යා යුතුයි.

### උපලේඛනය

| පිටත සවිකරන මෝටරයේ වර්ගය | | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| මර්කං අ.බ. 6 | ... | ධීවර කාර්යාලය, හලාවත ... | 1970.8.19 |
| ජොන්සන් අ.බ. 5 1/2 | ... | ප්‍රාදේශීය ධීවර කාර්යාලය, මීගමුව | 1970.8.17 |
| මර්කරි අ.බ. 6 | ... | එම | 1970.8.17 |
| බ්‍රිටිෂ් අන්සානි අ.බ. 6.5 | ... | එම | 1970.8.17 |

ධීවර අධ්‍යක්ෂ.

1970 ජූලි මස 20 වෙනි දින,
කොළඹ 3,
ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

7–1115—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## 1970–71 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් නැවත විකිණීම

1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි පහත සඳහන් රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැණීම සඳහා 1970 ජූනි මස 25 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි මා විසින් පලකරන ලද නුවරඑළිය දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් විකිණීමේ දන්වීමෙහි සඳහන් නීති රීති වලට හා කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පත් 1970 අගෝස්තු මස 25 වන දින පහත උප ලේඛනයේ එක් එක් තැබෑරුමට ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ.

1970 ජූලි මස 14 වන දින,
නුවරඑළිය දිසාපති කාර්යාලයේදීය.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ අනුමත රා තැබෑරුම්—1970–71

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටුවිය යුතු ග්‍රාමය | විවෘත කරන වේලාව | වසන වේලාව | ටෙන්ඩර්පත් විවෘත කරන වේලාව |
|---|---|---|---|---|---|
| 2. | කොත්මලේ | ... ඕතලාව ග්‍රාමය තුළ | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... පෙ.ව. 10.00 |
| 3. | කොත්මලේ | ... කටුකිතුල ග්‍රාමය තුළ | ... පෙ.ව. 8.30 | ... ප.ව. 7.30 | ... පෙ.ව. 10.30 |
| 4. | වලපනේ | ... හරස්බැද්ද ග්‍රාමය තුළ | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... පෙ.ව. 11.00 |
| 5. | උඩහේවාහැට | ... පදියපැලැල්ල ග්‍රාමය තුළ | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.00 | ... පෙ.ව. 11.30 |

7—1139—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## 1970–71 වර්ෂයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

**කාලසීමාව : 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා**

අරක්කු තැබෑරුම් විකිණීම සම්බන්ධව 1970 අප්‍රේල් මස 17 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ පොදු කොන්දේසිවලට හා දනට බලපවත්නා සුරා බදු බලපත්‍ර පිළිබඳ පොදු කොන්දේසිවලට යටත්ව, පහත උප ලේඛනයේ දක්වා ඇති අරක්කු තැබෑරුම්වල 1970 ඔක්තෝබර් මස 1 වන දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා වූ කාලය තුල අරක්කු විකිණීමේ සම්පූර්ණ අයිතිය පැවරීම සඳහා ටෙන්ඩර් පත් මවිසින් බාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම නියමිත ආකෘතිපත්‍රයේ එවිය යුතු අතර ටෙන්ඩර් තැන්පත් මුදල වූ රු. 2,000 ක කච්චේරියක තැන්පත් කර ලබා ගත් රිසිට් පතක් හා 1970 අප්‍රේල් මස 17 වන් දින ගැසට්පත්‍රයේ පළ වූ පොදු කොන්දේසිවල 4 (3) කොන්දේසිය යටතේ දක්වා ඇති වත්කම සහතිකයද ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් පත් දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබා ගත හැක.

3. ටෙන්ඩර් අඩංගු සීල් තබන ලද කවරයෙහි මුදුනේ වම් කෙළවරේ ටෙන්ඩර් කළ තබෑරුමේ නමත් එහි අංකයත් පැහැදිලිව ලියා කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. නැතහොත්, ටෙන්ඩර් බාර ගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ දිසාපති, නුවරඑළිය යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත් බාර ගැනීම 1970 අගෝස්තු මස 17 වන දින පහත උප ලේඛනයේ එක් එක් තැබෑරුමට ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ සියලුම ටෙන්ඩර්කරුවන් එම වේලාවට නුවරඑළිය කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. අරක්කු විකිණීමේ සම්පූර්ණ අයිතිය ලද්ද බවට තේරී පත්ශයට පත් කළ පසුව ටෙන්ඩර්කරු විසින් එදින පස්වරු 4 ට පෙර අරක්කු විකිණීමේ කොන්දේසි පත් අත්සන් කළ යුතු අතර දෙමසක බදු මුදලකට නොඅඩු මුදලක් තැන්පත් ඇප වශයෙන් නුවරඑළිය සාපතිට ගෙවිය යුතුය.

6. කිසියම් කාරණයක් සඳහන් නොකර ටෙන්ඩර් පත් එකක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති සතු වේ.

7. වැඩි විස්තර නුවරඑළිය දිසාපති කාර්යාලයෙන් ඉල්ලා සිටිය විට ලබා ගත හැක,

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති,

1970 ජූලි මස 8 වන දින,
නුවරඑළියේ දිසාපති කාර්යාලයේදීය,

### උපලේඛනය

**අනුමත කරන ලද අරක්කු තැබෑරුම්—නුවරඑළිය දිස්ත්‍රික්කය 1970–71**

| තැබෑරම් අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිට විය යුතු ප්‍රදේශය | තැබෑරුම විවෘතකරන වේලාව පෙ.ව. | තැබෑරුම වසන වේලාව ප.ව. | ටෙන්ඩර් වසන වේලාව පෙ.ව. |
|---|---|---|---|---|---|
| 1. | කොත්මලේ ... | ... රම්බඩ නගරය තුළ ... ... | ... 8.00 | ... 6.30 | ... 9.30 |
| 2. | උඩහේවාහැට ... | ... පදියපැලැල්ල නගරය තුළ ... | ... 8.00 | ... 7.00 | ... 10.00 |
| 3. | නුවරඑළිය ... | ... හෝල්බෲක් නගරය තුළ ... ... | ... 8.00 | ... 6.30 | ... 10.30 |
| 4. | නුවරඑළිය නාගරික සභාවේ බඹරකැලේ | නුවරඑළිය නාගරික සභාවේ කොට්ඨාශ අංක 1, බඹරකැලේ | ... 8.00 | ... 7.30 | ... 11.00 |
| 5. | වලපනේ ... | ... රාගල නගරය තුළ ... ... | ... 8.00 | ... 7.30 | ... 11.30 |

සංලක්ෂ්‍යය : 1970–71 කාල පරිච්ඡේදය සඳහා දනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානයන්ම ලබා ගත හැකි වේ යයි පොරොන්දු නොවන අතර තැබෑරුම් පිහිටුවන ස්ථානයන් සඳහා නුවරඑළිය දිසාපතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

1970 ජූලි මස 8 වන දින,
නුවරඑළියේ දිසාපති කාර්යාලයේදීය.

7–1032—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## 1970–71 වර්ෂයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

**කාල සීමාව : 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා**

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලය තුළ, පහත සඳහන් පළාත් පාලන ප්‍රදේශ තුල තැබෑරුම් බල පත්‍රයක ඇතිව පිටරට බීම (ධාන්‍ය වලින් මෙරට නිපදවූ බීම වර්ගත් ඇතුළුව) සිල්ලරට විකිණීමේ සම්පූර්ණ අයිතිය පැවරීම සඳහා ටෙන්ඩර් පත්, පිටරට බීම තැබෑරුම් රේන්ද විකිණීම සම්බන්ධයෙන් 1970.5.15 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ පොදු කොන්දේසි වලට හා දැනට බලපවත්නා සියළුම සුරා බදු බලපත්‍ර පිළිබඳ පොදු කොන්දේසිවලට යටත්ව මවිසින් බාර ගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම නියමිත ආකෘති පත්‍රයේ එවිය යුතු අතර ටෙන්ඩර් තැන්පත් මුදල රු. 500 ක් කච්චේරියක තැන්පත් කර ලබා ගත් රිසිට් පතක් හා ඉහත සඳහන් පොදු කොන්දේසිවලට දක්වා ඇති වත්කම් සහතිකයද අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් පත් දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබා ගත හැක.

3. ටෙන්ඩර් අඩංගු සීල් තබන ලද කවරයෙහි මුදුනේ වම් කෙළවරේ ටෙන්ඩර් කළ තැබෑරුමේ නමත්, එහි අංකයත් පැහැදිලිව ලියා මෙම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. නැතහොත් ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ දිසාපති, නුවරඑළිය, යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

4. සියළුම තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත් 1970 අගෝස්තු මස 17 වැනි දින පහත උපලේඛනයේ එක් එක් තැබෑරුමට ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ. සියළුම ටෙන්ඩර්කරුවන් එම වේලාවට නුවරඑළිය කච්චේරියේ පෙණී සිටිය යුතුය.

5. පිටරට බීම විකිණීමේ සම්පූර්ණ අයිතිය ලද්දවූ බවට තේරී ප්‍රකාශයට පත් කළ පසු ටෙන්ඩර්කරු විසින් එදින පස්වරු 4 ට පෙර පිටරට බීම විකිණීමේ කොන්දේසි පත් අත්සන් කළ යුතු අතර දෙමසක බදු මුදලට නොඅඩු මුදලක් තැන්පත් ඇප වශයෙන් නුවරඑළිය දිසාපතිට ගෙවිය යුතුය.

6. කිසියම් කාරණයක් සඳහන් නොකර ටෙන්ඩර් පත්‍රයක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති සතුවේ.

7. වැඩි විස්තර නුවරඑළිය කච්චේරියෙන් ඉල්ලා සිටිය විට ලබා ගත හැක.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 20 වැනි දින,
නුවරඑළිය දිසාපති කාර්‍යාලයේ දී ය.

### උපලේඛනය

**නුවරඑළිය දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද පිටරට බීම තැබෑරුම්—1970–71**

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු පළාත් පාලන ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව | වසන වේලාව | ටෙන්ඩර් වසන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | නුවරඑළිය කඩවත් සතර ... | නුවරඑළිය නගර සභාවේ අංක 6 දරණ කොට්ඨාශය ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.30 ... | දහවල් 12.00 |
| 2 ... | කොත්මලේ ... | පුණ්ඩළුඔය නගරය තුළ ... | එම ... | ප.ව. 7.00 ... | දහවල් 12.30 |

සැලකිය යුතුයි.—1970–71 වර්ෂය සඳහා තැබෑරුම් දැනට පිහිටා ඇති ස්ථානයන් ම ලබා ගත හැකි වේ යයි පොරොන්දු නොවන අතර, තැබෑරුම් පිහිටුවන ස්ථානයන් සඳහා නුවරඑළිය දිසාපතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

7–1138—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

---

## 1970–71 වර්ෂයේ රා තැබෑරුම් නැවත විකිණීම—මොණරාගල දිස්ත්‍රික්කය

**කාල සීමාව : 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 දින දක්වා**

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාල සීමාව තුළ පහත සඳහන් ස්ථානයේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා 1970 මාර්තු මස 20 දින අංක 14,898 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් රා තැබෑරුම් වෙන්දේසි පිළිබඳ කොන්දේසි වලට හා දැනට බල පවත්වන සියළුම සුරාබදු කොන්දේසිවලට යටත්ව ම විසින් බාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත් නියමිත් ආකෘති පත්‍රිකාවක් විය යුතු අතර, සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 1,000 ක් බාරගත් බවට නිකුත් කරන ලද කච්චේරි කුවිතාන්සියක් අමුණා තිබිය යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රයට සම්බන්ධ තැබෑරුම් නම ද, අනුමත තැබෑරුම් ලැයිස්තුවේ දක්වා ඇති එහි අංකය ද, පැහැදිලිව ලියා කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන සේ මොණරාගල දිසාපති නමට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

4. සියළුම ටෙන්ඩර් පත් බාර ගැනීම 1970 අගෝස්තු මස 26 දින පෙ.ව. 10 ට වසනු ලැබේ. ටෙන්ඩර්කරුවන් එම වේලාවට මොණරාගල කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය, ඔහු ගැනුම්කරු වශයෙන් ප්‍රකාශිත දින ප.ව. 4 ට පෙර තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තබා දිසාපති විසින් නියම කරනු ලබන මාස දෙකකට නොඅඩු කාලයක බදු මුදල් තැන්පත් ඇප වශයෙන් දිසාපති වෙත ගෙවිය යුතුය.

6. කිසියම් කාරණයක් සඳහන් නොකර එවන ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති සතුවේ.

7. වැඩිමනත් විස්තර මොණරාගල කච්චේරියෙන් ඉල්ලා සිටි විට, ලබාගත හැක.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
මොණරාගල දිසාපති.

1970 ජූලි මස 12 වෙනි දින,
මොණරාගල, දිසාපති කාර්යාලයේ දී ය.

### අනුමත තැබෑරුම් ලැයිස්තුව—මොණරාගල දිස්ත්‍රික්කය—1970–71

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටුවිය යුතු ග්‍රාමය | තැබෑරුම් විවෘත කරන වේලාව | තැබෑරුම් වසන වේලාව |
|---|---|---|---|---|
| 1 ... | මොණරාගල ... | පල්ලෙවරාදෙල හා ගමේවෙල ඇතුළත ... | පෙ.ව. 8.00 ... | ප.ව. 6.30 |

7–1181—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## 1970-71 වර්ෂයට බදුල්ල දිස්ත්‍රික්කයේ රා රේන්ද නැවත විකිණීම

වර්ෂ 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පුහුගල අංක 2 දරණ රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1970 ජූනි මස 18 වැනි දින අංක 14,911 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීමේ අඩංගු කොන්දේසිවලට අනුව ටෙන්ඩර් පත්‍ර භාරගනුලැබේ.

යථෝක්ත තැබෑරුම සඳහා ටෙන්ඩර්පත් 1970.8.28 වැනි දින පෙරවරු 10 ට හෝ ඊට ප්‍රථමයෙන් මා වෙත ලැබිය යුතුයි.

ඩබ්. තිලකරත්න,
අතිරේක දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1970 ජූනි මස 15 වැනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේ දීය.

7–1031—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## 1970–71 වර්ෂයට අම්පාර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

වර්ෂ 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පහත දක්වෙන තැබෑරුම අරක්කු සිල්ලරට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ :—

(අ) 1970 අප්‍රේල් මස 17 වැනි දින අංක 14,902 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1970–71 වර්ෂයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි සහ;

(ආ) සෑම සුරාබදු බලපත්‍රයක් සඳහාම බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

2. පහත සඳහන් වන තැබෑරුම සඳහා රුපියල් 3,000 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඕනෑම දිසාපති කාර්‍යාලයක තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය. තවද එක් එක් ටෙන්ඩර් පත්‍රය සමග රේන්දයේ වටිනාකමින් සියයට විසිපහකට (25%) නොඅඩු වත්කමක් ඇති බව තමාගේ නිශ්චල දේපල ඉඩකඩම් පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබාගන්නා ලද වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. වත්කම් හඟවන සහතිකයට ගැණෙන දේපොල සහතික ලබා ගැනීමෙන් පසු විකිණීම හෝ වෙනත් අන්දමකින් අයිතිය වෙනස් කිරීම රේන්දයේ කොන්ත්‍රාත්තුවට දෙන ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමක් හැටියට සලකනු ලැබේ.

3. ලංකාවේ සෑම දිසාපති කාර්‍යාලයකින්ම හෝ කොළඹ සුරාබදු කාර්‍යාලයෙන් හෝ ත්‍රිකුණාමලයේ සහකාර සුරාබදු කොමසාරිස් කාර්‍යාලයෙන් හෝ මඩකලපුවේ සුරාබදු අධිකාරි තැනගේ කාර්‍යාලයෙන් හෝ ලබාගත් ආකෘති පත්‍රවල ලියන ලද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

4. 1970 අගෝස්තු මස 30 වැනි දින මෙහි පහත දක්වා ඇති පරිදි බාරගැනීම අවසන් වේලාවට ප්‍රථමයෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසන් වේලාව වන විට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම දිසාපති කාර්‍යාලයට පැමිණ සිටිය යුතුයි. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අම්පාර, දිසාපති කාර්‍යාලයෙන් ලබාගත හැකිය.

රෝ. බ්‍රැඩ්මන් වීරකෝන්,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 21 වැනි දින,
අම්පාර, දිසාපති කාර්‍යාලයේ දී ය.

සඳහන් කරන ලද ප්‍රදේශ

රේන්ද ප්‍රදේශය—අම්පාර දිස්ත්‍රික්කය

| අනුක්‍රමික අංක | කොට්ඨාශය | තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රදේශය | ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|
| 1 ... | කරවාහු පතුත්ව | ... පෙරියනීලවනෙයි ග්‍රාමය | ... පෙරවරු 10 |

7–1182—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ටෙන්ඩර් දැන්වීම නිවැරදි කිරීම

### අරක්කු රේන්ද විකිණීම—යාපනය දිස්ත්‍රික්කය, 1970-71

1970 ජූලි මස 17 දින හා අංක 14,915 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1970-71 යාපනය දිස්ත්‍රික්කයේ, අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම සඳහා ටැන්ඩර් කැඳවීමෙන් මගේ දැන්වීමේ 3 වැනි ඡේදයේ පහත සඳහන් නිවැරදි කිරීම් කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

" තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 1970 ජූලි මස 26 දින නොව 1970 සැප්තැම්බර් මස 2 වැනි බ්‍රහස්පතින්දා අවසාන වේ. "

ජේ. එම්. සබාරත්නම්,
යාපනය වැඩ බලන දිසාපති.

යාපනය දිසාපති කාර්යාලය,
1970 ජූලි මස 22 වන දින.

7–1164—70.7.31 දින අංක 14,917 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| **ජූලි** | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් 12.0 |
| **අගෝස්තු** | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. 3.30 |
| **සැප්තැම්බර්** | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. 3.30 |
| **ඔක්තෝබර්** | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. 3.30 |
| **නොවැම්බර්** | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් 12.0 |
| **දෙසැම්බර්** | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි